# සිංහල

## මූලික පිරිවෙණ

# ගුරු මාර්ගෝපදේශය

## 5 ශ්‍රේණිය

(2019 සිට ක්‍රියාත්මක වේ.)

පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් ලිපිනය : info@nie.lk

වෙබ් අඩවිය : www.pirivena.sch.lk
විද්‍යුත් ලිපිනය: pirivena@moe.gov.lk

මුද්‍රණය හා බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**සිංහල**

**මූලික පිරිවෙණ**

**ගුරු මාර්ගෝපදේශය**

**5 ශ්‍රේණිය**

ප්‍රථම මුද්‍රණය : 2019

© ජාතික අධ්‍යාපන ආයතනය

© පිරිවෙන් අධ්‍යාපන ශාඛාව අධ්‍යාපන අමාත්‍යාංශය

ISBN 978-955-25-0497-6

පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.pirivena.sch.lk
විද්‍යුත් ලිපිනය : pirivena@moe.gov.lk

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් ලිපිනය: info@nie.lk

මුද්‍රණය: එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස්
නො. 49, ජයන්ත වීරසේකර මාවත
කොළඹ 10.

# ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවිඩය

පිරිවෙන් තුළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සවිබල ගන්වමු.

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාවේ මූලිකත්වයෙන් සහ ජාතික අධ්‍යාපන ආයතනයේ තාක්ෂණික සහයෝගයෙන් මූලික පිරිවෙන් 1-5 ශ්‍රේණි සඳහා ප්‍රථම වතාවට ගුරු මාර්ගෝපදේශ සකස් කිරීම සම්බන්ධව අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් සතුටට පත් වෙමි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සඵලදායි බව උදෙසා පෙළපොත් සහ විෂය නිර්දේශ මෙන් ම ගුරු මාර්ගෝපදේශවලින් ද සැලසෙනුයේ ඉතා වැදගත් පිටුබලයකි. මෑතකාලීනව මෙරට අධ්‍යාපන පද්ධතියෙහි ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීම වෙනුවෙන් සංවර්ධනාත්මක තීන්දු තීරණ රැසක් ක්‍රියාවට නංවා ඇති අතර, පිරිවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රය සංවර්ධනයට ද එහි දී විශේෂ අවධානය යොමු කර ඇති බව සතුටින් දන්වනු කැමැත්තෙමි.

ඒ අනුව ශ්‍රී ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනය සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙන ඇති මෑතකාලීන ක්‍රියාමාර්ග අතරට එක් වන තවත් සුවිශේෂ පියවරක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමේ වැඩපිළිවෙළ හැඳින්විය හැකි අතර, මූලික පිරිවෙන් අධ්‍යාපන විෂය නිර්දේශයට ඇතුළත්ව ඇති සියලු විෂයයන් ආවරණය කරමින් සකස් කර ඇති මෙම මාර්ගෝපදේශ පිරිවෙන් සිසුන්ගේ ඉගෙනුම් කාර්ය සාධනය ඉහළ නංවාලීම වෙනුවෙන් සැබෑ මෙහෙවරක් වනු ඇති බව මගේ විශ්වාසය යි.

මෙම සද්කාර්යය වෙනුවෙන් දායක වූ අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යක්ෂතුමා, නිලධාරීන් ප්‍රමුඛ සමස්ත කාර්ය මණ්ඩලයට ද ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය ප්‍රමුඛ නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලයට ද කෘතවේදී ස්තුතිය පිරිනමමි.

**අකිල විරාජ් කාරියවසම්**
අධ්‍යාපන අමාත්‍ය.

# අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපන සම්ප්‍රදාය සුරකිමින් ත්‍රිවිධ ශාසනයේ අභිවෘද්ධිය වෙනුවෙන් ථේරවාදී භික්ෂු සමාජයේ මනා පැවැත්මට උර දිය හැකි ධර්මධර හා විනයධර භික්ෂු පිරිසක් හා ලාංකේය අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් අනාගත අභියෝගවලට මුහුණ දිය හැකි ආධ්‍යාත්මික සංවර්ධනයකින් හෙබි පුරවැසියන් පිරිසක් බිහි කර ගැනීම පිරිවෙන් අධ්‍යාපනයෙන් අපේක්ෂිත ය. අනාගත ලෝක ප්‍රජාවේ යහපැවැත්ම සඳහා වූ ආදර්ශවත් පුරවැසියන් පිරිසක් බිහි කිරීමේ වගකීමෙන් මිදීමට අපට නොහැකි ය.

කාලීනව වෙනස් වන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ තාක්ෂණික ක්‍රමශිල්ප හා විවිධ කාර්යක්ෂම හා ඵලදායි ක්‍රමවේද අනුගමනය කරමින් පිරිවෙන් ශිෂ්‍ය ප්‍රජාව බලාත්මක කළ යුතු ය. මානව හා භෞතික සම්පත් මනාව උපයෝජනය කර ගැනීමටත් විෂයමාලාව හා පන්ති කාමර කළමනාකරණය ඇතුළු කළමනාකරණ ක්‍රියාවලිය වගකීමෙන් හා වගවීමෙන් යුක්ත ව හසුරුවාලීම ගුරු භූමිකාවට ආදර්ශයකි.

කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි විශ්වීය පුරවැසියෙකු නිර්මාණය කිරීමේ අභියෝගයට ශක්තිමත් ව මුහුණ දීමට මෙම ගුරු මාර්ගෝපදේශය, ඔබට මහඟු පිටිවහලක් වනු ඇත.

ශිෂ්‍ය ප්‍රජාවේ විවිධත්වය හඳුනා ගනිමින් වඩාත් උචිත ක්‍රමශිල්ප යොදා ගනිමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ජාතික අධ්‍යාපනික අරමුණු, පරමාර්ථ හා සුවිශේෂ පිරිවෙන් අභිමතාර්ථ සාධනයට සියලු ම පිරිවෙන් ගුරු ප්‍රජාව කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

**එම්. එන්. රණසිංහ**
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය.

# අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාව මගින් සම්පාදනය කර තිබූ විෂය නිර්දේශයේ අන්තර්ගතය සංශෝධනය කිරීමෙන් පසු අදාළ නිපුණතා සාක්ෂාත් වන පරිදි පාඩම් සැලසුම් කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ අභිනවයෙන් පිහිටුවන ලද පිරිවෙන් අධ්‍යාපන ඒකකය මගින් මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කර ඇත.

පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වන පරිදි ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරුවරුන්ට ද ලබා දී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය උසස් මට්ටමකට ගෙන ඒම සඳහා සැලසුම් කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය ගත් යහපත් තීරණයකි. ඒ වෙනුවෙන් අපගේ ස්තුතිය හිමි වන අතර ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීම ජාතික අධ්‍යාපන ආයතනයට පැවරීමෙන් එම තීරණය යථාර්ථයක් බවට පත් විය.

සාම්ප්‍රදායික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට පමණක් සීමා නො වී නව ඉගෙනුම් ඉගැන්වීම් ප්‍රවේශ පිළිබඳව යොමු වීමට මෙම ගුරු මාර්ගෝපදේශයේ අන්තර්ගත උපදෙස් පිරිවෙන් ගුරුවරුන්ට උපකාර වනු ඇත. ඒ අනුව නව ප්‍රවේශ හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳව ගවේෂණය කර තම පාඩම් සැලසුම් කර ගැනීමෙන් ඉහළ ගුණාත්මක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක නිරත වීමට හැකියාව ලැබේ.

මෙහි අන්තර්ගතය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. එනම් විෂය නිර්දේශය සහ එහි නිපුණතා හා නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට උපකාර වන ක්‍රියාකාරකම් සංග්‍රහය යි. එක් එක් නිපුණතාවට අදාළ නිපුණතා මට්ටම් ආවරණය වන ආකාරයට ඉගෙනුම් පල සාක්ෂාත් වන පරිදි ඒ සඳහා වෙන් කර ඇති කාලය ද සැලකිල්ලට ගෙන ක්‍රියාකාරකම් සමූහය නිර්මාණය කර ඇත. ක්‍රියාකාරකම් පදනම් කර ගෙන නව ක්‍රියාකාරකම් නිර්මාණය කර ගැනීමට ද මෙමගින් අවකාශය ලැබෙනු ඇත.

ඉතා කෙටි කාලයකින් මූලික පිරිවෙන් විෂයමාලවෙහි සියලු විෂයයන් සඳහා ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමට ශාස්ත්‍රීය නායකත්වය දුන් ජාතික අධ්‍යාපන ආයතනයේ පිරිවෙන් අධ්‍යාපන ඒකකයටත් ජාතික අධ්‍යාපන ආයතනයේ විෂය විශේෂඥයන්ට මෙන් ම බාහිර සම්පත් දායකයන්ටත් මාගේ ස්තුතිය පිරිනැමේ.

**ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය.

# පෙරවදන

පිරිවෙණ ශ්‍රී ලාංකේය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයකි. මිහිඳු මහ රහතන් වහන්සේ ශ්‍රී ලංකා ධරණී තලයෙහි ස්ථාපිත කළ උතුම් සම්බුද්ධ ශාසනය යුග යුග පසු කර නොයෙක් බාධා හමුවේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව වෙත අවිච්ඡින්නව දායාද කරමින් ධර්මඥානයෙන් පිරිපුන් යතිවර පරපුරක් හා දෑ හිතකාමී ජන සමාජයක් පිරිවෙණ මගින් නිර්මාණය කිරීමට භික්ෂූන් වහන්සේ සමත් වූහ.

අතීතයේ පටන් ම කාලීන අවශ්‍යතා සපුරාලමින් හා සාම්ප්‍රදායික අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් ගිහි පැවිදි සමාජයේ අභිවෘද්ධිය වෙනුවෙන් පිරිවෙණ මගින් සිදු වූ මෙහෙය අනුපමේය ය. සම්භාව්‍ය අධ්‍යාපනය ආරක්ෂා කර ගනිමින් පාරම්පරික ශාසනික ක්‍රමවේද හා නූතන අධ්‍යාපන රටා මනාව සම්මිශ්‍රණය කර වර්තමානයේ පිරිවෙන් අධ්‍යාපනය ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේගේ සහ ගිහි සිසුන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන අද වන විට නිපුණතා පාදක නව විෂයමාලාවක් ඔස්සේ අවශ්‍ය දැනුම ලබා දීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව දරන ප්‍රයත්නය අතිශයින් අගය කරමු. එයට ශක්තියක් වෙමින් සියලු ම විෂය සඳහා නව විෂය නිර්දේශ මුද්‍රණය කරවීම හා මූලික පිරිවෙණ සඳහා පෙළපොත් 54ක් වාර්ෂික ව මුද්‍රණය කර ලබා දීම මගින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව ද අවශ්‍ය පහසුකම් සලසා ඇත.

නිපුණතා පාදක වන විෂයමාලාව සඳහා ගුරු මාර්ගෝපදේශ සැකසීම පිරිවෙන් අධ්‍යාපනය වෙනුවෙන් පළමු වරට සිදු වන උසස් ක්‍රියාදාමයකි. ජාතික අධ්‍යාපන ආයතනය හා පිරිවෙන් අධ්‍යාපන ශාඛාව එක් ව සම්පාදනය කළ මෙම ගුරු මාර්ගෝපදේශ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගින් මුද්‍රණය කර ඔබ අතට පත් කිරීමට ලැබීම සතුටට කරුණකි. මෙම කාර්යය සඳහා දායකත්වය සැපයූ උපදේශක, සංස්කාරක, ලේඛක මණ්ඩල සාමාජික සියලු දෙනාට ද අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ද මගේ ස්තුතිය පිරිනමමි. පිරිවෙන් අධ්‍යාපනයේ ඉදිරි දියුණුව ද පතමි.

**ඩබ්ලිව්. එම්. ජයන්ත වික්‍රමනායක**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල.
2019.04.10

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

නූතන ලාංකේය පිරිවෙන් ක්ෂේත්‍රයෙහි මෙම ගුරු මාර්ගෝපදේශ බිහි වීම ඓතිහාසික අවස්ථාවක් බව මම පළමුව සඳහන් කරමි. ජාතික අධ්‍යාපන ආයතනයත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අංශයත් සුසංයෝග වී මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනය වීම ඊට හේතුව යි.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පාසල් අධ්‍යාපනය සඳහා විෂය නිර්දේශ, ගුරු මාර්ගෝපදේශ, ගුරු පුහුණු, අධ්‍යාපන කළමනාකරුවන් පුහුණු කිරීම සහ අධ්‍යාපන පර්යේෂණ සිදු කිරීමේ ව්‍යවස්ථාපිත බලය ඇති එක ම ආයතනය 1985 අංක 28 දරන පනතින් ස්ථාපිත වූ ජාතික අධ්‍යාපන ආයතනය යි. එහෙත් මේ වන විට වසර 2325ක ඉතිහාසයක් ඇති මහා විහාරයීය අධ්‍යාපන සම්ප්‍රදායේ කේන්ද්‍රස්ථානය වූ 'පිරිවෙණ'ට ව්‍යවහාර වර්ෂ 2017 තෙක් ජාතික අධ්‍යාපන ආයතනයේ ඍජු දායකත්වයක් නො තිබිණ.

පිරිවෙන් අංශයක්/දෙපාර්තමේන්තුවක් නොමැති ජාතික අධ්‍යාපන ආයතනයක් තිබිය හැකි දැ යි නිතර අපට පෙළන ලද කරුණකි. මෙයට විසඳුමක් ලබා ගැනීම සඳහා අපට දායක වීමට හැකි වූයේ වර්තමාන අතිගරු ජනාධිපතිතුමන්, ගරු අධ්‍යාපන ඇමතිතුමන්, 2018 වර්ෂයේ කටයුතු කළ අධ්‍යාපන ලේකම්තුමා, එවකට පිරිවෙන් අධ්‍යක්ෂ ස්වාමීන්ද්‍රයාණන්, ජාතික අධ්‍යාපන ආයතනයේ වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ පූර්ණ අනුග්‍රහය හා ආශීර්වාදය ලැබීමෙනි.

ඒ අනුව අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017 ජනවාරි මස 31 දින රැස් වූ ජාතික බෞද්ධ බුද්ධි බලමණ්ඩලයේ තීරණය පරිදි සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ 2017.03.16 දිනැති 412/5/12 IM No.5157 තීරණය පරිදි ජාතික අධ්‍යාපන ආයතනයේ භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවට අයත්ව පිරිවෙන් අධ්‍යාපන ඒකකය ස්ථාපිත විය.

එහි ප්‍රතිඵලයක් ලෙස පිරිවෙන් ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරු පුහුණුව සිදු කිරීමේ කාර්යයන්ට දායක වීමට ජාතික අධ්‍යාපන ආයතනයට ඍජුව හැකි විය. ජාතික අධ්‍යාපන ආයතනය සතු ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ පළපුරුද්ද, පර්යේෂණ, අත්දැකීම්, තාක්ෂණික ප්‍රාගුණ්‍යය සුසංයෝග කර ගනිමින් පිරිවෙන් පන්ති කාමරයෙහි අවදිමත් බවක් ඇති කිරීමට ලද මෙම අවස්ථාව මහාර්ඝ භාග්‍යයකි. අප්‍රමාණ සතුටකි.

පිරිවෙන්හි ගුරු භවතුන් මෙම ගුරු මාර්ගෝපදේශ පරිශීලනයෙන් පිරිවෙන් පන්ති කාමරය ශිෂ්‍ය මිත්‍රභාවයෙන් ප්‍රබෝධාත්මකව ඉහළ සාධනයකට පිරිවෙන් අධ්‍යාපනය නංවාලීමට කටයුතු කරන ලෙස ගෞරවයෙන් ආයාචනා කරමි. මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනයට දායක වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, පිරිවෙන් අධ්‍යාපන ඒකක ප්‍රධාන සහ සියලු විද්වතුනට ගෞරවය පිරිනමමි.

**ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය.

## පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පණිවිඩය

මහින්දාගමනයෙන් පසු ලක්දිව ශාසන ප්‍රතිෂ්ඨාපන කාර්යයේ දී මහා අරිට්ඨ තෙරුන් විසින් මහා මහින්ද තෙරුන් මුලසුන තබා ථූපාරාම විහාරයේ ධර්ම මණ්ඩපයේ දී මත්තාභය තෙරුන් ප්‍රමුඛ පන්සියයක් දෙනා වහන්සේට විනය ඉගැන්වීමේ රාජ්‍ය මහෝත්සවයෙන් ලක්දිව පාරිවේණික අධ්‍යාපනය ආරම්භ කෙරිණ. එවක් පටන් විවිධ අවධිවල උන්නතියට හා අවනතියට ලක්වෙමින් ලක්වැසි ගිහි පැවිදි සුවහස් සංඛ්‍යාත ප්‍රජාවට පිරිවෙන් අධ්‍යාපනයෙන් වූ සේවාව මහාර්ඝ ය. පිරිවෙණ මගින් සාරධර්ම අධ්‍යාපනය කේන්ද්‍ර කර ගත් ඥානයත් සම්භාව්‍ය හා නූතන භාෂාවනුත් ශිල්ප කලා ඥානයත් ජ්‍යොතිර්විද්‍යා, වාස්තුවිද්‍යා ඥානයත් ආදි ඥාන සම්භාරයත් කාලීන අධ්‍යාපනය අනුව පුද්ගල පෞරුෂයට අවශ්‍ය සියලු සාධකත් සම්පාදනය කෙරේ.

21 සියවසේ අධ්‍යාපන ක්ෂේත්‍රය නිපුණතා පාදක ක්‍රමයට නැඹුරු විය. පිරිවෙන් අධ්‍යාපනයට නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමය ආගන්තුක නො වුණ ද පිළිගත් ක්‍රම ශිල්ප ඔස්සේ පිරිවෙණට අවශ්‍ය විෂය නිර්දේශ හා පෙළපොත් සම්පාදනය කෙරිණ. එමගින් ශිෂ්‍ය නිපුණතා මට්ටම අනුක්‍රමයෙන් වර්ධනය වන ශිෂ්‍ය මිතුරු පාඨමාලාවක් පිරිවෙන්වලට ඉදිරිපත් කෙරිණි. ගුරුභවතුන්ට අවශ්‍ය පාඩම් සැලසුම් කිරීම, මිනුම් ඇගයුම් ක්‍රම හා තක්සේරුකරණය සඳහා අවශ්‍ය ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කර දීම පිරිවෙන් අධ්‍යාපන ඉතිහාසයේ පළමු වරට සිදු කරන්නට ලැබීම පිළිබඳව අනතිමානී ආනන්දයක් ලබමි. පන්ති කාමරය තුළ වඩාත් ඵලදායි ගුරුවරයකු වීමට ගුරු මාර්ගෝපදේශයේ එන උපදෙස්, ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් යොදා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. පාරිවේණික ගිහි පැවිදි සිසුන්ට අවශ්‍ය මනා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර ගැනීමට ඔබට මේ ගුරු මාර්ගෝපදේශය මහෝපකාරි වනු ඇතැයි සිතමි.

මේ මහඟු කාර්යය යථාර්ථයක් බවට පත් කිරීමේ දී සහාය වූ ජාතික අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩලයටත් පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ කාර්ය මණ්ඩලයටත් උපදේශකත්වය, සම්බන්ධීකරණය, විෂය නියාමනය හා විවිධ අයුරින් සම්පත්දායකත්වය සැපයූ සියලු පාර්ශ්වයන්ටත් මාගේ කෘතඥතාව පිරිනමමි.

**විජිත වෙලගෙදර**
අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
අධ්‍යාපන අමාත්‍යාංශය.

# ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය

**උපදේශකත්වය හා අනුමැතිය** : ජාතික අධ්‍යාපන ආයතනය සහ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය.

**මෙහෙයවීම** : ආචාර්ය ටී.ඒ.ආර්.ජේ. ගුණසේකර, අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය.

විජිත වෙලගෙදර, අධ්‍යක්ෂ, පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය.

**අධීක්ෂණය** : ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය, ජාතික අධ්‍යාපන ආයතනය.

එම්. ආර්.ඩබ්ලිව්. මද්දුම, අධ්‍යක්ෂ, සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.

**සම්බන්ධීකරණය** : පූජ්‍ය කුකුරම්පොල ඤාණවිමල හිමි, ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය, ඒකක ප්‍රධාන, පිරිවෙන් අධ්‍යාපන ඒකකය, ජාතික අධ්‍යාපන ආයතනය.

පූජ්‍ය කෙහෙල්වල විපස්සි හිමි, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය.

**විෂය නියාමනය** : පූජ්‍ය කුකුරම්පොල ඤාණවිමල හිමි, ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය, ඒකක ප්‍රධාන, පිරිවෙන් අධ්‍යාපන ඒකකය, ජාතික අධ්‍යාපන ආයතනය

**විෂය විශේෂඥ උපදේශනය** : විශ්‍රාමික මහාචාර්ය රත්න විජේතුංග, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

**ලේඛක මණ්ඩලය** : පූජ්‍ය කුකුරම්පොල ඤාණවිමල හිමි, ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය, ඒකක ප්‍රධාන, පිරිවෙන් අධ්‍යාපන ඒකකය, ජාතික අධ්‍යාපන ආයතනය.

ඊ.ආර්. නිමල් ප්‍රේමකුමාර, ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය (විශ්‍රාමික) ජාතික අධ්‍යාපන ආයතනය.

එච්. පී. සුසිල් සිරිසේන, කථිකාචාර්ය, හාපිටිගම් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, මීරිගම.

පී.එල්. ලලිත් අබේසේකර, ගුරු උපදේශක (පිරිවෙන්) මහනුවර.

අයි.ජී.ඩී.ආර්. ඉලුක්ගොඩ, ගුරු උපදේශක (පිරිවෙන්) කෑගල්ල.

**භාෂා සංස්කරණය :** එච්.එල්.එස්. අභයසිංහ, විශ්‍රාමික කථිකාචාර්ය,
සීතාවකපුර පිරිවෙන් අභ්‍යාස ආයතනය.

**සෝදුපත් බැලීම** : යූ.කේ. රත්නායක, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්),
පිරිවෙන් අධ්‍යාපන ඒකකය, ජාතික අධ්‍යාපන ආයතනය.

**පරිගණක වදන්** : නිල්මිණී බටවල, ජාතික අධ්‍යාපන ආයතනය

**පිටකවර නිර්මාණය** : ජේ. එච්. තරිඳු හසංග, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, (විද්‍යා හා තොරතුරු තාක්ෂණය) පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය.

**විවිධ සහාය** : පූජ්‍ය මාදෝවිට වජිරබුද්ධි හිමි, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්), අධ්‍යාපන අමාත්‍යාංශය.

පූජ්‍ය හල්වල ආනන්ද හිමි, මැදගොඩලන්ද පුරාණ විහාරය, අතුරුගිරිය.

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

මූලික පිරිවෙන් විෂයමාලාවේ සිංහල විෂයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක ව ඉටු කර ගැනීමට මග පෙන්වීම සඳහා මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කර ඇත. ඒ අනුව අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාව මගින් සකස් කර තිබූ සිංහල විෂය නිර්දේශය හා පෙළපොත මේ සඳහා පදනමක් ලෙස යොදා ගැනිණි. විෂය නිර්දේශයේ ඇතුළත් වූ නිපුණතා හා නිපුණතා මට්ටම් දැඩි වෙනසකට ලක් නො කොට ගුරු මාර්ගෝපදේශය සඳහා ක්‍රියාකාරකම් සකස් කෙරිණි. නිපුණතා මට්ටම් සාක්ෂාත් වන පරිදි ඉගෙනුම් පල අලුතින් සකස් කිරීමට සිදු විය. මෙහි දැක්වෙන ක්‍රියාකාරකම්වලින් මූලික පිරිවෙන් පන්තිවල ඉගැන්වීම සඳහා පාඩම් සැලසුම් සකස් කර ගැනීමට උපදෙස් ලබා දී තිබේ. ඒ අනුව සිංහල විෂය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ඵලදායි ව සිදු කර ගැනීම සඳහා එම උපදෙස් අනුගමනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මීට පෙර පිරිවෙන් විෂයමාලාව ක්‍රියාත්මක කිරීම සඳහා ගුරු මාර්ගෝපදේශ නො තිබූ අතර පිරිවෙන් ගුරුවරු තම අභිමතය පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කළහ. එසේ වූ විට එක් එක් පිරිවෙන්වල විෂය ඉගැන්වීම එකිනෙකින් වෙනස් වීමත් සමාන ඉගෙනුම් අවස්ථා ශිෂ්‍යයන්ට නො ලැබී යාමත් අනිවාර්යයෙන් ම සිදු වේ. එය විධිමත් අධ්‍යාපන ක්‍රියාවලියට මෙන් ම විධිමත් ඇගයීම් ක්‍රියාවලියට ද බාධාකාරී තත්ත්වයකි. එනිසා පිරිවෙන් විෂයමාලාවට ගුරු මාර්ගෝපදේශ සකස් කර දීමෙන් මෙකී තත්ත්වය අවම කිරීමට හැකියාව ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පිරිවෙන්වල මෙතෙක් පැවති සාම්ප්‍රදායික ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද වෙනස් කිරීමට මෙමගින් උපදෙස් දෙනු නො ලැබේ. පැරණි දේ සුරකිමින් නව ඉගෙනුම් ඉගැන්වීම් අවස්ථා සම්පාදනය කිරීම බලාපොරොත්තු වේ. ඒ සඳහා නව තාක්ෂණය යොදා ගැනීම හා කණ්ඩායම් ඉගෙනුම් ක්‍රම භාවිත කිරීම ආදි උපදෙස් මෙමගින් ලබා දී ඇත.

විධිමත් ඉගෙනුම් අවස්ථා සම්පාදනය කර ගැනීම සඳහා එක් එක් නිපුණතා සඳහා ක්‍රියාකාරකම් සන්තතියක් මෙහි ඇතුළත් වේ. එක් නිපුණතාවක් ඉටු කර ගැනිම සඳහා නිපුණතා මට්ටම් දෙකක් හෝ කිහිපයක් විෂය නිර්දේශයෙහි දක්වා ඇත. එක් නිපුණතා මට්ටමක් සඳහා අවම වශයෙන් එක් ක්‍රියාකාරකමක් හෝ මෙහි ඇතුළත් කර ඇත. එම ක්‍රියාකාරකම සකස් කර ඇත්තේ එහි සඳහන් ඉගෙනුම් පල ඉටු කර ගැනීමට හැකි වන පරිදි ය. ඔබ පාඩම් සැලසුම් සකස් කිරීමේ දී එම ඉගෙනුම් පලවලින් සුවිශේෂ ඉගෙනුම් පල කාලච්ඡේදයට හා ශිෂ්‍ය මට්ටමට ගැළපෙන පරිදි සකස් කර ගත යුතු ය. ඔබ විසින් සකස් කර ගත් ඉගෙනුම් පල ඉටු වන පරිදි පියවර කිහිපයකින් යුත් පාඩම් සැලසුමක් මේ අනුව සකස් කර ගත යුතු ය. ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ඔබ සතු නිර්මාණශීලීත්වයට එමගින් ඉඩ සලසා ඇත.

ඉගෙනුම් පල මැන බැලීම සඳහා තක්සේරුකරණ ක්‍රියාවලියක් පවත්වා ගෙන යෑම අවධාරණය කෙරේ. ඒ සඳහා නිර්ණායක ද මෙහි දක්වා ඇත. ඔබ සකස් කරන ඉගෙනුම් පල මැනීම සඳහා ද ගැළපෙන නිර්ණායක සකස් කර ගත යුතු වේ. සෑම ඉගෙනුම් අවස්ථාවක් ම ඉගෙනුම් පල, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම් හා ඉගෙනුම් පල ඇගයීමේ නිර්ණායක යන සංරචක තුනකින් සමන්විත වේ. ඔබේ පාඩම් සැලසුම් ද එම සංරචක තුනෙන් යුක්ත වීම අනිවාර්ය වන අතර එම සංරචක තුනේ අන්‍යෝන්‍ය සම්බන්ධය තිබීම ද අත්‍යවශ්‍ය වේ. විෂය කරුණු කියා දීම පමණක් ප්‍රමාණවත් නැත. ඉගෙනුම මැන බැලීම සඳහා තක්සේරුකරණ ක්‍රියාවලියක් තිබීම ද ඒ සඳහා නිර්ණායක තිබීම ද අත්‍යවශ්‍ය වේ.

ඉගෙනුම් පල, ක්‍රියාකාරකම්, තක්සේරුකරණ නිර්ණායක යන සංරචක තුනට අනුව ඔබේ නිර්මාණශීලී ඉගැන්වීම් රටාව සංවිධානය කර ගැනීමට මෙම ගුරු මාර්ගෝපදේශය ඔබට අත්වැලක් වනු ඇත. එය මැනවින් භාවිත කර ඉගැන්වීම් කාර්යය සාර්ථක කර ගැනීමට හැකි වේවා යන්න අපගේ ප්‍රාර්ථනය යි.

**පූජ්‍ය කුකුරම්පොල ඤාණවිමල හිමි**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඒකක ප්‍රධාන
පිරිවෙන් අධ්‍යාපන ඒකකය
ජාතික අධ්‍යාපන ආයතනය.

# පටුන


| | | පිටුව |
|---|---|---|
| | ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවිඩය | iii |
| | අධ්‍යාපන ලේකම්තුමාගේ පණිවිඩය | iv |
| | අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | v |
| | පෙරවදන | vi |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | vii |
| | පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පණිවිඩය | viii |
| | ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය | ix - x |
| | ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | xi |
| | 5 ශ්‍රේණිය - වාර නියමය | xiv - xv |
| | ජාතික අරමුණු | xvi |
| | මූලික නිපුණතා | xvii-xviii |
| | විෂය අධ්‍යයනයේ අරමුණු | xix |
| | විෂය නිර්දේශය - 5 ශ්‍රේණිය | xx-xxxiv |
| | ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | xxxv |
| 1 | සිංහල අක්ෂර මාලාව - (අක්ෂර වර්ගීරණය) | 01 - 03 |
| 2 | සිංහල අක්ෂර මාලාව (අකාරාදි පිළිවෙළ) | 04 - 05 |
| 3 | සිංහල අක්ෂර මාලාව (අක්ෂර වින්‍යාසය) | 06 - 08 |
| 4 | පද විභාගය (නාම පද) | 09 - 11 |
| 5 | පද විභාගය - (නාම වරනැගීම) | 12 - 15 |
| 6 | පද විභාගය - (අව්‍ය පද) | 16 - 17 |
| 7 | සන්ධි | 18 - 20 |
| 8 | සමාස | 21 - 22 |
| 9 | ආඛ්‍යාත පද - (අවසාන ක්‍රියා) | 23 - 24 |
| 10 | බැද්දේගම - (නවකතාව) | 25 - 27 |
| 11 | සැළලිහිණි සන්දේශය | 28 - 29 |
| 12 | නූතන පද්‍ය සාහිත්‍යය ඉතිහාසය | 30 - 31 |

| | | |
|---|---|---|
| 13 | නූතන පද්‍ය රසාස්වාදය | 32 - 33 |
| 14 | චිරන්තන ගද්‍ය සංග්‍රහය | 34 - 37 |
| 15 | ප්‍රත්‍යයාර්ථ නාම (තද්ධිත) | 38 - 40 |
| 16 | ප්‍රත්‍යයාර්ථ නාම (කෘදන්ත පද) | 41 - 42 |
| 17 | නෛපාතික කෘදන්ත | 43 - 45 |
| 18 | කාරක | 46 - 47 |
| 19 | වාක්‍ය නිර්මාණය | 48 - 49 |
| 20 | වාක්‍ය නිර්මාණය (විශේෂ වාක්‍ය රීති) | 50 - 51 |
| 21 | වාක්‍ය නිර්මාණය (කර්මකාරක වාක්‍ය) | 52 - 54 |
| 22 | අර්ථාවබෝධය | 55 - 56 |
| 23 | විරාම ලක්ෂණ | 57 - 58 |
| 24 | ප්‍රායෝගික ලේඛනය | 59 - 61 |
| 25 | චිරන්තන ගද්‍ය සංග්‍රහය | 62 - 64 |
| 26 | වාක්‍ය රචනය | 65 - 67 |
| 27 | සාරාංශකරණය | 68 - 69 |
| 28 | සාම්ප්‍රදායික යෙදුම් | 70 - 72 |
| 29 | සාහිත්‍ය රසාස්වාදය හා විචාරය | 73 - 75 |
| 30 | වාක්කෝෂය පෝෂණය | 76 - 79 |
| 31 | සිංහල සාහිත්‍ය ඉතිහාසය | 80 - 81 |
| 32 | චිරන්තන ගද්‍ය සංග්‍රහය | 82 - 84 |
| 33 | විෂය සමගාමී ක්‍රියාකාරකම් (පද්‍ය නිර්මාණය) | 85 - 87 |
| 34 | විෂය සමගාමී ක්‍රියාකාරකම් (ස්වනිර්මාණ සංග්‍රහය) | 88 - 89 |
| 35 | විෂය සමගාමී ක්‍රියාකාරකම් (විද්‍යුත් මාධ්‍යයට සවන්දීම) | 90 - 91 |
| 36 | විෂය සමගාමී ක්‍රියාකාරකම් (දේශනවලට සවන්දීම) | 92 - 93 |
| 37 | විෂය සමගාමී ක්‍රියාකාරකම් (මාතෘකාවලට කථනය) | 94 - 95 |
| 38 | විෂය සමගාමී ක්‍රියාකාරකම් (විස්තර ප්‍රචාරය) | 96 - 97 |

# 5 ශ්‍රේණිය

## වාර නියමය

| වාරය | පෙළ පොතේ පාඩම් අංකය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | නිපුණතා මට්ටම | පෙළපොත සහ නිර්දිෂ්ට ග්‍රන්ථ සඳහා මාර්ගෝපදේශය | | කාලච්ඡේද |
|---|---|---|---|---|---|---|
| | | | | පෙළපොතේ පාඩම්/<br>නිර්දිෂ්ට ග්‍රන්ථ | ගුරු මාර්ගෝපදේශය<br>ක්‍රියාකාරකම් | |
| 1 වාරය | 01 | 01<br>02<br>03 | 1.1<br>1.2<br>1.3 | සිංහල අක්ෂර මාලාව | වර්ගීකරණය<br>අකාරාදි පිළිවෙළ<br>අක්ෂර වින්‍යාසය | 06<br>03<br>01 |
| | 02 | 04<br>05<br>06 | 2.1<br>2.2<br>2.3 | පද විභාගය | නාම පද<br>නාම වරනැගීම<br>අව්‍යය පද | 02<br>02<br>01 |
| | 03 | 07 | 2.4 | සන්ධි | සන්ධි | 05 |
| | 04 | 08 | 2.5 | සමාස | සමාස | 03 |
| | 05 | 09 | 2.6 | ආඛ්‍යාත පද | අවසාන ක්‍රියා | 03 |
| | නිර්දිෂ්ට ග්‍රන්ථ | 10 | 6.1 | බැද්දේගම නවකතාව | බැද්දේගම නවකතාව | 10 |
| | නිර්දිෂ්ට ග්‍රන්ථ | 11 | 7.2 | සැළලිහිණි සන්දේශය | සැළලිහිණි සන්දේශය | 10 |
| | නිර්දිෂ්ට ග්‍රන්ථ | 12 | 7.3 | නූතන පද්‍ය කාව්‍ය සංහිතා | නූතන පද්‍ය සාහිත්‍ය ඉතිහාසය | 02 |
| | නිර්දිෂ්ට ග්‍රන්ථ | 13 | 7.4 | නූතන පද්‍ය කාව්‍ය සංහිතා | නූතන පද්‍ය රසාස්වාදය | 08 |
| | නිර්දිෂ්ට ග්‍රන්ථ | 14 | 7.1 | චිරන්තන ගද්‍ය සංග්‍රහය<br>සද්ධර්මරත්නාවලිය | කුණ්ඩලකේසීගේ වස්තුව හා<br>නන්ද තෙරුන්ගේ වස්තුව | 09 |
| 2 වාරය | 06 | 15 | 2.7 | ප්‍රත්‍යයාර්ථ නාම | තද්ධිත | 02 |
| | 06 | 16 | 2.8 | ප්‍රත්‍යයාර්ථ නාම | කෘදන්ත | 01 |
| | 07 | 17 | 2.9 | නෛපාතික කෘදන්ත | නෛපාතික කෘදන්ත | 03 |
| | 08 | 18 | 2.10 | කාරක | කාරක | 02 |
| | 09 | 19 | 2.11 | වාක්‍ය නිර්මාණය | වාක්‍ය නිර්මාණය | 01 |
| | 09 | 20 | 2.12 | වාක්‍ය නිර්මාණය | විශේෂ වාක්‍ය රීති | 05 |
| | 09 | 21 | 2.13 | වාක්‍ය නිර්මාණය | කර්මකාරක | 03 |
| | 10 | 22 | 6.3 | අර්ථාවබෝධය | අර්ථාවබෝධය | 01 |
| | 11 | 23 | 4.2 | විරාම ලක්ෂණ | විරාම ලක්ෂණ | 01 |
| | 12 | 24 | 5.1 | ප්‍රායෝගික ලේඛන | ප්‍රායෝගික ලේඛන | 04 |
| | නිර්දිෂ්ට ග්‍රන්ථ | 25 | 7.1 | චිරන්තන ගද්‍ය - ජාතක කතා | චුල්ල සෙට්ඨි හා චුල්ල හංස<br>ජාතක කතා | 11 |
| | නිර්දිෂ්ට ග්‍රන්ථ | 11 | 7.2 | සැළලිහිණි සන්දේශය | සැළලිහිණි සන්දේශය | 09 |
| | නිර්දිෂ්ට ග්‍රන්ථ | 10 | 6.1 | බැද්දේගම නවකතාව | බැද්දේගම නවකතාව | 07 |
| | නිර්දිෂ්ට ග්‍රන්ථ | 13 | 7.4 | නූතන පද්‍ය කාව්‍ය සංහිතා | නූතන පද්‍ය රසාස්වාදය | 07 |

| වාරය | පෙළ පොතේ පාඩම් අංකය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය, පෙළපොත සහ නිර්දිෂ්ට ග්‍රන්ථ සඳහා මාර්ගෝපදේශය | | කාලච්ඡේද |
|---|---|---|---|---|---|---|
| | | | | පොතේ පාඩම්/ නිර්දිෂ්ට ග්‍රන්ථ | ගුරු මාර්ගෝපදේශය ක්‍රියාකාරකම් | |
| 3 වාරය | 13 | 26 | 4.1 | වාක්‍ය රචනය | වාක්‍ය රචනය | 02 |
| | 14 | 27 | 4.3 | සාරාංශකරණය | සාරාංශකරණය | 02 |
| | 15 | 28 | 3.1 | සාම්ප්‍රදායික යෙදුම් | සාම්ප්‍රදායික යෙදුම් | 04 |
| | 16 | 29 | 11.1 | සාහිත්‍ය රසාස්වාදය හා විචාරය | සාහිත්‍ය රසාස්වාදය හා විචාරය | 04 |
| | 17 | 30 | 3.4 | වාක්කෝෂය පෝෂණය | වාක්කෝෂ පෝෂණය | 03 |
| | 18 | 31 | 7.1 | සිංහල සාහිත්‍ය ඉතිහාසය | සිංහල සාහිත්‍ය ඉතිහාසය | 02 |
| | නිර්දිෂ්ට ග්‍රන්ථ | 11 | 7.2 | සැළලිහිණි සන්දේශය | සැළලිහිණි සන්දේශය | 10 |
| | නිර්දිෂ්ට ග්‍රන්ථ | 10 | 6.1 | බැද්දේගම නවකතාව | බැද්දේගම නවකතාව | 07 |
| | නිර්දිෂ්ට ග්‍රන්ථ | 13 | 7.4 | නූතන පද්‍ය කාව්‍ය සංහිතා | නූතන පද්‍ය රසාස්වාදය | 06 |
| | නිර්දිෂ්ට ග්‍රන්ථ | 32 | 7.1<br>7.2 | චිරන්තන ගද්‍ය සංග්‍රහය<br>සද්ධර්මාලංකාරය | කුඩ්ඩරජ්ජ වස්තුව හා ධම්ම සවණෝපාසිකා වස්තුව | 08 |
| | විෂය සමගාමී | 33 | 8.1 | විෂය සමගාමී ක්‍රියාකාරකම් | පද්‍ය නිර්මාණය | 01 |
| | විෂය සමගාමී | 34 | 8.2 | විෂය සමගාමී ක්‍රියාකාරකම් | ස්වනිර්මාණ<br>නිර්මාණ සංග්‍රහය | 02 |
| | විෂය සමගාමී | 35 | 9.1 | විෂය සමගාමී ක්‍රියාකාරකම් | විද්‍යුත් මාධ්‍ය සවන් දීම | 02 |
| | විෂය සමගාමී | 36 | 9.2 | විෂය සමගාමී ක්‍රියාකාරකම් | දේශනවලට සවන් දීම | 02 |
| | විෂය සමගාමී | 37 | 10.1 | විෂය සමගාමී ක්‍රියාකාරකම් | මාතෘකානුකූල කථනය | 02 |
| | විෂය සමගාමී | 38 | 10.2 | විෂය සමගාමී ක්‍රියාකාරකම් | විස්තර ප්‍රචාරය | 02 |

# ජාතික අරමුණු

සාමාන්‍ය අධ්‍යාපනය අත්‍යවශ්‍යයෙන්ම පහත දී ඇති ජාතික අරමුණු සාක්ෂාත් කර ගැනීමට යොමු විය යුතුයි.

i. ජාතික ඒකාබද්ධතාව, ජාතික ඒකාග්‍රතාව සහ ජාතික සමගිය මුදුන්පත් කර ගැනීම

ii. සමාජ සාධාරණත්වයේ පැතිරෙන රටාව තහවුරු කිරීම

iii. තිරසාර ජීවන රටාවක පරිණාමය - මානව වර්ගයාගේ ඉතිහාසයේ ප්‍රථම වතාවට වාතය සහ ජලය පවා එසේම යැයි පිළිගත නොහැකි විටක වසර 2000 සහ ඉන් ඔබ්බට අවශ්‍ය වන තිරසාර ජීවන ශෛලියක්

iv. රැකියා අවස්ථා උත්පාදනය - ඒ සමගම ඒවා අභිමානවත්, අපේක්ෂා සපරාලන, ස්වාර්ථ සාධන වීම

v. ඉහත සැකිල්ල තුළ ජාතිය උදෙසා සිදු කෙරෙන වර්ධනය පිළිබඳ සමුච්චිත ව්‍යූහය වෙත යොමු වන මානව සම්පත් සංවර්ධනයේ දී සැමට ම සහභාගී වීම සඳහා විවිධ හැකියා ස්ථාපිත කිරීම.

vi. එකිනෙකා වෙනුවෙන් දැඩි සහ නො වෙනස් සැලකිල්ල පිළිබඳ අඛණ්ඩ හැඟීමක් ඇති කර ආරක්ෂා කිරීම ජාතිය ගොඩනැගීමේ කටයුතුවල සක්‍රිය සහභාගිත්වය තහවුරු කළ යුතු වේ.

vii. මෙකල අප ජීවත් වන වේගයෙන් වෙනස් වන ආකාරයේ ලෝකයක් තුළ වෙනස් වීමට අනුවර්තන හැකියාව ඇති මූලික දේවල් වැඩිදියුණු කර සකස් කර ගැනීම අත්‍යවශ්‍ය වේ. - වෙනස්වන අවස්ථාවන්ට අනුවර්තනය වීමට ඉගෙනීම - මෙය තමාගේ සහ අන් අයගේ අභිවෘද්ධිය සඳහා වෙනස් වීම මෙහෙය වීමට නිපුණතා සමග සම්බන්ධ කළ යුතු ය.

viii. ආරක්ෂාව සහ ස්ථාවරත්වය පිළිබඳ හැඟීමක් ඇති කර ගනිමින් සංකීර්ණ සහ අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමට ඇති හැකියාව වැඩිදියුණු කර ගැනීම

ix. ජාත්‍යන්තර ප්‍රජාව තුළ ගෞරවනීය ස්ථානයක් අත්පත්කර ගැනීමට සම්බන්ධවන්නා වූ නිපුණතාවන් වර්ධනය කර ගැනීම.

**(ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සඳහා යෝජනා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව 2016)**

## මූලික නිපුණතා

අධ්‍යාපනය මගින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටු කර ගැනීමට දායක වනු ඇත.

(i.) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් කර ගනී.

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම: භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ

ප්‍රවීණතාව : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයක් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගි කර ගැනීම.

(ii.) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය.
- කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්.
- චිත්තවේගී බුද්ධිය

(iii.) පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

ජෛව පරිසරය : සජීව ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා.

භෞතික පරිසරය: අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස,

සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය
අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව

(iv.) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම
තම වෘත්තීය ළැදියා සහ අභියෝග හඳුනා ගැනීම
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ
වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම
යන හැකියා උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(v.) ආගම සහ ආචාර ධර්මවලට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීකරණය

(vi.) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාව මගින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(vii.) ''ඉගෙනීමට ඉගෙනුම්'' පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් මගින් වෙනස් වීම හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම

## විෂය අධ්‍යයනයේ අරමුණු

01. ශ්‍රවණය, කථනය, කියවීම සහ ලිවීම යන චතුර්විධ භාෂා කුසලතා වර්ධනය කිරීම

02. සිංහල භාෂාවේ ව්‍යාකරණය සහ භාෂා සම්ප්‍රදාය පිළිබඳ අවබෝධය වර්ධනය කිරීම

03. භාෂාවේ වාච්‍යාර්ථ හා ලක්ෂ්‍යාර්ථ, ව්‍යංග්‍යාර්ථ වටහා ගැනීම

04. ප්‍රකාශනය, ව්‍යවහාරය හා අර්ථ ග්‍රහණ ශක්තිය වර්ධනය කරලීම

05. අවබෝධය, විශ්ලේෂණය, සංශ්ලේෂණය සහ සන්නිවේදන කුසලතා වර්ධනය කිරීම

06. සාහිත්‍ය පරිශීලනයෙන් නිර්මාණාත්මක ලේඛන ශෛලිය හා ශිල්පීය මූලධර්ම පිළිබඳ දැනුම, අවබෝධය ලබා ගැනීම හා වාංමාලාව පෝෂණය කර ගැනීම

07. විවිධ යුගවලට අයත් සාහිත්‍ය කෘති පරිශීලනයෙන් සාහිත්‍ය විචාර මූලධර්ම අවබෝධ කොට ගෙන වින්දනාත්මක හා විචාරාත්මක කුසලතා වර්ධනය කර ගැනීම

08. සාහිත්‍ය කෘති පරිශීලනයෙන් රසඥතාව වර්ධනය කර ගැනීම මගින් ජීවිත පරිඥානය පුළුල් කර ගැනීම

09. විශ්වවිශ්‍රැත සාහිත්යික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික ඥානය උකහා ගත හැකි වන පරිදි අවබෝධාත්මක පරිශීලනයට යොමු කිරීම

10. සිංහල සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ දැනුම පුළුල් කර ගනිමින් සමාජ සංස්කෘතික වටිනාකම් හඳුනා ගැනීම සඳහා පුරාතන සිංහල සාහිත්‍ය කෘති පරිශීලනයට හුරු කිරීම

11 සිංහල භාෂාවෙන් නිරූපිත භාෂාමය අනන්‍යතාව සහ තදනුබද්ධ සංස්කෘතික අනන්‍යතාව හැදෑරීම

12. සන්නිවේදන කාර්යය පහසු කරලීම සඳහා සාම්ප්‍රදායික භාෂා උපාංග නිවැරදි ව භාවිතයට හුරු කිරීම

# විෂය නිර්දේශය

## 5 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 අක්‍ෂර මාලාව නිරවුල්ව වටහා ගෙන නිවැරදි අක්‍ෂර වින්‍යාසය පිළිබඳ සැලකිලිමත් වෙමින් භාවිත කරයි. | 1.1 අක්ෂර මාලාව සවිස්තරාත්මකව හඳුනා ගෙන ලේඛනයේ යෙදෙයි. | අක්ෂර මාලාව<br>ශුද්ධ සිංහල අක්ෂර මාලාව<br>මිශ්‍ර සිංහල අක්ෂර මාලාව<br>නූතන සිංහල අක්ෂර මාලාව | 1.1 • නූතන සිංහල අක්‍ෂර මාලාව, සිදත් සඟරා හෝඩිය, ශුද්ධ සිංහල හෝඩිය මිශ්‍ර සිංහල හෝඩියෙන් වෙනස් වන ආකාරය පැහැදිලි කරයි.<br>• නූතන සිංහල අක්‍ෂර මාලාව වර්ග කර දක්වයි.<br>• උච්චාරණ ඉන්ද්‍රිය පද්ධතියේ ස්ථාන හා කරණ පිළිබඳ අවබෝධයෙන් යුතුව ශබ්ද උච්චාරණය කරයි.<br>• 'අ'කාරයේ සංවෘත, විවෘත භේදය හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• අකාරාදි පිළිවෙළට අනුව පද පෙළගස්වයි. | 06 |
| | 1.2 නිවැරදි අකාරාදි පිළිවෙළ අවස්ථෝචිතව භාවිත කරයි. | අක්ෂර ව්‍යවහාර<br>අක්ෂර ප්‍රභේද, උප්පත්ති ස්ථාන, අකාරාදි පිළිවෙළ පිළිබඳව සවිස්තර අවබෝධය | 1.2 • සිංහල අක්‍ෂර මාලාව අනුපිළිවෙළින් ලියයි.<br>• අකාරාදි පිළිවෙළ යනු කුමක් දැයි හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• අකාරාදි පිළිවෙළට නාමාවලි සැකසීමේ වැදගත්කම ප්‍රකාශ කරයි.<br>• වචන ගොනු, නාමාවලි ආදිය අකාරාදි පිළිවෙළට සකස් කරයි.<br>• ශබ්දකෝෂ, විශ්වකෝෂ භාවිතයේ දී අකාරාදි පිළිවෙළ පිළිබඳ දැනුම උපයෝගි කර ගනියි. | 03 |
| | 1.3 අක්‍ෂර මාලාව හඳුනා ගෙන නිවැරදි අක්‍ෂර වින්‍යාසයෙන් ලියයි. | අක්ෂර වින්‍යාසය පිළිබඳව ප්‍රමාණාත්මක අවබෝධය<br>සාම්ප්‍රදායික රීති<br>ව්‍යවහාර රීති | 1.3 • අක්‍ෂර වින්‍යාසය පිළිබඳ අවබෝධයෙන් යුතුව ලියයි.<br>• නිවැරදි ලේඛනය සඳහා අක්‍ෂර වින්‍යාසය පිළිබඳ අවශ්‍යතාව ප්‍රකාශ කරයි.<br>• අක්‍ෂර වින්‍යාසය අනුව වචනයක අර්ථ වෙනස් වන ආකාරය පැහැදිලි කරයි.<br>• විවිධ ලේඛනවල අක්‍ෂර වින්‍යාසය නිවැරදි කරයි.<br>• අක්‍ෂර වින්‍යාස රීති නිවැරදි ව භාවිත කිරීම අගය කරයි. | 01 |

# විෂය නිර්දේශය

## 5 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **2.0 ලේඛන කාර්යයන් ඉටු කර ගැනීමේ දී ව්‍යාකරණ රීති නිවැරදි ව යොදා ගනියි.** | 2.1 ලේඛන කාර්යයේ දී නාම පද පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි. | **පද විභාගය**<br>නාම, ක්‍රියා, නිපාත, උපසර්ග, විභක්ති පිළිබඳව සවිස්තරාත්මක අවබෝධය | 2.1 • පදයක් යනු කුමක් දැ යි නිර්වචනය කරයි.<br>• නාම පදය යනු කුමක් දැයි නිර්වචනය කරයි.<br>• නාම පදයේ ප්‍රභේද හඳුනා ගෙන විස්තර කරයි.<br>• නාම පදයක ලක්ෂණ හඳුනා ගෙන විස්තර කරයි.<br>• ලේඛනයේ දී නාම පද නිවැරදිව භාවිත කරයි. | 02 |
| | 2.2 ලේඛනයේ දී විභක්ති පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි. | **විභක්ති**<br>විභක්ති පිළිබඳ සවිස්තරාත්මක අවබෝධය | 2.2 • විභක්ති නිර්වචනය කරයි. විභක්ති නවය පිළිවෙළින් නම් කරයි.<br>• වාක්‍යවල යෙදී ඇති නාම පද අයත් වන විභක්තිය නිවැරදිව ප්‍රකාශ කරයි.<br>• නාම පදවල විභක්ති ප්‍රත්‍යය හා ප්‍රකෘතිය නිවැරදිව වෙන් කරයි.<br>• විභක්ත්‍යන්ත නාම පද භාවිත කරමින් නිවැරදි ව වාක්‍ය නිර්මාණය කරයි. | 02 |
| | 2.3 ලේඛනයේ දී අව්‍යය පද පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි. | **අව්‍යය පද**<br>අව්‍යය පද පිළිබඳව සවිස්තරාත්මක අවබෝධය | 2.3 • අව්‍යය පද යන්න නිවැරදි ව අර්ථ කථනය කරයි.<br>• අව්‍යය පද වර්ග දෙකක් ඇති බව හඳුනා ගෙන නිවැරදි ව නම් කරයි.<br>• අර්ථය අනුව නිපාත පද වර්ග කළ හැකි ආකාරය පෙන්වා දෙයි.<br>• අවබෝධයෙන් යුතු ව උපසර්ග භාවිත කරයි.<br>• ලේඛන කාර්යයේ දී අව්‍යය පද නිවැරදි ව භාවිත කරයි. | 01 |
| | 2.4 ලේඛනයේ දී සන්ධි පද පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි. | **සන්ධි පද**<br>සන්ධි කාර්යය, සන්ධි විධි, සන්ධි ප්‍රභේද පිළිබඳව පූර්ණ අවබෝධය | 2.4 • සන්ධි යනු කුමක් දැයි හඳුනා ගෙන නිර්වචනය කරයි.<br>• සන්ධි කාර්යයන් විස්තර කරයි.<br>• ව්‍යවහාර සන්ධි විස්තර කරයි.<br>• විසන්ධි පදවල කොටස් නම් කරයි.<br>• පද සන්ධි කර වචන සකස් කරයි.<br>• සන්ධි පද විසන්ධි කර දක්වයි.<br>• වාක්‍ය නිර්මාණයේ දී පද නිවැරදි ව සන්ධි කර ලියයි. | 05 |

# විෂය නිර්දේශය

## 5 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.5 ලේඛන කාර්යයේ දී සමාස පද පිළිබඳ අවබෝධය ප්‍රකාශ | **සමාස**<br>සමාස ප්‍රභේද පිළිබඳව පූර්ණ අවබෝධය | 2.5 • සමාස යනු කුමක් දැ යි හඳුනා ගෙන නිර්වචනය කරයි.<br>• සමාසවලින් භාෂාවට ඇති ප්‍රයෝජන හඳුනා ගෙන විස්තර කරයි.<br>• සමාස වර්ග කර දක්වයි.<br>යුක්තාර්ථවත් පද සමූහ සමාස කර දක්වයි.<br>• වාක්‍ය නිර්මාණයේ දී සමාස පද නිවැරදි ව යොදා ගනියි. | 03 |
| | 2.6 වාක්‍ය සැකසීමේ දී ආඛ්‍යාතය නිවැරදි ව භාවිත කරයි. | **ආඛ්‍යාත පද**<br>විධි, ප්‍රාර්ථනා, ප්‍රයෝජ්‍ය ක්‍රියා පිළිබඳව සවිස්තරාත්මක අවබෝධය | 2.6 • ආඛ්‍යාත පද යනු කුමක් දැයි හඳුනා ගෙන නිර්වචනය කරයි.<br>• ආඛ්‍යාත පදයකින් වාක්‍යයට ඇති ප්‍රයෝජන හඳුනා ගෙන විස්තර කරයි.<br>• වාක්‍යයක් සම්පූර්ණ වීමට ආඛ්‍යාත පදයක් අවශ්‍ය බව ප්‍රකාශ කරයි.<br>• නිවැරදි ව ආඛ්‍යාත පද භාවිත කර වාක්‍ය නිර්මාණය කරයි. | 03 |
| | 2.7 ලේඛන කාර්යයේ දී තද්ධිත පද පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි. | **ප්‍රත්‍යයාර්ථ නාම**<br>තද්ධිත, කෘදන්ත පිළිබඳව සවිස්තරාත්මක අවබෝධය | 2.7 • ප්‍රත්‍යයාර්ථ නාම යනු කුමක් දැයි පැහැදිලි කරයි.<br>• ප්‍රත්‍යයාර්ථ නාම, තද්ධිත හා කෘදන්ත වශයෙන් වර්ග වන බව ප්‍රකාශ කරයි.<br>• තද්ධිත පදවල මූලික අංග හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>විවිධාර්ථවත් තද්ධිත ප්‍රත්‍ය හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• තද්ධිත ප්‍රත්‍ය නිවැරදි ව හඳුනා ගෙන තද්ධිත නාම පද සකස් කරයි.<br>• ලේඛනයේ දී තද්ධිත පද නිවැරදි ව භාවිත කරයි. | 02 |

# විෂය නිර්දේශය

## 5 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.8 කෘදන්ත නාම සකස් කර නිවැරදි ව භාවිත කරයි. | **කෘදන්ත** පිළිබඳව සවිස්තරාත්මක අවබෝධය | 2.8 • කෘදන්ත නාම හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• කෘදන්ත පදයක් සෑදෙන අයුරු විස්තර කරයි,<br>• කෘදන්ත නාම පද වර්ග කර දක්වයි.<br>• විවිධ ප්‍රත්‍යය එකතු වී කෘදන්ත නාම සකස් වන ආකාරය පැහැදිලි කරයි.<br>• ලේඛනයේ දී කෘදන්ත නාම පද නිවැරදි ව භාවිත කරයි. | 01 |
| | 2.9 වාක්‍ය නිර්මාණයේ දී නෛපාතික කෘදන්ත නිවැරදි ව භාවිත කරමින් වාක්‍ය නිර්මාණ කරයි. | **නෛපාතික කෘදන්ත** පිළිබඳව පූර්ණ අවබෝධය | 2.9 • නෛපාතික කෘදන්ත අනවසාන ක්‍රියා යනුවෙන් ද හඳුන්වන බව ප්‍රකාශ කරයි.<br>• නෛපාතික කෘදන්තවල ප්‍රභේද නම් කරයි.<br>• නෛපාතික කෘදන්ත උදාහරණ සහිත ව පැහැදිලි කරයි.<br>• නෛපාතික කෘදන්ත පිළිබඳ නිවැරදි අවබෝධයෙන් යුතු ව ලේඛනයේ යෙදෙයි. | 03 |
| | 2.10 කාරක පිළිබඳ අවබෝධයෙන් යුතුව වාක්‍ය නිර්මාණය කරයි. | කාරක පිළිබඳව සවිස්තරාත්මක අවබෝධය | 2.10 • ලේඛනයේ දී ක්‍රියා කාරක සම්බන්ධතාව පිළිබඳ දැනුම වැදගත් වන බව ප්‍රකාශ කරයි.<br>• කාරක සංකල්පය සිදත් සඟරාව ආශ්‍රයෙන් පැහැදිලි කරයි.<br>• ෂට් කාරකවල අර්ථ වෙන් වෙන් වශයෙන් නිදසුන් සහිත ව පැහැදිලි කරයි.<br>• කාරක හා ක්‍රියාව අතර ගොඩ නැගෙන සම්බන්ධතාව මත වාක්‍යයක අර්ථය පැහැදිලි වන බව පිළිගෙන ලේඛනයේ යෙදෙයි. | 02 |

# විෂය නිර්දේශය

## 5 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.11 සාමාන්‍ය, විශේෂ හා සංකීර්ණ වාක්‍ය රීතිවලට අනුකූල ව වාක්‍ය නිර්මාණය කරයි. | **සාමාන්‍ය වාක්‍ය රීති** පිළිබඳව පූර්ණ අවබෝධය | 2.11 • ''වාක්‍ය'' යනු කුමක් දැ යි පැහැදිලි කරයි.<br>• වාක්‍යයක මූලිකාංග හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• වාක්‍යයක උක්තය හා ආඛ්‍යාතය අතර සම්බන්ධය පැහැදිලි කරයි.<br>• උක්ත-ආඛ්‍යාත සම්බන්ධය මනාව ගළපමින් සරල වාක්‍ය නිර්මාණය කරයි.<br>• පුරුෂ භේදය, වචන භේදය, කාලභේදය සහ ලිංග භේදය කෙරෙහි අවධානය යොමු කරමින් වාක්‍ය නිර්මාණය කරයි. | 01 |
| | 2.12 සාමාන්‍ය, විශේෂ හා සංකීර්ණ වාක්‍ය රීතිවලට අනුකූල ව වාක්‍ය නිර්මාණය කරයි. | **විශේෂ වාක්‍ය රීති** පිළිබඳව පූර්ණ අවබෝධය | 2.12 • විශේෂ වාක්‍ය රීති යන්න නිර්වචනය කරයි.<br>• එක් එක් වාක්‍ය රීති වෙන් වශයෙන් හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• වාක්‍ය රීතිවලට අනුව විවිධ වාක්‍යවල උක්තය හා ආඛ්‍යාතය අතර පවතින ව්‍යාකරණමය සම්බන්ධතාව පැහැදිලි කරයි.<br>• වාක්‍ය රීති පිළිබඳ නිවැරදි අවබෝධයෙන් යුතුව වාක්‍ය නිර්මාණය කරයි.<br>• ලේඛනයේ දී විවිධ වාක්‍ය රීති භාවිත කරයි. | 05 |
| | 2.13 කර්මකාරක වාක්‍ය නිර්මාණය කරයි. | | 2.13 • කර්තෘකාරක හා කර්මකාරක වාක්‍යයක මූලිකාංග ඉදිරිපත් කරයි.<br>• කර්තෘකාරක වාක්‍ය හා කර්මකාරක වාක්‍ය අතර වෙනස හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• කර්තෘකාරක වාක්‍යයක් කර්මකාරක වාක්‍යයක් බවට කරයි.<br>• කර්මකාරක වාක්‍යයක් කර්තෘකාරක වාක්‍යයක් බවට කරයි.<br>• අවස්ථෝචිතව කර්මකාරක වාක්‍ය භාවිත කරමින් ලේඛනයේ යෙදෙයි. | 03 |

# විෂය නිර්දේශය

## 5 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **3.0 භාෂා ක්‍රියාකාරකම් මගින් වාංමාලාව පෝෂණය කර ගෙන භාෂා කාර්යයන්හි දී උචිත පරිදි භාවිතයට ගනියි.** | 3.1 ලේඛනයේ දී නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු ව සාම්ප්‍රදායික යෙදුම් භාෂා කාර්ය සඳහා යොදා ගනියි. | **සාම්ප්‍රදායික යෙදුම්**<br>ඉඟිවැකි, ප්‍රස්තාව පිරුළු, ආප්තෝපදේශ පිළිබඳව සවිස්තරාත්මක අවබෝධය | 3.1 • සාම්ප්‍රදායික යෙදුම් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• සාම්ප්‍රදායික යෙදුම් භාවිතයෙන් බස රසවත් ව ඉදිරිපත් කළ හැකි අයුරු විස්තර කරයි.<br>• ඉඟිවැකි, ප්‍රස්තාව පිරුළු, ආප්තෝපදේශවල වෙනස හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• භාෂා භාවිතයේ දී යුගල පද අර්ථවත්ව යොදා ගනියි.<br>• සාම්ප්‍රදායික යෙදුම් අර්ථාන්විතව භාෂා කාර්යයේ දී යොදා ගනියි. | 04 |
| | 3.2 විවිධ භාෂාවලින් සිංහල වාක්කෝෂය පෝෂණය වී ඇති බව හඳුනා ගෙන භාවිත කරයි. | **වාක් කෝෂය පෝෂණය වීම**<br>තත්භව, තත්සම, නිෂ්පන්න පද භාවිතය පිළිබඳව අවබෝධය | 3.2 • සිංහල භාෂාව නිෂ්පන්න, තද්භව හා තත්සම පදවලින් පෝෂණය වී ඇති ආකාරය පැහැදිලි කරයි.<br>• සිංහල භාෂාව පෝෂණය සඳහා පාලි, සංස්කෘත, ද්‍රවිඩ ආදි පෙරදිග භාෂා මෙන් ම ඉංග්‍රීසි, පෘතුගීසි, ලන්දේසි ආදි අපරදිග භාෂා ද බලපා ඇති බව පිළිගෙන ප්‍රකාශ කරයි.<br>• නිෂ්පන්න, තත්සම හා තද්භව වචන නිවැරදි හඳුනා ගෙන වගු ගත කරයි.<br>• අනුරූප වචන සංයෝගය පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛනයේ යෙදෙයි.<br>• වර්තමාන සිංහල භාෂාවේ ව්‍යවහාර වන නිෂ්පන්න, තද්භව, තත්සම වචන නිවැරදි ව හඳුනා ගෙන ලේඛනයේ යෙදෙයි. | 03 |

# විෂය නිර්දේශය

## 5 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 04. අදහස් නිරවුල්ව හා නිවැරැදි ව ඉදිරිපත් කරමින් ලේඛන කාර්යයෙහි යෙදේ. | 4.1 උචිත පරිදි කරුණු සංවිධානය කර ගනිමින් මාතෘකාවකට අනුකූල ව රචනා ලියයි. | රචනය<br>රචනා සිද්ධාන්ත ඇසුරෙන් විවිධාකාර රචනා | 4.1 • වාක්‍ය රචනා යනු කුමක් දැයි විස්තර කරයි.<br>• වාක්‍ය රචනා ලිවීම සඳහා සාරවත් කරුණු ගොනු කරයි.<br>• වාක්‍ය රචනා සඳහා සැකිලි සකස් කරයි.<br>• වාක්‍ය රචනා සඳහා ගොනු කළ කරුණු තර්කානුකූලව හා නිර්මාණාත්මකව ඉදිරිපත් කරයි.<br>• ශිල්පීය ප්‍රයෝග අනුගමනය කරමින් රචනාකරණයේ නියැළෙයි.<br>• ලේඛනයේ දී භාෂාව නිර්මාණාත්මක ලෙස භාවිත කරයි.<br>• සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියා ප්‍රදර්ශනය කරමින් රචනා ලියයි. | 02 |
| | 4.2 ශිල්පීය දක්ෂතා අනුගමනය කරමින් ලියයි. | වාක්‍ය නිර්මාණය<br>උක්තාඛ්‍යාත යෝගය පිළිබඳව රීති, කර්තෘකාරක, කර්මකාරක, භාවකාරක | 4.2 • විරාම ලකුණු යනු මොනවා දැ යි පැහැදිලි කරයි.<br>• නිරවුල්ව, විධිමත්ව හා නිර්මාණාත්මකව අදහස් ඉදිරිපත් කිරීම සඳහා විරාම ලක්ෂණ අත්‍යවශ්‍ය සාධකයක් බව ප්‍රකාශ කරයි.<br>• විරාම ලක්ෂණ නිවැරැදිව හඳුනා ගෙන අර්ථවත්ව භාවිත කරයි. | 01 |
| | 4.3 ලේඛන කාර්යයේ දී සංශ්ලේෂණ හැකියා ප්‍රදර්ශනය කරයි. | සාරාංශකරණය<br>සංකීර්ණ ගද්‍ය කොටස් සාරාංශකරණය | 4.3 • සාරාංශකරණය යනු කුමක් දැ යි පැහැදිලි කරයි.<br>• සාරාංශකරණයේ දී අවධානය යොමු කළ යුතු කරුණු ඉදිරිපත් කරයි.<br>• සාරාංශකරණය සඳහා දී ඇති උපදෙස් පිළිපැදිය යුතු බව පවසයි.<br>• ගද්‍ය පාඨ කියවා අදහස ග්‍රහණය කර ගෙන සාරාංශ කරයි. | 02 |

# විෂය නිර්දේශය

## 5 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 5.0 ජීවන අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි. | 5.1 නිවැරදිව හා නිර්මාණාත්මකව ලේඛන සකස් කරයි. | කතුවැකි, අත් පත්‍රිකා, පෝස්ටර්, වෙළෙඳ දැන්වීම් | 5.1 • ප්‍රායෝගික ලේඛන වර්ග හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• ප්‍රායෝගික ලේඛනයේ දී සුදුසු ආකෘති භාවිත කරයි.<br>• ලේඛනයේ ස්වරූපය අනුව භාෂාව නිර්මාණාත්මකව භාවිත කරයි.<br>• අවශ්‍යතා අනුව ප්‍රායෝගික ලේඛන සකස් කරයි.<br>• භාෂාව නිවැරුදිව භාවිත කරමින් ප්‍රායෝගික ලේඛන කාර්යයේ යෙදෙයි. | 04 |
| 06. ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත්ව යොදාගනියි. | 6.1 ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අර්ථය වටහා ගත් බව ප්‍රකාශ කරයි. | | 6.1 • ගද්‍ය-පද්‍ය පාඨ අවබෝධයෙන් යුතු ව නිශ්ශබ්දව කියවයි.<br>• ගද්‍ය පාඨ හා පද්‍ය පාඨ අවබෝධයෙන් යුතු ව ශබ්ද නගා කියවයි.<br>• අවබෝධයෙන් හා විචාරයෙන් යුතු ව ගද්‍ය හා පද්‍ය පාඨ කියවා ඒවායෙහි වාච්‍යාර්ථය, ලක්ෂ්‍යාර්ථය, ව්‍යංග්‍යාර්ථය වටහා ගත හැකි බව ප්‍රකාශ කරයි.<br>• ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අවබෝධය ප්‍රකට වන පරිදි ප්‍රශ්නවලට නිවැරැදි ව පිළිතුරු සපයයි.<br>• කියවන ඕනෑ ම ගද්‍ය හා පද්‍ය පාඨයක අර්ථ නිවැරදි ව ප්‍රකාශ කරයි. | 01 |
| | 6.2 සාහිත්‍ය නිර්මාණ කියවා රස වින්දනයේ හා විචාරයේ යෙදෙයි. | බැද්දේගම නවකතාව | 6.2 • බැද්දේගම නවකතාව අවබෝධයෙන් යුතු ව කියවයි.<br>• බැද්දේගම නවකතාවේ කතා සාරය ගොඩ නගයි.<br>• බැද්දේගම නවකතාවේ චරිත නිරූපණය කර ඇති ආකාරය පැහැදිලි කරයි.<br>•විචාර මූලධර්මවලට අනුගතව බැද්දේගම නවකතාව විචාරය කරයි.<br>• බැද්දේගම නවකතාවෙන් හෙළි වන විවිධ සමාජ සංස්කෘතික තොරතුරු ඉදිරිපත් කරයි. | 24 |

# විෂය නිර්දේශය

## 5 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **7.0 රසඥතා වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි.** | 7.1 සාහිත්‍ය විචාර මූලධර්ම ඇසුරෙන් පුරාතන ගද්‍ය නිර්මාණ රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි. | **අර්ථාවබෝධය** සංකීර්ණ ගද්‍ය ගද්‍ය කොටස්වල අර්ථාවබෝධය **කුණ්ඩලකේසී ගේ වස්තුව හා නන්ද තෙරුන්ගේ වස්තුව** | 7.1 • චිරන්තන ගද්‍ය සංග්‍රහයේ එන සද්ධර්ම රත්නාවලියේ කථා ශ්‍රැතිගෝචර ශෛලියට අනුව කියවයි.<br>• නිර්දිෂ්ට කථා ලිහිල් බසින් ඉදිරිපත් කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.<br>• නිර්දිෂ්ට කථාවල විශේෂ භාෂා ලක්ෂණ හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• නියමිත කථා වස්තු දෙකෙහි සාහිත්‍යමය අගය හඳුනා ගෙන රස විඳිමින් විචාරය කරයි.<br>• නියමිත කථා වස්තු දෙකට ආදළ ගැට පද විවරණ ලැයිස්තුවක් ලෙස සකස් කරයි. | 09 |
| | 7.1 සාහිත්‍ය විචාර මූලධර්ම ඇසුරෙන් පුරාතන ගද්‍ය නිර්මාණ රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි. | **චුල්ලසෙට්ඨී ජාතකය හා චුල්ලහංස ජාතකය** | 7.1 • චිරන්තන ගද්‍ය සංග්‍රහයේ එන ජාතක කථා ඊට ආවේණික ශෛලින්ට අනුව කියවයි.<br>• නිර්දිෂ්ට ජාතක කථා අර්ථාවබෝධයෙන් කියවයි.<br>• ජාතක කථාවල තේමාව හා අන්තර්ගතය විස්තර කරයි.<br>• ජාතක කථාවල සුවිශේෂතා හඳුනා ගෙන විස්තර කරයි.<br>• ජාතක කථාවල ආකෘතිය, භාෂා ලක්ෂණ හා රචනා රීතිය හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• නිර්දිෂ්ට ගද්‍ය පාඨ ලිහිල් බසින් ලියයි.<br>• නිර්දිෂ්ට ජාතක කථා රස විඳිමින් විචාරය කරයි.<br>• කථා වස්තුවට අදාළ අවස්ථා හා සිද්ධි පිළිබඳ අවබෝධයෙන් යුතු ව කියවයි. | 11 |

# විෂය නිර්දේශය

## 5 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 7.1 **සාහිත්‍ය විචාර මූලධර්ම ඇසුරෙන් පුරාතන ගද්‍ය නිර්මාණ රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි.** | **කුඩ්ඩරජ්ජ වස්තුව හා ධම්ම සවණෝපාසිකා වස්තුව** | 7.1 • චිරන්තන ගද්‍ය සංග්‍රහයේ එන සද්ධර්මාලංකාරයේ කථා ශ්‍රැති ගෝචර ශෛලියට අනුව කියවයි.<br>• නිර්දිෂ්ට කථා අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.<br>• නිර්දිෂ්ට කථාවල විශේෂ භාෂා ලක්ෂණ හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• නිර්දිෂ්ට කථා වස්තු දෙකෙහි සාහිත්‍යමය අගය වටහා ගෙන රස විඳිමින් විචාරය කරයි.<br>• නියමිත කථා වස්තු දෙකට අදාළ ගැට පද ලැයිස්තුවක් සකස් කරයි.<br>• සද්ධර්මාලංකාරය ධර්ම ග්‍රන්ථයක්, රසවත් සාහිත්‍ය කෘතියක් මෙන් ම ඓතිහාසික මූලාශ්‍රයක් ලෙස නිර්දිෂ්ට කථා වස්තු ඇසුරින් විමසීමට ලක් කරයි. | 08 |
| | 7.2 සාහිත්‍ය විචාර මූලධර්ම ඇසුරෙන් පුරාතන පද්‍ය නිර්මාණ රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි. | **සැළලිහිණි සන්දේශය** | 7.2 • සන්දේශ යන සංකල්පය වචනාර්ථ සහිත ව විස්තර කරයි.<br>• කෝට්ටේ සාහිත්‍ය අවධියේ සාහිත්‍ය පසුබිම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• සැළලිහිණි සන්දේශයේ පද්‍යවල අර්ථය නිවැරදි ව ප්‍රකාශ කරයි.<br>• විවිධ වර්ණනා ඇසුරෙන් සැළලිහිණි සන්දේශ කතුවරයාගේ ප්‍රතිභාපූර්ණ කවිත්වය අගය කරයි.<br>• සැළලිහිණි සන්දේශ කාව්‍යය රස විඳිමින් විචාරයට ලක් කරයි. | 28 |

# විෂය නිර්දේශය

## 5 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 7.3 නූතන පද්‍ය සාහිත්‍යයේ අවධි හා නිර්මාණකරුවන් පිළිබඳව ගවේෂණයේ යෙදෙයි. | **නූතන පද්‍ය කාව්‍ය සංහිතා** (සංස්.) සුනිල් ආරියරත්න | 7.3 • කවිය යනු කුමක් ද යි නිර්වචනය කරයි.<br>• කවිය පිළිබඳව පෙරදිග හා අපරදිග කාව්‍ය විචාරකයන්ගේ අදහස් සංක්ෂිප්තව ඉදිරිපත් කරයි.<br>• කාව්‍ය විචාර මූලධර්ම හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• නූතන පද්‍ය සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි. | 02 |
| | 7.4 සාහිත්‍ය විචාර මූලධර්ම ඇසුරෙන් නූතන පද්‍ය නිර්මාණ රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි. | **නූතන පද්‍ය කාව්‍ය සංහිතා** (සංස්.) සුනිල් ආරියරත්න | 7.4 • පද්‍ය පන්තිය සඳහා අභාසය ලද කාව්‍ය සම්ප්‍රදාය හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• පද්‍ය පන්තිය නිර්මාණය කිරීම සඳහා කවියාට පාදක වූ අත්දැකීම් හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• කාව්‍ය නිර්මාණය සඳහා යොදා ගත් කාව්‍ය උපක්‍රම පැහැදිලි කරයි.<br>• පද්‍ය පන්තිය රසාස්වාදය කරයි. | 08 |
| **8.0 අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණ කරණයේ යෙදෙයි.** | 8.1 පද්‍ය නිර්මාණය කරයි. | **විෂය සමගාමී ක්‍රියාකාරකම්** පද්‍ය නිර්මාණය කිරීම | 8.1 • පද්‍ය නිර්මාණ සඳහා සරල අත්දැකීම් පාදක කර ගත හැකි ආකාරය පැහැදිලි කරයි.<br>• අත්දැකීම් පාදක කර ගෙන රසවත් පද්‍ය නිර්මාණය කළ හැකි බව ප්‍රකාශ කරයි.<br>• කාව්‍ය නිර්මාණයේ දී භාෂාව නිර්මාණාත්මකව භාවිත කරයි.<br>• විවිධ මාතෘකා ඔස්සේ පද්‍ය නිර්මාණය කරයි. | 01 |

# විෂය නිර්දේශය

## 5 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 8.2 ස්වනිර්මාණ ආශ්‍රයෙන් නිර්මාණ සංග්‍රහයක් සකස් කරයි. | බිත්ති පුවත්පතක් නිර්මාණය කිරීම<br><br>ස්වනිර්මාණ නිර්මාණ සංග්‍රහයක් | 8.2 • නිර්මාණාත්මක ලිපියක ලක්ෂණ ඉදිරිපත් කරයි.<br>• ස්වාධීන පද්‍ය නිර්මාණයක ලක්ෂණ නම් කරයි.<br>• පාඨක ආකර්ෂණය ඇති වන පරිදි ගද්‍ය, පද්‍ය නිර්මාණ සකසන ආකාරය විස්තර කරයි<br>• භාෂාව නිවැරදි ව භාවිත කරමින් ලියයි.<br>• බිත්ති පුවත්පත් සහ සඟරා සඳහා කළ නිර්මාණ ස්වනිර්මාණ සංග්‍රහයක් වශයෙන් එළි දක්වයි. | |
| **9.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ කුසලතා ඵලදායීව යොදා ගනියි.** | 9.1 විද්‍යුත් මාධ්‍යවල විකාශය වන සාහිත්‍ය වැඩසටහන්වලට සවන් දීමේ පුරුදු භාෂා කාර්යයන් සඳහා යොදා ගනියි. | **විෂය සමගාමී ක්‍රියාකාරකම්**<br>විද්‍යුත් මාධ්‍ය වැඩසටහන් | 9.1 • භාෂා කුසලතා වර්ධනය කර ගැනීම සඳහා උචිත වැඩසටහන් නම් කරයි.<br>• විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සවන් දී අදහස් ප්‍රකාශ කරයි.<br>• භාෂාව නිවැරදි ව භාවිත කිරීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.<br>• භාෂා ව්‍යවහාරයේ දී භාෂාත්මක යෙදුම් නිර්මාණශීලීව භාවිත කරයි. | 02 |
| | 9.2 දේශන හා සාකච්ඡාවලට සවන් දීමේ පුරුද්ද මගින් විචාරශීලීව භාෂාව හැසිරවීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි. | දේශනවලට සවන් දීම | 9.2 • දේශන හා සාකච්ඡාවලට සවන් දීමේ වැදගත්කම ප්‍රකාශ කරයි.<br>• දේශන හා සාකච්ඡාවලට සක්‍රීයව දායකත්වය දැක්වීමේ හැකියාව අගය කරයි.<br>දේශන හා සාකච්ඡාවල<br>• දී විචාරශීලීව අදහස් පළ කිරීමට හැකියාව ප්‍රදර්ශනය කරයි.<br>• භාෂාව නිවැරදි හා නිර්මාණාත්මකව භාවිත කරයි. | 02 |

# විෂය නිර්දේශය

## 5 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **10.0**<br>**තම අදහස් අර්ථවත්ව හා තර්කානුකූලව ඉදිරිපත් කිරීමට අවශ්‍ය කුසලතා ප්‍රදර්ශනය කරයි.** | 10.1 තර්කානුකූල ව හා විචාරශීලීව කථනයේ යෙදෙයි. | **විෂය සමගාමී ක්‍රියාකාරකම්**<br>මාතෘකානුකූල කථනය | 10.1 • පොතපත කියවා විවාදයක් සඳහා අවශ්‍ය කරුණු රැස් කරයි.<br>• මාතෘකානුකූල ව කථනයේ යෙදෙයි.<br>• විවාදයේ දී තර්කානුකූල ව කරුණු ඉදිරිපත් කරයි.<br>• ඉදිරිපත් කරන ලද කරුණුවලට ප්‍රතිතර්ක ඉදිරිපත් කරයි.<br>• සාමූහික හැඟීමෙන් යුතු ව ක්‍රියාකාරකමෙහි නිරත වෙයි.<br>• ජය පරාජය සම සමව විඳ දරා ගත යුතු බව ප්‍රකාශ කරයි.<br>• ඕනෑ ම අවස්ථාවක දී තර්කානුකූලව විචාරශීලීව කරුණු ඉදිරිපත් කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | 02 |
| | 10.2 නිවැරදිව බස හසුරුවමින් ආකර්ෂණීය ලෙස නිවේදනයේ හා විස්තර ප්‍රචාරයේ යෙදෙයි. | විස්තර ප්‍රචාරය | 10.2 • නිවේදන හා විස්තර ප්‍රචාර සිදු කරන අවස්ථා විස්තර කරයි.<br>• නිවේදන ඉදිරිපත් කිරීමේ දී භාෂාව හසුරුවන ආකාරය විස්තර කරයි.<br>• විස්තර ප්‍රචාරවල දී අනුගමනය කළ යුතු භාෂා ශෛලිය ප්‍රකාශ කරයි.<br>• දෙනු ලබන අවස්ථා නිවේදන ලෙස ඉදිරිපත් කරයි.<br>• දෙන ලද අවස්ථාවට ගැළපෙන පරිදි විස්තර ප්‍රචාරයක් ඉදිරිපත් කරයි. | 02 |

| නිපුණතා | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **11.0 සාහිත්‍ය පරිශීලනයට අදාළ ක්‍රමවේද ගවේෂණය කරයි.** | 11.1 මූලධර්ම පරිශීලනය කරමින් ගද්‍ය පද්‍ය කොටස් විචාරයට ලක් කරයි. | **රසාස්වාදය**<br>රසාස්වාදය පිළිබඳව පූර්ණ අවබෝධය | 11.1 • කාව්‍ය විචාර මූලධර්ම භාවිත කර ගනිමින් සාහිත්‍ය කෘති රස විඳියි.<br>• සාහිත්‍ය විචාරයේ දී හා රසාස්වාදයේ දී මූලධර්ම සිද්ධාන්ත යොදා ගනියි.<br>• කාව්‍ය විචාරය පිළිබඳ කියවා ලබා ගත් දැනුම ප්‍රදර්ශනය කරයි.<br>• සාහිත්‍ය නිර්මාණ පිළිබඳ තම අදහස් ඉදිරිපත් කරයි.<br>• නිර්මාණවලින් ප්‍රකට වන සාහිත්‍යික ලක්ෂණ අගය කරයි.<br>• විවිධ සාහිත්‍ය නිර්මාණ රසාස්වාදයේ යෙදෙයි. | 04 |
| | 11.2 සිංහල සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ දැනුම පුළුල් කර ගනිමින් සාහිත්‍ය රස වින්දනයේ යෙදෙයි. | **විචාර මූලධර්ම**<br>රස, භාව, අලංකාර පිළිබඳව ප්‍රමාණවත් අවබෝධය | 11.2 • සිංහල සාහිත්‍ය අවධි පිළිවෙළින් නම් කරයි.<br>• පැරණි සාහිත්‍ය අවධිවල නිර්මාණකරණයේ යෙදුණු සාහිත්‍යකරුවන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• එම සාහිත්‍ය අවධිවල රචිත සාහිත්‍ය නිර්මාණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• එම අවධිවල ග්‍රන්ථකරණයේ නියැළුණු ග්‍රන්ථ කර්තෘවරුන් නම් කරයි.<br>• එක් එක් සාහිත්‍ය අවධිවල සුවිශේෂ ලක්ෂණ පැහැදිලි කරයි. | 02 |

**නිර්දිෂ්ට ග්‍රන්ථ**

සිංහල 5 මූලික පිරිවෙණ - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

නූතන පද්‍ය කාව්‍ය සංහිතා - මහාචාර්ය සුනිල් ආරියරත්න (සංස්කරණය)

සැළලිහිණි සන්දේශය

බැද්දේගම - ඒ. පී. ගුණරත්න (අනුවාදක)

චිරන්තන ගද්‍ය සංග්‍රහය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**ආශ්‍රේය ග්‍රන්ථ**

සිදත් සඟරාව

සාහිත්‍ය කතා - හේන්පිටගෙදර ඥාණසීහ හිමි

සිංහල සාහිත්‍ය 1,2 - හොරණ වජිරඥාණ හිමි

සිංහල රචනය හා රසාස්වාදය - පී. තේනබදු

ව්‍යාකරණ විවරණය - කුමාරතුංග මුනිදාස

සිංහල සාහිත්‍යය 1,2,3,4 - ආනන්ද කුලසූරිය

**විෂය සමගාමී ක්‍රියාකාරකම්**

සාහිත්‍ය සමිති, බිත්ති පුවත්පත් නිර්මාණය, සඟරා නිර්මාණ, සිංහල භාෂා දින සැමරුම්, ප්‍රදර්ශන, පුස්තකාලය පරිහරණය

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

# 1

# සිංහල අක්‍ෂර මාලාව

**(අක්‍ෂර වර්ගීරණය)**

**නිපුණතාව** : 1.0 අක්‍ෂර මාලාව නිරවුල් ව වටහා ගෙන නිවැරදි අක්‍ෂර වින්‍යාසය පිළිබඳ සැලකිලිමත් වෙමින් භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 1.1 අක්ෂර මාලාව සවිස්තරාත්මක ව හඳුනා ගෙන ලේඛනයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 6යි.

**ඉගෙනුම් පල** :

- නූතන සිංහල අක්‍ෂර මාලාව, සිදත් සඟරා හෝඩිය, ශුද්ධ සිංහල හෝඩිය මිශ්‍ර සිංහල හෝඩියෙන් වෙනස් වන ආකාරය පැහැදිලි කරයි.
- නූතන සිංහල අක්‍ෂර මාලාව වර්ග කර දක්වයි.
- උච්චාරණ ඉන්ද්‍රිය පද්ධතියේ ස්ථාන හා කරණ පිළිබඳ අවබෝධයෙන් යුතු ව ශබ්ද උච්චාරණය කරයි.
- 'අ'කාරයේ සංවෘත විවෘත භේදය හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- අකාරාදි පිළිවෙළට අනුව පද පෙළගස්වයි.

**පාඩම සැලසුම් සඳහා උපදෙස් :**

**පෙර සූදානම** :

- සිංහල අක්‍ෂර මාලාව සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු පිළිබඳ දැනුවත් වන්න. (මේ සඳහා ගුණාත්මක යෙදවුම්වල දක්වා ඇති ග්‍රන්ථ හා පෙළපොතේ 1 පාඩම ද පරිශීලනය කළ හැකි ය.)
  - සිදත් සඟරා අක්‍ෂර මාලාව
  - ශුද්ධ සිංහල අක්‍ෂර මාලාව
  - මිශ්‍ර සිංහල අක්‍ෂර මාලාව
  - නූතන සිංහල අක්‍ෂර මාලාව
  - සිංහල අක්ෂර මාලාවේ ක්‍රමික සංවර්ධනය
  - අක්‍ෂර මාලාව එසේ සංවර්ධනය වීමට හේතු
  - අක්‍ෂර මාලාවේ සම්මත අනුපිළිවෙළ (අකාරාදි පිළිවෙළ)
  - සිංහල අකුරු නියමිත පරිමාණයට නිවැරදි ව ලිවීම
  - අක්‍ෂර නිවැරදි ව නම් කිරීම හා උච්චාරණය කිරීම
  - උච්චාරණ ඉන්ද්‍රිය පද්ධතිය හා එහි ක්‍රියාකාරිත්වය
- අක්‍ෂර මාලාවේ බෙදීම් හා ඊට බලපා ඇති හේතු

ප්‍රවේශය    පහත සඳහන් ක්‍රම අතරින් එකක් හෝ වෙනත් සුදුසු ක්‍රමයක් භාවිත කරමින් පාඩම සඳහා ප්‍රවේශ වන්න.

- සිංහල අක්ෂර මාලාව පිළිබඳ පෙර දැනුම විමසීම
- සිංහල අක්ෂර මාලාව මතකයෙන් ලිවීමට අවස්ථාව ලබා දීම
- සිංහල අක්ෂර මාලාව ප්‍රදර්ශනය කර ඒ පිළිබඳව ශිෂ්‍ය අදහස විමසීම
- සිංහල අක්ෂර නම් කිරීමට අවස්ථාව ලබා දීම

## පාඩම සංවර්ධනය

පියවර 1

- සිංහල අක්ෂර මාලාවේ විකාසනය හා සංවර්ධනය පිළිබඳ හැඳින්වීමක් කරන්න.
- නූතන සිංහල අක්ෂර මාලාව ප්‍රදර්ශනය කරන්න.
- නූතන සිංහල අක්ෂර මාලාව, සිදත් සඟරා හෝඩිය, ශුද්ධ සිංහල හා මිශ්‍ර සිංහල අක්ෂර මාලාව සමග සසඳන්න.

පියවර 2

- සිංහල අක්ෂර මාලාව නිවැරදි ව උච්චාරණය කරමින් මතකයෙන් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- සිංහල අකුරු නිවැරදි ව නම් කිරීමේ හා ලිවීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

පියවර 3

- රූපසටහන් ආශ්‍රයෙන් උච්චාරණ ඉන්ද්‍රිය පද්ධතිය පිළිබඳ පැහැදිලි කරන්න.
- උච්චාරණ ඉන්ද්‍රිය පද්ධතියේ ස්ථාන හා කරණ පිළිබඳ අවබෝධය සඳහා ශබ්ද උච්චාරණය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
- සිංහල අක්ෂර මාලාවේ විවිධ ප්‍රභේද හා එසේ බෙදා දැක්වීමට හේතු සාකච්ඡා කරන්න.

පියවර 4

- අක්ෂර මාලාව තුළ, අක්ෂර ස්ථානගත කිරීමට බලපා ඇති හේතු සාකච්ඡා කරන්න.

පියවර 5

- අකාරාදි පිළිවෙළට පද පෙළ ගැස්වීමට අභ්‍යාස ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

* සිංහල ලේඛන රීතිය - ජාතික අධ්‍යාපන ආයතනය. 1 පිටුව (සිංහල අක්ෂර මාලාව)
* සිංහල 5 පොත (1 පාඩම)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- නූතන සිංහල අක්ෂර මාලාව, සිදත් සඟරා හෝඩිය, ශුද්ධ සිංහල අක්ෂර මාලාව මිශ්‍ර සිංහල හෝඩියෙන් වෙනස් වන ආකාරය පැහැදිලි කිරීම
- නූතන සිංහල අක්ෂර මාලාව වර්ග කර දැක්වීම

- උච්චාරණ ඉන්ද්‍රිය පද්ධතියේ ස්ථාන හා කරණ පිළිබඳ අවබෝධයෙන් යුතුව ශබ්ද උච්චාරණය කිරීම
- 'අ'කාරයේ සංවෘත විවෘත භේදය හඳුනා ගෙන ප්‍රකාශ කිරීම
- අකාරාදි පිළිවෙළට අනුව පද පෙළගැස්වීම

**පරිශීලනීය ග්‍රන්ථ**

| | | |
|---|---|---|
| සිංහල ලේඛන රීතිය | - | ජාතික අධ්‍යාපන ආයතනය |
| භාෂා අධ්‍යයන ලිපි 1 | - | විමල් ජී. බලගල්ලේ |
| ව්‍යාකරණ විවරණය | - | කුමාරතුංග මුනිදාස |
| නිවැරදි වහර | - | ගුණපාල සේනාධීර |
| සිංහල භාෂා ව්‍යාකරණය | - | ඩබ්. එස්. කරුණාතිලක |

# 2

# සිංහල අක්ෂර මාලාව

## (අකාරාදි පිළිවෙළ)

**නිපුණතාව** : 2.0 අක්ෂර මාලාව නිරවුල් ව වටහා ගෙන නිවැරදි අක්ෂර වින්‍යාසය පිළිබඳ සැලකිලිමත් වෙමින් භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 1.2 නිවැරදි අකාරාදි පිළිවෙළ අවස්ථෝචිතව භාවිත කරයි.

**කාලච්ඡේද** : 3යි.

**ඉගෙනුම් පල** :

- සිංහල අක්ෂර මාලාව අනුපිළිවෙළින් ලියයි.
- අකාරාදි පිළිවෙළ යනු කුමක් දැ යි හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- අකාරාදි පිළිවෙළට නාමාවලි සැකසීමේ වැදගත්කම ප්‍රකාශ කරයි.
- වචන ගොනු, නාමාවලි ආදිය අකාරාදි පිළිවෙළට සකස් කරයි.
- ශබ්දකෝෂ, විශ්වකෝෂ භාවිතයේ දී අකාරාදි පිළිවෙළ පිළිබඳ දැනුම උපයෝගි කර ගනියි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පෙර සූදානම

- වචන ගොනු, නාමාවලි කීපයක් සකසා ගන්න.
- ශබ්දකෝෂයක් හෝ විශ්වකෝෂ කාණ්ඩයක් සපයා ගන්න.
- අකාරාදි පිළිවෙළ පිළිබඳව මනාව අධ්‍යයනය කර දැනුම තහවුරු කර ගන්න.

ප්‍රවේශය : පහත සඳහන් ක්‍රම අතරින් එකක් හෝ වෙනත් සුදුසු ක්‍රමයක් භාවිතයෙන් පාඩම සඳහා ප්‍රවේශ වන්න.

- සිංහල අක්ෂර මාලාව පිළිබඳ ශිෂ්‍යයන්ගේ මතකය විමසා බැලීම සඳහා අහඹු ලෙස ශිෂ්‍යයන් කිහිප දෙනෙකුට අක්ෂර මාලාව මතකයෙන් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම
- ශබ්දකෝෂයක/විශ්වකෝෂයක වචන පෙළ ගස්වා ඇති ආකාරය පෙන්වා ඒ පිළිබඳ සාකච්ඡා කිරීම
- අකාරාදි පිළිවෙළ පිළිබඳ පෙර දැනුම පරීක්ෂා කිරීම

### පාඩම සංවර්ධනය

පියවර 1

- අක්ෂර මාලාව මතකයෙන් ලිවීමට අවස්ථාව ලබා දෙන්න.
- අක්ෂර අනුපිළිවෙළ පිළිබඳ අවධාරණය කරන්න.
- 'අ' සිට 'ෆ' අක්ෂරය දක්වා හෝඩියේ අක්ෂර පිළිවෙළට අනුව වචන පෙළ ගැස්වීම අකාරාදි පිළිවෙළින් සැකසීම යන්නෙන් අදහස් වන බව පෙන්වා දෙන්න.

පියවර 2

- අකාරාදි පිළිවෙළට විවිධ ලේඛන සකස් කර ඇති අවස්ථා පිළිබඳව සාකච්ඡා කරමින් පැහැදිලි කර දෙන්න.
  - විවිධ නමාවලි සැකසීම
  - ශබ්දකෝෂවල විශ්වකෝෂවල වචන පෙළ ගැස්වීම
  - ග්‍රන්ථයක අවසන් භාගයේ එන සූචිය සැකසීම
  - ග්‍රන්ථ නාමාවලි සැකසීම
  - දූරකථන නාමවලි, ඡන්ද ලැයිස්තු සැකසීම

පියවර 3

- අකාරාදි පිළිවෙළට පද පෙළ ගැස්වීමේ ප්‍රයෝජන සාකච්ඡා කරන්න. (ක්‍රමනුකූලබව, පරිහරණයේ පහසුව, අවශ්‍ය කරුණු පහසුවෙන් හඳුනා ගැනීම)
- සිංහල - සිංහල ශබ්දකෝෂ කිපයක් ශිෂ්‍යයන්ට ලබා දී වචන සෙවීමේ කණ්ඩායම් ක්‍රියාකාරකමක නිරත කරවන්න.

පියවර 4

- අපිළිවෙළට ලියූ නම් ලැයිස්තු කීපයක් කණ්ඩායම්වලට හෝ කේවල ලෙස ලබා දී ඒවා අකාරාදි පිළිවෙළට සකස් කිරීමේ ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

**මූලික වදන්/සංකල්ප**

අකාරාදි පිළිවෙළ = අක්‍ෂර මාලාවේ අනුපිළිවෙළ දැක්වීම

**ගුණාත්මක යෙදවුම්**

* ශ්‍රී සුමංගල ශබ්දකෝෂය - වැලිවිටියේ සෝරත හිමි
* ග්‍රන්ථ නාමාවලියක්
* විශ්වකෝෂ (සිංහල) කාණ්ඩයක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- අක්‍ෂර මාලාව අනුපිළිවෙළින් ලිවීම
- අකාරාදි පිළිවෙළ යනු කුමක් දැ යි පැහැදිලි කිරීම
- වචන ගොනු/නාමාවලි ආදිය අකාරාදි පිළිවෙළට සැකසීම
- ශබ්දකෝෂ, විශ්වකෝෂ පරිහරණයේ දී අකාරාදි පිළිවෙළ භාවිතයට ගැනීම

**පරිශීලනීය ග්‍රන්ථ**

| | | |
|---|---|---|
| ශ්‍රී සුමංගල ශබ්දකෝෂය | - | වැලිවිටියේ සෝරත හිමි |
| මහා සිංහල ශබ්දකෝෂය | - | හරිශ්චන්ද්‍ර විජේතුංග |
| සිංහල ශබ්දකෝෂය | - | සංස්කෘතික දෙපාර්තමේන්තුව |
| සිංහල විශ්වකෝෂය (කාණ්ඩයක්) | | |

# 3

# සිංහල අක්ෂර මාලාව

## (අක්ෂර වින්‍යාසය)

**නිපුණතාව** : 1.0 අක්ෂර මාලාව නිරවුල්ව වටහා ගෙන නිවැරදි අක්ෂර වින්‍යාසය පිළිබඳව සැලකිලිමත් වෙමින් භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 1.3 අක්ෂර මාලාව හඳුනා ගෙන නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් ලියයි.

**කාලච්ඡේද** : 1යි.

**ඉගෙනුම් පල** :

- අක්ෂර වින්‍යාසය පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලියයි.
- නිවැරදි ලේඛනය සඳහා අක්ෂර වින්‍යාසය පිළිබඳ අවශ්‍යතාව ප්‍රකාශ කරයි.
- අක්ෂර වින්‍යාසය අනුව වචනයක අර්ථ වෙනස් වන ආකාරය පැහැදිලි කරයි.
- විවිධ ලේඛනවල අක්ෂර වින්‍යාසය නිවැරදි කරයි.
- අක්ෂර වින්‍යාස රීති නිවැරදි ව භාවිත කිරීම අගය කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පෙර සූදානම :

- අක්ෂර වින්‍යාස රීති පිළිබඳ අවබෝධයක් ලබා ගන්න.
- අක්ෂර වින්‍යාසය අනුව අර්ථ වෙනස් වන වචන එක් රැස් කර ගන්න.
- අක්ෂර වින්‍යාස දෝෂ සහිත ලේඛන කීපයක් සූදානම් කර ගන්න.

ප්‍රවේශය :

- පහත සඳහන් ක්‍රම අතරින් එකක් හෝ වෙනත් සුදුසු ක්‍රමයක් භාවිත කරමින් පාඩමට ප්‍රවේශ වන්න.
  - අක්ෂර වින්‍යාසය පිළිබඳ ශිෂ්‍යයන්ගේ පෙර දැනුම පරීක්ෂා කිරීම
  - අක්ෂර වින්‍යාසය වැරදි සහිත පත්‍රිකාවක් හෝ ලේඛනයක් පෙන්වා ඒ පිළිබඳ සාකච්ඡා කිරීම
  - අක්ෂර වින්‍යාසය අනුව අර්ථය වෙනස් වන වචන කීපයක් ප්‍රදර්ශනය කිරීම හා ඒ ගැන පැහැදිලි කිරීම

උදා ：  පහන - පහණ
උරන - උරණ
දන - දණ
පතල - පතළ
කල - කළ

**පාඩම සංවර්ධනය**

පියවර 1

- සිංහල අක්ෂර මාලාවේ ඇතුළත් රූප භේදයක් ඇතත් භාෂණයේ වෙනසක් නොමැති අක්ෂර පිළිබඳ සාකච්ඡා කරන්න.

උදා ：  ණ - න
ළ - ල
ශ - ෂ
අල්පප්‍රාණ අක්ෂර - මහාප්‍රාණ අක්ෂර

පියවර 2

- අක්ෂර වින්‍යාසය නිවැරදි ව භාවිත කරන ආකාරය දෙයාකාරයකට හඳුනා ගත හැකි බව සාකච්ඡා කරන්න.
  i. සම්මත රීතියට අනුව
  ii. භාවිතයට අනුව

පියවර 3

- පෙළපොතේ 1 පාඩම ඇසුරෙන් ණ - න, ළ - ල, ශ - ෂ - ස අක්ෂර නිවැරදි ව යොදන ආකාරය පිළිබඳව අදාළ රීති ඇසුරින් පහදා දෙන්න.
- අල්පප්‍රාණ - මහාප්‍රාණ නිවැරදි ව භාවිත කරන ආකාරය පැහැදිලි කරන්න.

වචනයක් තුළ අනුනාසිකාක්ෂරයක් භාවිත වන නිවැරදි ආකාරය පෙන්වා දෙන්න.

**මූලික වදන්/සංකල්ප අක්ෂර වින්‍යාසය**

ලේඛන ව්‍යාවහාරයේ දී නිරවද්‍ය අර්ථ ප්‍රකාශනය සඳහා උපයෝගි කර ගනු ලබන අක්ෂර භාවිතයේ සම්මත ක්‍රමය

**ගුණාත්මක යෙදවුම්**

* සිංහල ලේඛන රීතිය - ජාතික අධ්‍යාපන ආයතනය
* සිංහල ලේඛන ව්‍යවහාරය. උපදේශ සංග්‍රහය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- අක්ෂර වින්‍යාසය පිළිබඳ අවබෝධයෙන් යුතුව ලිවීම
- නිවැරදි ලේඛනය සඳහා අක්ෂර වින්‍යාසය පිළිබඳ අවශ්‍යතාව ප්‍රකාශ කිරීම
- අක්ෂර වින්‍යාසය අනුව වචනයක අර්ථ වෙනස් වන ආකාරය පැහැදිලි කිරීම
- විවිධ ලේඛනවල අක්ෂර වින්‍යාසය නිවැරදි කිරීම
- අක්ෂර වින්‍යාස රීති නිවැරදි ව භාවිත කිරීම අගය කිරීම

**පරිශීලනීය ග්‍රන්ථ**


සිංහල ලේඛන රීතිය - ජාතික අධ්‍යාපන ආයතනය

සිංහල ලේඛන ව්‍යවහාරයඃ උපදේශ සංග්‍රහය, - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

සිංහල අක්ෂර වින්‍යාස අකාරාදිය - සඳගෝමි කෝපරහේවා

සමකාලීන සිංහල ලේඛන ව්‍යාකරණය - ජේ. බී. දිසානායක

# 4

# පද විභාගය

## (නාම පද)

**නිපුණතාව** : 2.0 ලේඛන කාර්යයන් ඉටු කර ගැනීමේ දී ව්‍යාකරණ රීති නිවැරදි ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 2.1 ලේඛන කාර්යයේ දී නාම පද පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද** : 2යි.

**ඉගෙනුම් පල** :

- පදයක් යනු කුමක් දැ යි නිර්වචනය කරයි.
- නාම පදය යනු කුමක් දැ යි නිර්වචනය කරයි.
- නාම පදයේ ප්‍රභේද හඳුනා ගෙන විස්තර කරයි.
- නාම පදයක ලක්ෂණ හඳුනා ගෙන විස්තර කරයි.
- ලේඛනයේ දී නාම පද නිවැරදි ව භාවිත කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පෙර සූදානම

- මෙම ක්‍රියාකාරකම පෙළපොතෙහි පද විභාගය (2) පාඩම ආශ්‍රයෙන් සිදු කළ යුතු ක්‍රියාකාරකමකි. එබැවින් පෙළපොතේ පද විභාගය පාඩමේ නාම පදයක ස්වභාවය පිළිබඳ ඉදිරිපත් කර ඇති කරුණු අධ්‍යයනය කරන්න.

ප්‍රවේශය

- සුදුසු ක්‍රමවේදයක් භාවිත කර ඇමුණුමෙහි ඇතුළත් කෙටි ඡේදය ප්‍රදර්ශනය කරන්න.
- එහි ඇති නාම පද, ක්‍රියා පද සහ අව්‍යය පද සලකුණු කරන්න.
- ඡේදය කියවීමට අවස්ථාව ලබා දී සලකුණු කර ඇති පද පිළිබඳ ශිෂ්‍යයන්ගෙන් විමසන්න.

**පාඩම සංවර්ධනය**

පියවර 1

- සලකුණු කරන ලද පද, නාම පද, ක්‍රියා පද හා අව්‍යය පද වශයෙන් වෙන් කරන්න.
- ඒ ඇසුරෙන් පද පිළිබඳ හැඳින්වීමක් කරන්න. (මේ සඳහා පෙළපොතේ පද විභාගය පාඩම උදවු කර ගන්න.)
- පෙළපොතේ අදාළ පාඩමේ ඇති ක්‍රියාකාරකම්වල ශිෂ්‍යයන් නිරත කරවන්න.

පියවර 2

- නාම පද සඳහා උදාහරණ විමසන්න.
- එම නාම පද, හුනු පුවරුවේ සටහන් කරන්න.
- එම නාම පද ආශ්‍රයෙන් නාම පද යනු කුමක් දැ යි හඳුන්වා දෙන්න.
- නාම පදයක ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන් කර ගන්නා ආකාරය පැහැදිලි කරන්න.
- නාම පදයක ලක්ෂණ ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
  - විභක්ති භේදයෙන් යුක්ත වීම
  - ලිංග භේදයෙන් යුක්ත වීම
  - වචන භේදයෙන් යුක්ත වීම
  - පුරුෂ භේදයෙන් යුක්ත වීම

පියවර 3

- නාම පදයක විවිධ ප්‍රභේද පිළිබඳ සාකච්ඡා කරන්න. එහි දී පහත සඳහන් කරුණු වෙත අවධානය යොමු කරන්න.
  - ප්‍රාණවාචී අප්‍රාණවාචී නාම පද
  - මූල නාම සහ සංග්‍රහ නාම
  - භින්න නාම සහ අභින්න නාම
  - නාම පදවල ලිංග භේදය
  - ස්ත්‍රී ලිංග පද සාධනය
  - සර්ව නාම
- ඉහත සඳහන් කරුණු එකින් එක සාකච්ඡා කළ පසු පෙළපොතේ ඊට අදාළ අභ්‍යාසවල ශිෂ්‍යයන් නිරත කරවන්න.
- අපේක්ෂිත ප්‍රාප්ති මට්ටම් කරා ළඟා නොවූ ශිෂ්‍යයෝ සිටිත් නම් අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.

**මූලික වදන්/ සංකල්ප**

**පද**

කිසියම් ශබ්ද හෝ අකුරු හෝ සමූහයක් පිළිවෙළකට අර්ථවත්ව ගැළපීමෙන් සාදා ගනු ලබන භාෂා ඒකකයකි.

**නාම පද**

කිසියම් පුද්ගලයකු, සත්ත්වයකු, ද්‍රව්‍යයක්, හැඟීමක්, සංකල්පයක් හෝ ස්ථානයක් ප්‍රකාශ කරන පද නාම පද යි.

**ගුණාත්මක යෙදවුම්**

* සිංහල භාෂා ව්‍යාකරණය - ඩබ්ලිව්. එස්. කරුණාතිලක

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- 'පද' යන්න නිර්වචනය කිරීම
- නාම පදය නිර්වචනය කිරීම
- නාම පදයේ ප්‍රභේද විස්තර කිරීම
- නාම පදයක ලක්ෂණ විස්තර කිරීම
- නාම පද නිවැරදිව භාවිත කරමින් වාක්‍ය නිර්මාණය කිරීම

**ඇමුණුම**

මිහිමත ඇති ඛනිජ සම්පත්වලට වඩා සිය දහස් ගුණයකින් වැඩි සම්පත් ප්‍රමාණයක් සාගරය තුළ ආරක්ෂා වී ඇත. අප අවට ඇති මහ සයුර මහත් ධන නිධානයකි. එහි වටිනා ඛනිජ වර්ග රාශියක් සංයෝග වී ඇත. මැග්නීසියම් ලෝහය අද වැඩිපුර ම ලැබෙන්නේ සාගර ජලයෙන් ය. ඡායාරූප කර්මාන්තයට බෙහෙවින් යොදා ගන්නා බ්‍රෝමීන් නම් මූල ද්‍රව්‍යය ද සාගර ජලයෙන් ලැබේ.

# 5

# පද විභාගය

## (නාම වරනැගීම)

**නිපුණතාව** : 2.0 ලේඛන කාර්යයන් ඉටු කර ගැනීමේ දී ව්‍යාකරණ රීති නිවැරදි ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 2.2 ලේඛනයේ දී විභක්ති පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද** : 2යි.

**ඉගෙනුම් පල** :

- "විභක්ති" යන්න නිර්වචනය කරයි.
- විභක්ති නවය පිළිවෙළින් නම් කරයි.
- වාක්‍යවල යෙදී ඇති නාම පද අයත් වන විභක්තිය නිවැරදි ව ප්‍රකාශ කරයි.
- නාම පදවල ප්‍රකෘතිය හා විභක්ති ප්‍රත්‍යය නිවැරදි ව වෙන් කරයි.
- විභක්ත්‍යන්ත නාම පද භාවිත කරමින් නිවැරදි ව වාක්‍ය නිර්මාණය කරයි.

### පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස්

**පෙර සූදානම ඃ**

- මෙම ක්‍රියාකාරකම පෙළපොතෙහි පද විභාගය (2 පාඩම) ආශ්‍රයෙන් සිදු කළ යුතු ය.
- පෙළපොතේ 2 පාඩමේ **නාම පදයක ස්වභාවය** පිළිබඳ ඉදිරිපත් කර ඇති කරුණු අධ්‍යයනය කරන්න.

**ප්‍රවේශය**

- පෙළපොතේ පද විභාගය පාඩමේ  නාම වරනැගීම් වගුව ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරවන්න.
- ඒ ආශ්‍රයෙන් විභක්ති පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

### පාඩම සංවර්ධනය

**පියවර 1**

- විභක්ති නවය නම් කරන්න.  මේ සඳහා ඇමුණුම 1 භාවිත කරන්න.
- ඒ සඳහා උදාහරණ වාක්‍ය 9ක් භාවිත කරන්න.
- භාෂාව භාවිතයේ දී විභක්ති දැන සිටීමේ අවශ්‍යතාව පැහැදිලි කරන්න.

පියවර 2

- එක් එක් විභක්තිය උදාහරණ වාක්‍ය සහිතව පැහැදිලි කරන්න. (ඇමුණුම 2 සහාය කර ගන්න.) උචිත අවස්ථාවල දී පෙළපොතේ ඇති ක්‍රියාකාරකම්වල ශිෂ්‍යයන් නිරත කරවන්න.
- ඇමුණුම 3හි සඳහන් ක්‍රියාකාරකමෙහි ශිෂ්‍යයන් නිරත කරවන්න. ප්‍රාප්ති මට්ටම් කරා ළඟා නොවූ ශිෂ්‍යයන් සඳහා අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.

පියවර 3

- විභක්ති ප්‍රත්‍ය නොගැන්වුණු (ශූන්‍ය ප්‍රත්‍ය නාම පද) ද අර්ථවත්ව වාක්‍යවල යෙදිය හැකි බව පැහැදිලි කරන්න.
- නිදසුන් සඳහා ඇමුණුම 4 භාවිත කරන්න.
  විභක්ති - 'නමින් පරවැ බෙදනු ලබනුයේ විබත් නම්' - සිදත් සඟරාව

**ගුණාත්මක යෙදවුම්**

* පෙළපොත (පද විභාගය පාඩම)

* ඇමුණුම 2 හා 3හි පිටපත් ප්‍රමාණවත් සංඛ්‍යාවක්

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- විභක්ති නිර්වචනය කිරීම
- විභක්ති නවය පිළිවෙළින් නම් කිරීම
- වාක්‍යවල යෙදී ඇති නාම පද අයත් වන විභක්තිය නිවැරදි ව ප්‍රකාශ කිරීම
- නාම පදවල ප්‍රකෘතිය හා විභක්ති ප්‍රත්‍යය නිවැරදි ව වෙන් කිරීම
- විභක්ත්‍යන්ත නාම පද භාවිත කරමින් නිවැරදි ව වාක්‍ය නිර්මාණය කිරීම

ඇමුණුම 1

පෙර කම් කතු කරණ- සපදන් අවදි සබඳ ද
අදරය අලප් යන - නව විබත් වේ දනුව පිරිසිඳ

ඇමුණුම 2

| විභක්තිය | විභක්ති අර්ථය |
|---|---|
| ප්‍රථමා | **ඕනෑ ම වාක්‍යයක අවසාන ක්‍රියාවෙන් උක්ත වන පදය යෙදෙන ආකාරය**<br>ගොවියෝ කුරුල්ලන් එළවති.<br>ගොවියන් විසින් කුරුල්ලෝ එළවෙති.<br>• වාක්‍යයේ අවසාන ක්‍රියාවට එය කරන්නේ/ කිරීමට භාජනය වන්නේ කවුද? යන ප්‍රශ්නය යොමු කළ විට පිළිතුර වශයෙන් යෙදෙන නාමපදය ප්‍රථමා විභක්තිය ගනියි. |
| කර්ම | **කර්තෘ කාරක වාක්‍යයක අවසාන ක්‍රියාවට යටත් වන පදය යෙදෙන ආකාරය**<br>ගොවියෝ කුරුල්ලන් එළවති.<br>• සකර්මක වාක්‍යයක අවසාන ක්‍රියාවට කාවද?/මොනවාද? යන ප්‍රශ්නය යොමු කළ විට පිළිතුර ලෙස ලැබෙන නාම පදය යෙදෙන්නේ කර්ම විභක්තියෙනි. |
| කර්තෘ | **කර්ම කාරක වාක්‍යයක අනුක්ත කර්තෘ කරන්නා දැක්වෙන ආකාරය; අනුක්ත පදයට විසින් නිපාතය එකතු කිරීම.**<br>ගොවියන් විසින් කුරුල්ලෝ එළවෙති. |
| කරණ | **ක්‍රියාවට උපකාර වන පදය යෙදෙන ආකාරය**<br>ගොවියා උදැල්ලෙන් කුඹුර කොටයි. |
| සම්ප්‍රදාන | **ප්‍රදානය පිළිගන්නා කෙනා හෝ දෙය හඟවන පදය යෙදෙන ආකාරය**<br>ගොවියා රටට බත සපයයි. |
| අවධි | **වෙන් වීමේ සීමාව හඟවන පදය යෙදෙන ආකාරය**<br>ගසෙන් ගෙඩි වැටෙයි. |
| සම්බන්ධ | **අයිතියක් හෝ හිමිකමක් හෝ හඟවන පදය යෙදෙන ආකාරය**<br>ගොවීන්ගේ අයිතිවාසිකම් සුරකිමු. |
| ආධාර | **කර්තෘගේ ක්‍රියාව, ක්‍රියාවට උපකාර වන කෙනා, දෙය හෝ ස්ථානය දරාසිටීමේ අර්ථය හඟවන පදය යෙදෙන ආකාරය**<br>ගොවියා කුඹුරේ වැඩ කරයි. |
| ආලපන | **ආමන්ත්‍රණාර්ථය හඟවන පදය යෙදෙන ආකාරය**<br>ගොවියනි, බුහුමන ඔබට යි. |

ඇමුණුම 3

- පහත සඳහන් වාක්‍යය කියවන්න.
- ඉරි ඇඳි පද අයත් වන විභක්තිය වගුවෙහි සඳහන් කරන්න.

ගොවියා උදෙන් ම අවදි වී සිය බිරිඳ විසින් සදා දුන් බත් පත ද රැගෙන නිවසින් මිදුලට බැස උදැල්ල කරෙහි තබා ගෙන පාපැදියෙන් කුඹුරට ගොස් නියර පිට ඉඳගෙන පුතේ ඉක්මනින් ගෙදර යන්න යැයි තම පුතාට කීවේ ය.

| පදය | විභක්ති නාමය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

ඇමුණුම 4

- ශුන්‍ය ප්‍රත්‍ය නාම පද

ගියේ බෝසත් තමාගේ ගෙට - ගුත්තිලය

උපන් බව තම පුත් - කාව්‍යශේඛරය

# 6

# පද විභාගය

## (අව්‍යය පද)

**නිපුණතාව** : 2.0 ලේඛන කාර්යයන් ඉටු කර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 2.3 ලේඛනයේ දී අව්‍යය පද පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද** : 1යි.

**ඉගෙනුම් පල ඃ**

- අව්‍යපද යන්න නිවැරදි ව අර්ථ කථනය කරයි.
- අව්‍යපද වර්ග දෙකක් ඇති බව හඳුනා ගෙන නිවැරදි ව නම් කරයි
- යෙදීම අනුව නිපාත පද වර්ග කළ හැකි ආකාරය පෙන්වා දෙයි.
- අවබෝධයෙන් යුතු ව උපසර්ග භාවිත කරයි.
- ලේඛන කාර්යයේ දී අව්‍ය පද නිවැරදි ව භාවිත කරයි.

### පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස්


**පෙර සූදානම**

- මෙම ක්‍රියාකාරකම පෙළපොතෙහි පද විභාගය පාඩම (2 පාඩම) ආශ්‍රයෙන් සිදු කළ යුතු ක්‍රියාකාරකමකි.
- එබැවින් පෙළපොතේ පද විභාගය (2 පාඩමේ) අව්‍යය පද පිළිබඳ ඉදිරිපත් කර ඇති විෂය කරුණු අධ්‍යයනය කරන්න.

**ප්‍රවේශය**

- පහත සඳහන් වාක්‍යය හෝ වෙනත් එවැනි වාක්‍යයක් හෝ පන්තියේ ප්‍රදර්ශනය කරන්න.

  * ඇඳුම්වල අවපැහැය නැති කර ගැනීම **සඳහා** සේදුම් කුඩු භාවිත කරන්න.
- ඒ ඇසුරින් අව්‍යය පද පිළිබඳ හැඳින්වීමක් කරන්න. අව්‍යය පද වර්ග 2ක් ඇති බවත් ඒවා, **නිපාත** සහ **උපසර්ග** වශයෙන් වර්ග වන බවත් පැහැදිලි කරන්න.
- අව්‍යය පද එම නමින් හැඳින්වීමට හේතුව ද පැහැදිලි කරන්න.



## පාඩම සංවර්ධනය

**පියවර 1**

- නිපාත පද, වාක්‍යවල මුල, මැද සහ අග යන ස්ථානවල යෙදෙන අවස්ථා උදාහරණ ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න.
- නිපාත පද යනු මොනවා ද යි හඳුන්වා දෙන්න.
- නිපාත පද අර්ථ අනුව බෙදා දක්වන්න.
- ඒවා විවිධ අර්ථවල යෙදෙන බව උදාහරණ ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.
- පෙළපොතේ පද විභාගය පාඩමේ ක්‍රියාකාරකම් අංක 22 හා 23හි ශිෂ්‍යයන් නිරත කරවන්න.

**පියවර 2**

- උපසර්ග පිළිබඳ හැඳින්වීමක් කරන්න.
- උපසර්ග, පදවල මුලට පමණක් යෙදී විවිධ අර්ථ ප්‍රකාශ කරන බව පැහැදිලි කරන්න.
- සිදත් සඟරාවේ ඇති උපසර්ග 20ත් වර්තමානයේ භාවිත වන උපසර්ගත් උදාහරණ ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.
- පෙළපොතෙහි 24 ක්‍රියාකාරකමෙහි ශිෂ්‍යයන් නිරත කරවන්න.

## මූලික වදන්/සංකල්ප

අව්‍යය පද

ව්‍යය නොවනුයේ අව්‍යය යන අදහසින් වෙනස් නො වන හෙවත් වර නො නැගෙන පද අව්‍යය පද වශයෙන් හැඳින්වේ.

## ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :

- 'අව්‍යය පද' යන්න නිර්වචනය කිරීම
- අව්‍යය පද වර්ග දෙකක් ඇති බව ප්‍රකාශ කිරීම
- යෙදීම අනුව නිපාත පද වර්ග කළ හැකි බව පෙන්වා දීම
- අවබෝධයෙන් යුතු ව උපසර්ග භාවිත කිරීම
- ලේඛන කාර්යයේ දී අව්‍යය පද නිවැරදි ව භාවිත කිරීම

# 7

# සන්ධි

**නිපුණතාව** : 2.0 ලේඛන කාර්යයන් ඉටු කර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 2.4 ලේඛනයේ දී සන්ධි පද පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද** : 5යි.

**ඉගෙනුම් පල** :

- සන්ධි යනු කුමක් දැ යි හඳුනා ගෙන නිර්වචනය කරයි.
- සන්ධි කාර්යයන් විස්තර කරයි.
- ව්‍යවහාර සන්ධි විස්තර කරයි.
- විසන්ධි පදවල කොටස් නම් කරයි.
- පද සන්ධි කර වචන සකස් කරයි.
- සන්ධි පද විසන්ධි කර දක්වයි.
- වාක්‍ය නිර්මාණයේ දී පද නිවැරදි ව සන්ධි කර ලියයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පෙර සූදානම

- සන්ධි පාඩම ඉගැන්වීම සඳහා නියමිත කාලච්ඡේද පහත සඳහන් පරිදි සැලසුම් කර ගන්න.
- පළමුවන කාලච්ඡේදය සන්ධි හැඳින්වීම සඳහා යොදා ගන්න.
- දෙවන කාලච්ඡේදය සන්ධි කාර්යය පැහැදිලි කිරීම සඳහා වෙන් කර ගන්න.
- තුන්වන කාලච්ඡේදය පූර්ව ස්වර ලෝප සන්ධිය, ස්වරාදේශ සන්ධිය සහ ස්වර සන්ධිය විස්තර කිරීම සඳහා යොදා ගන්න.
- හතරවන කාලච්ඡේදය ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය, පූර්ව රූප සන්ධිය, පර රූප සන්ධිය සහ ගාත්‍රාදේශ සන්ධිය පැහැදිලි කිරීම සඳහා යොදා ගන්න.
- පස්වන කාලච්ඡේදය ආගම සන්ධිය, ද්විත්ව රූප සන්ධිය, මිශ්‍ර සිංහල සන්ධි ක්‍රම දෙක පැහැදිලි කිරීම සඳහා යොදා ගන්න.
- මෙම ක්‍රියාකාරකම පෙළපොතෙහි සන්ධි පාඩම (3 පාඩම) ආශ්‍රයෙන් සිදු කළ යුතු ක්‍රියාකාරකමකි. එබැවින් පෙළපොතේ සන්ධි (3 පාඩම) අධ්‍යයනය කරන්න.

ප්‍රවේශය

- "මහා <u>මාර්ගාසන්නයේ</u> ඇති <u>ප්‍රේක්ෂකාගාරය</u> නරඹන්නන්ගෙන් පිරී ඉතිරී ගියේය." වැනි වාක්‍යයක් ප්‍රදර්ශනය කරන්න.
- මාර්ගාසන්නයේ, ප්‍රේක්ෂකාගාරය යන වචන විසන්ධි කර පෙන්වන්න.

- එම වචන සන්ධි කිරීම මගින් භාෂාව සුසිනිඳු වන බවත් ව්‍යක්ත වන බවත් පැහැදිලි කරන්න.
- එම නිසා භාෂා භාවිතයේ දී පද සන්ධි කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරන්න.

  - සුබෝච්චාරණය
  - ලේඛන පහසුව
  - පද්‍යකරණයේ දී අවශ්‍ය මාත්‍රා ගණන ගළපා ගැනීම
  - භාෂාව රසවත් වීම
  - භාෂාවේ ව්‍යක්තභාවයක් ඇති වීම

## පාඩම සංවර්ධනය

**පියවර 1**

- සන්ධි පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (මේ සඳහා පෙළපොතේ ඇති සන්ධි පිළිබඳ හැඳින්වීම භාවිත කරන්න.)
- සිදත් සඟරාවේ හා සාරස්වතයේ සන්ධි පිළිබඳව සඳහන් නිර්වචන ඉදිරිපත් කරන්න.
- අභ්‍යන්තර සන්ධි හා බාහිර සන්ධි පැහැදිලි කරන්න.

**පියවර 2**

- සන්ධි කාර්යයන් උදාහරණ සහිතව විස්තර කරන්න.

| | | |
|---|---|---|
| ලෝපය | - | ආදේශය |
| ආගමය | - | පූර්ව රූපය |
| පර රූපය | - | ද්විත්ව රූපය |
| වෘද්ධිය | - | හානිය |
| ආරෝහණය | - | පෙරළි |

- 3 පාඩමෙහි 1 ක්‍රියාකාරකමෙහි ශිෂ්‍යයන් නිරත කරවන්න.

**පියවර 3**

- සාම්ප්‍රදායික සන්ධි 10 නිදසුන් සහිතව පැහැදිලි කරන්න.
- සුදුසු පරිදි ශිෂ්‍යයන් කණ්ඩායම් කරන්න.
- එම සන්ධි 10 නිදසුන් ද සහිතව චිත්ත සිතියමක නිරූපණය කිරීමට එක් එක් කණ්ඩායමට අවස්ථාව දෙන්න.
- කණ්ඩායම් ඉදිරිපත් කිරීමකට අවස්ථාව සලසා දෙන්න.
- ඉදිරිපත් කිරීම් පිළිබඳව සමාලෝචනයක නිරත වන්න.

**පියවර 4**

1. අර්ධ ස්වරාදේශ සන්ධිය හා
2. සමාන ස්වර දීර්ඝ සන්ධිය යන සන්ධි ප්‍රභේද දෙක හඳුන්වා දෙන්න.

- එක් එක් සන්ධි උදාහරණ සහිතව පැහැදිලි කරන්න.
- ඇමුණුම 1හි සඳහන් ක්‍රියාකාරකමෙහි ශිෂ්‍යයන් නිරත කරවන්න.

**මූලික වදන්/සංකල්ප**

**සන්ධි**

''පෙර'පර වණන් නිසි විදිනි ගළපනු සඳ නම්'' - සිදත් සඟරාව

පූර්වාපර වර්ණයෝඃ සන්ධානාම් සන්ධිඃ - සාරස්වත ව්‍යාකරණය

**ගුණාත්මක යෙදවුම්**

* පෙළපොත (සන්ධි පාඩම)
* ඇමුණුම 1හි පිටපත් ප්‍රමාණවත් සංඛ්‍යාවක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- සන්ධි යනු කුමක් දැ යි හඳුනා ගෙන නිර්වචනය කිරීම
- සන්ධි කාර්යයන් විස්තර කිරීම
- ව්‍යවහාර සන්ධි විස්තර කිරීම
- විසන්ධි පදවල කොටස් නම් කිරීම
- පද සන්ධි කර වචන සකස් කිරීම
- සන්ධි පද විසන්ධි කර දැක්වීම
- පද නිවැරදි ව සන්ධි කරමින් ලේඛනයේ යෙදීම

ඇමුණුම 1

**ශිෂ්‍ය කාර්ය පත්‍රිකාව**

පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| පදය | විසන්ධිය | සන්ධි ප්‍රභේදය |
|---|---|---|
| නළඟන | | පූර්ව ස්වර ලෝප සන්ධිය |
| | වම්+අත | |
| සූර්යෝදය | | |
| | පස්+සිල් | |
| ගම්පොළ | | |
| ගෙවුයන | | |
| | පුන+උත්පත්තිය | |
| පුස්තකාලය | | |
| | ප්‍රති+උපකාර | |
| | පුර+අඟන | |
| භක්ත්‍යාදර | | |

# 8

# සමාස

**නිපුණතාව** : 2.0 ලේඛන කාර්යයන් ඉටු කර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 2.5 ලේඛන කාර්යයේ දී සමාස පද පිළිබඳ අවබෝධය ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද** : 3යි.

**ඉගෙනුම් පල**

- සමාස යනු කුමක් දැ යි හඳුනා ගෙන නිර්වචනය කරයි.
- සමාසවලින් භාෂාවට ඇති ප්‍රයෝජන හඳුනා ගෙන විස්තර කරයි.
- සමාස වර්ග කර දක්වයි.
- යුක්තාර්ථවත් පද සමූහ සමාස කර දක්වයි.
- වාක්‍ය නිර්මාණයේ දී සමාස පද නිවැරදි ව යොදා ගනියි.

## පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස්

**පෙර සූදානම**

- මෙම ක්‍රියාකාරකම පෙළපොතෙහි සමාස පාඩම (4 පාඩම) ආශ්‍රයෙන් සිදු කළ යුතු ක්‍රියාකාරකමකි. එබැවින් පෙළපොතේ සමාස පාඩම අධ්‍යයනය කරන්න.

**ප්‍රවේශය**

- "ක්‍රීඩකයෝ ද ක්‍රීඩිකාවෝ ද ක්‍රීඩාපිටියේ විවිධ දස්කම් දැක්වූහ." "ක්‍රීඩක ක්‍රීඩිකාවෝ ක්‍රීඩාපිටියේ විවිධ දස්කම් දැක්වූහ." යන හෝ වෙනත් එවැනි වාක්‍යයක් ප්‍රදර්ශනය කරන්න.
- 'ද' කාරය ඉවත් වී පද කෙටි වී ඇති ආකාරය ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- පද කෙටි කිරීම සමාස වශයෙන් හැඳින්විය හැකි බව පැහැදිලි කරන්න.

## පාඩම සංවර්ධනය

පියවර 1

- සමාස යනුවෙන් හැඳින්වෙන පද වර්ගයේ ස්වභාවය විස්තර කරන්න.
- සමාස පිළිබඳ සිදත් සඟරාවේ සඳහන් නිර්වචනය ඉදිරිපත් කරන්න.
- සමාසවලින් භාෂාවට ඇති ප්‍රයෝජන පැහැදිලි කර දෙන්න.

පියවර 2

- සමාස ප්‍රභේද උදාහරණ සහිතව විස්තර කරන්න.
    - අව්‍යය සමාසය
    - විභක්ති සමාසය
    - විශේෂණ සමාසය
    - අන්‍යාර්ථ සමාසය
    - 'ද'කාරාර්ථ සමාසය
- 4 පාඩමෙහි ක්‍රියාකාරකම්වල ශිෂ්‍යයන් නිරත කරවන්න.

පියවර 3

- සුදුසු පරිදි ශිෂ්‍යයන් කණ්ඩායම් කරන්න.
- සමාස ප්‍රභේද නිදසුන් වාක්‍ය ද සහිතව පෝස්ටරයක නිරූපණය කිරීමට එක් එක් කණ්ඩායමට අවස්ථාව දෙන්න.
- කණ්ඩායම් ඉදිරිපත් කිරීමකට අවස්ථාව සලසා දෙන්න.
- ඉදිරිපත් කිරීම් පිළිබඳව සමාලෝචනයක නිරත වන්න.

**මූලික වදන්/සංකල්ප**

සමාස

කියොලත එක අරුත - සබඳ වැ සදන් නනරුත්
එ වියූ සමස් විදි නම් - එහි බේ දැන් පවස්මෝ

- **සිදත් සඟරාව**

**ගුණාත්මක යෙදවුම්**

* පොළපොතේ සමාස පාඩම (4)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- සමාස නිර්වචනය කිරීම
- සමාසවල ප්‍රයෝජන විස්තර කිරීම
- නිදසුන් සහිතව සමාස ප්‍රභේද විස්තර කිරීම
- සමාස පද භාවිත කර වාක්‍ය නිර්මාණය කිරීම

# 9

# ආඛ්‍යාත පද

## (අවසාන ක්‍රියා)

**නිපුණතාව** : 2.0 ලේඛන කාර්යයන් ඉටු කර ගැනීමේ දී ව්‍යාකරණ රීති නිවැරදි ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 2.6 වාක්‍ය සැකසීමේ දී ආඛ්‍යාතය නිවැරදි ව භාවිත කරයි.

**කාලච්ඡේද ගණන** : 3යි.

**ඉගෙනුම් පල**

- ආඛ්‍යාත පද යනු කුමක් දැ යි හඳුනා ගෙන නිර්වචනය කරයි.
- ආඛ්‍යාත පදයකින් වාක්‍යයට ඇති ප්‍රයෝජන හඳුනා ගෙන විස්තර කරයි.
- වාක්‍යයක් සම්පූර්ණ වීමට ආඛ්‍යාත පදයක් අවශ්‍ය බව ප්‍රකාශ කරයි.
- නිවැරදි ව ආඛ්‍යාත පද භාවිත කර වාක්‍ය නිර්මාණය කරයි.

## පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස්

**පෙර සූදානම**

- මෙම ක්‍රියාකාරකම පෙළපොතෙහි ආඛ්‍යාත පද (5 පාඩම) ආශ්‍රයෙන් සිදු කළ යුතු ක්‍රියාකාරකමකි. එබැවින් පෙළපොතේ 5 පාඩම අධ්‍යයනය කරන්න.


**ප්‍රවේශය**

- පෙළපොතේ ආඛ්‍යාත පද (5 පාඩමෙහි) සඳහන් සංවාදයේ මුල් කොටස ශිෂ්‍යයන් දෙදෙනෙකු ලවා කියවන්න.
- ඒ ඇසුරෙන් ආඛ්‍යාත පදයක ස්වභාවය පිළිබඳ ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- වාක්‍ය ලිවීමේ දී ක්‍රියා පද නිවරදි ව යෙදීමේ අවශ්‍යතාව පැහැදිලි කරන්න.

## පාඩම සංවර්ධනය

**පියවර 1**

- පහත දැක්වෙන සටහන ආශ්‍රයෙන් අවසාන ක්‍රියා පද වර්ග හඳුන්වා දෙන්න.




- එක් එක් ආඛ්‍යාත පද වර්ගය පිළිබඳ පැහැදිලි කර දෙන්න.

**පියවර 2**

- පෙළපොතේ ආඛ්‍යාත පද (5 පාඩමෙහි) ක්‍රියාකාරකම්වල ශිෂ්‍යයන් නිරත කරවන්න.

**ගුණාත්මක යෙදවුම්**

* පෙළපොතේ ආඛ්‍යාත පාඩම

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- ආඛ්‍යාත පද නිර්වචනය කිරීම
- ආඛ්‍යාත පද වර්ගකර දැක්වීම
- ආඛ්‍යාත පද නිවැරදි ව යොදා වාක්‍ය ලිවීම
- වාක්‍යයක් සම්පූර්ණ වීමට ආඛ්‍යාත පදයක් අවශ්‍ය බව ප්‍රකාශ කිරීම
- ලේඛනයේ දී ආඛ්‍යාතය නිවැරදි ව යෙදීම

# 10

# බැද්දේගම නවකතාව

**නිපුණතාව** : 6.0 ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 6.2 සාහිත්‍ය නිර්මාණ කියවා රස වින්දනයේ හා විචාරයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 24යි.

**ඉගෙනුම් පල** :

- බැද්දේගම නවකතාව අවබෝධයෙන් යුතු ව කියවයි.
- බැද්දේගම නවකතාවේ කතා සාරය ගොඩනගයි.
- බැද්දේගම නවකතාවේ චරිත නිරූපණය කර ඇති ආකාරය පැහැදිලි කරයි.
- නවකතා විචාර මූලධර්මවලට අනුගතව බැද්දේගම නවකතාව විචාරය කරයි.
- බැද්දේගම නවකතාවෙන් හෙළි වන විවිධ සමාජ සංස්කෘතික තොරතුරු ඉදිරිපත් කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පෙර සූදානම

- බැද්දේගම නවකතාව සහ සමකාලීන තවත් නවකතා කිහිපයක් සපයා ගන්න. වාර තුනට සුදුසු පරිදි සූදානම් වන්න.
  - * **පළමුවනන වාරය** - නවකතාව හැඳින්වීමේ සිට බැද්දේගම නවකතාවේ 5 පරිච්ඡේදයේ අවසානය තෙක් කාලච්ඡේද 10යි.
  - * **දෙවන වාරය** - බැද්දේගම නවකතාවේ 6-7 පරිච්ඡේද, කාලච්ඡේද 7යි.
  - * **තෙවන වාරය** - බැද්දේගම නවකතාවේ 8,9,10 පරිච්ඡේද, කාලච්ඡේද 7යි.

ප්‍රවේශය

- ඔබ සපයා ගත් නවකතා කිහිපය ශිෂ්‍යයන් අතට පත් කරන්න. ඒවායේ නම, කතුවරයා සහ ලියවුණු කාලය සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- ඒ ඇසුරෙන් නවකතාවක් පිළිබඳව දැන ගත යුතු මූලික තොරතුරු පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

## පාඩම සංවර්ධනය

පියවර 1

- සිංහල නවකතාවේ පසුබිම ගැන කෙටි හැඳින්වීමක් සපයන්න.
- සිංහල නවකතා වංසය තුළ බැද්දේගම නවකතාවට හිමි තැන පිළිබඳව පැහැදිලි කරන්න.
- පරිවර්තන නවකතාවක් ලෙස බැද්දේගම නවකතාව අගය කරන්න.

පියවර 2

- ශිෂ්‍යයන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- බැද්දේගම නවකතාවෙහි පරිච්ඡේද 10හි සාරාංශය ගොඩනැගීමට ශිෂ්‍ය කණ්ඩායම් යොමු කරන්න.
- එම පරිච්ඡේද සාරාංශ ආශ්‍රයෙන් කතා සාරය ගොඩනගන්න.
- බැද්දේගම නවකතාවෙන් හෙළි වන සංස්කෘතිකාංග හඳුනා ගැනීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

පියවර 3

- බැද්දේගම නවකතාවෙහි තේමාව ශිෂ්‍යයන්ට පැහැදිලි කරන්න. (ඇමුණුම 1)
- චරිත නිරූපණය පිළිබඳ ශිෂ්‍යයන්ට පැහැදිලි කරන්න.
- බැද්දේගම නවකතාව පිළිබඳ විචාරයක යෙදෙන්න.

පියවර 4

- ශිෂ්‍යයන් සුදුසු පරිදි කණ්ඩායම් හතරකට වෙන් කරන්න.
- බැද්දේගම නවකතාවේ සුවිශේෂතා චිත්ත සිතියමක නිරූපණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ශිෂ්‍ය ඉදිරිපත් කිරීම්වලට අවස්ථාව සලසා දෙන්න.
- ඉදිරිපත් කිරීම් ආශ්‍රයෙන් සමාලෝචනයක නිරත වන්න.

**මූලික වදන්/සංකල්ප**

නවකතාව - කල්පිත චරිත සහ සිද්ධිවලින් යුක්ත අංග සම්පූර්ණ කතාවකින් යුක්ත ග්‍රන්ථයක් (ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂය)

**ගුණාත්මක යෙදවුම්**

* බැද්දේගම නවකතාව, සමකාලීන වෙනත් නවකතා කිහිපයක්
* ඇමුණුම 1හි පිටපත් ප්‍රමාණවත් සංඛ්‍යාවක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- බැද්දේගම නවකතාව අවබෝධයෙන් යුතු ව කියවීම
- බැද්දේගම නවකතාවේ කතා සාරය ගොඩනැගීම
- බැද්දේගම නවකතාවේ චරිත නිරූපණය කර ඇති ආකාරය පැහැදිලි කිරීම
- නවකතා විචාර මූලධර්මවලට අනුගතව බැද්දේගම නවකතාව විචාරය කිරීම
- බැද්දේගම නවකතාවෙන් හෙළි වන විවිධ සමාජීය හා සංස්කෘතික තොරතුරු ඉදිරිපත් කිරීම

ඇමුණුම 1

**බැද්දේගම**

**මූලික තොරතුරු**

මුල් කෘතිය - Village in the jungle

කර්තෘ - ලෙනාඩ් වුල්ෆ්

පරිවර්තනය - බැද්දේගම

පරිවර්තක/අනුවාදක - ඒ. පී. ගුණරත්න

පරිච්ඡේද ගණන - 10

- නවකතාව යනු කතුවරයා විසින් නිර්මාණය කරන ලද්දක් වන හෙයින් නවතම වස්තුවක් වන අතර පාඨකයා කාල්පනික ලෝකයට ගෙන යන සෑහෙන තරම් දිග ග්‍රන්ථාරූඪ කරන ලද ගද්‍යමය ආඛ්‍යානයකි. **(ජී. ලූක්ස්)**
- යටත්විජිතවාදී පාලන තන්ත්‍රය යටතේ ශ්‍රී ලාංකීය නොදියුණු ගැමි ජන සමාජය හා බැඳී පැවතුණු සත්‍යය හෙළි කරන නවකතාවකි. ලෙනාඩ් වුල්ෆ් ශ්‍රී ලාංකීය ජන සමාජය ආශ්‍රයෙන් ලත් අත්දැකීම් යථාර්ථවාදී ලෙස ඉදිරිපත් කිරීමට උත්සාහ දරා ඇත. පරිවර්තන කාර්යයේ දී ද ඒ. පී. ගුණරත්න මහතා එම ගුණය රකියි.

  "නූගත් සාම්ප්‍රදායික ගැමි ජනතාව ඔවුන් පාලනය කිරීම සඳහා ඉදිරිපත් වන මුලාදෑනි පැලැන්තිය හා ගැමියන් උපයන සියල්ල සූරා කෑමට නගරයෙන් ගමට පැමිණෙන වෙළෙඳ බලවේගය අතර ඇති කෙරෙන ජීවන අරගලය මෙන් ම මෙකී පසුබිම නිසා ඇති වන ගැටලුකාරී තත්ත්ව විසඳීමට ඉදිරිපත් වන යටත්විජිත පාලන තන්ත්‍රයට රුකුල් දෙන නිලධාරීන් යන අංශ අතර ඇති වන විසංයෝගය සහ ප්‍රතිවිරෝධය නවකතාකරුවා අපූර්වත්වයකින් යුතුව ප්‍රතිනිර්මාණය කොට ඇත."

**ප්‍රධාන චරිත** සිලිඳු, කර්ලිනාහාමි, පුංචිමැණිකා, බබෙහාමි, ආරච්චිල, බබුන්, හින්නිහාමි, පුංචිරාල, ප්‍රනාන්දු චරිත ප්‍රවර්ග කීපයකි.

- ගමේ ජීවත් වන විවිධ දුර්වලකම්, අන්ධ විශ්වාස සහ දැඩි ආත්මාර්ථය, පරාර්ථය, සත්භාවය, අවංකත්වය ආදියෙන් සමන්විත ගැමි ජීවිත
- ඔවුන්ගේ දුර්වලකම්වලින් ප්‍රයෝජන ගන්නා එම පන්තියේ ම ගැමියන්, අධිරාජ්‍යවාදී පාලන ඒකකයේ විවිධ ස්ථර නගරයේ විවිධ වාණිජ බලවේග, නවකතාව ඉදිරිපත් කිරීම සඳහා ප්‍රථම පුරුෂ දෘෂ්ටිකෝණය භාවිත කරයි.
- හේතුඵල සම්බන්ධතාවකින් යුක්තව කතාව විකාසනය වෙයි.
- අවස්ථා හා සිද්ධි නිරූපණය ප්‍රබල ලෙස නිරූපණය කරයි.

**භාෂාව**

- අවස්ථා නිරූපණයට උචිත පරිදි භාෂාව හැසිරවීම
- අදහස් දැක්වීමේ දී යථාර්ථවාදී වීම
- සංකේතාත්මකව භාෂාව යොදා ගැනීම
- උපමාර්ථවත් භාෂාව
- අවස්ථානුකූල ව ධ්වනිතාර්ථවත් භාෂාව
- ගැමි බස් වහරින් පෝෂිත වීම
- කෙටි වැකි සහිත සංවාදාත්මක භාෂාව
- චරිතානුකූල භාෂාව

# 11
# සැළලිහිණි සන්දේශය

**නිපුණතාව** : 07 රසඥතා වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම** : 7.2 සාහිත්‍ය විචාර මූලධර්ම ඇසුරෙන් පුරාතන පද්‍ය නිර්මාණ රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි.

**කාලච්ඡේද ගණන** : 28යි.

**ඉගෙනුම් පල** :

- සන්දේශ යන සංකල්පය වචනාර්ථ සහිතව විස්තර කරයි.
- කෝට්ටේ සාහිත්‍ය අවධියේ සාහිත්‍ය පසුබිම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- සැළලිහිණි සන්දේශයේ පද්‍යවල අර්ථය නිවැරදි ව ප්‍රකාශ කරයි
- විවිධ වර්ණනා ඇසුරෙන් සැළලිහිණි සන්දේශ කතුවරයාගේ ප්‍රතිභා පූර්ණ කවිත්වය අගය කරයි.
- සැළලිහිණි සන්දේශ කාව්‍යය රසවිඳිමින් විචාරයට ලක් කරයි.

### පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස්

**පෙර සූදානම**

- මුල් කාලච්ඡේද දෙක සන්දේශ කාව්‍යය හැඳින්වීමට සහ සාහිත්‍ය පසුබිම ඉදිරිපත් කිරීමට යොදා ගන්න. එහි දී 'සන්දේශ' යන සංකල්පය පැහැදිලි කිරීමට සූදානම් වන්න.
- සන්දේශ ප්‍රභවය හා විකාසනය පිළිබඳව කරුණු සම්පාදනය කරගන්න.
- සැළලිහිණි සන්දේශයේ පද්‍යවල අර්ථය හා සාහිත්‍යික අගය පැහැදිලි කර ගන්න.
- වාර තුනට සුදුසු පරිදි සූදානම් වන්න.
  - **පළමුවන වාරය** - සංදේශ සාහිත්‍යයේ ඉතිහාසයේ සිට 36 කවිය තෙක් කාලච්ඡේද 10යි.
  - **දෙවන වාරය** - 37 සිට 71 කවිය තෙක් කාලච්ඡේද 9යි.
  - **තෙවන වාරය** - 72 සිට 108 කවිය තෙක් කාලච්ඡේද 9යි.

**ප්‍රවේශය**

- "එන්න මඳ නලේ ගොස් පවසන්න දුක මගේ
  යන්නට හැකි ඔබට පමණි සිරගෙයට ඈගේ'' යන ගීතය හෝ ගීතයෙන් කොටසක් හෝ සුදුසු ක්‍රමවේදයක් යොදා ගෙන ශිෂ්‍යයන්ට සවන් දීමට සලස්වන්න.
- මෙම ගීතයට සන්දේශ සංකල්පය පාදක වී ඇති බව පහදා දෙන්න.
- මේඝදූතය ආශ්‍රයෙන් සන්දේශ කාව්‍ය ප්‍රභවය වූ බවත් ඒ අනුසාරයෙන් සිංහල සන්දේශ කාව්‍ය නිර්මාණය වී ඇති බවත් පෙන්වා දෙමින් පාඩමට ප්‍රවේශ වන්න.

## පාඩම සංවර්ධනය

පියවර 1

- සන්දේශ කාව්‍යය යන සංකල්පය පැහැදිලි කරන්න.
- කෝට්ටේ අවධියට අයත් සන්දේශ සාහිත්‍ය නිර්මාණ පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් ඉදිරිපත් කරන්න.
- කෝට්ටේ අවධියේ සන්දේශ සාහිත්‍ය පසුබිම පිළිබඳව පොත් පිංචක් සකස් කිරීමට ශිෂ්‍යයන්ට පැවරුමක් ලබා දෙන්න.

පියවර 2

- සන්දේශ කාව්‍යයේ ආකෘතික ලක්ෂණ පෙන්වා දෙන්න.
- සැළලිහිණි සන්දේශයේ පද්‍යවල අර්ථ ඉදිරිපත් කරමින් රසවින්දනය කරන්න.
- කාව්‍ය විචාර මූලධර්ම කෙරෙහි අවධානය යොමු කරමින් රසාස්වාදය සඳහා යොමු කරන්න.

පියවර 3

- සැළලිහිණි සන්දේශය ඇසුරෙන් විචාර ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට යොමු කරමින් අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- පිළිතුරු සැපයීමට අවශ්‍ය පද්‍ය, වනපොත් කිරීමට උපදෙස් දෙන්න.

### ගුණාත්මක යෙදවුම්

* සැළලිහිණි සන්දේශය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
* සිංහල සාහිත්‍ය වංශය - පුංචිබණ්ඩාර සන්නස්ගල
* සන්දේශ සාහිත්‍ය ඉතිහාසය - පුංචිබණ්ඩාර සන්නස්ගල
* මූලික පිරිවෙණ 5 ශ්‍රේණිය පෙළපොත 16 පාඩම (සාහිත්‍ය රසාස්වාදය හා විචාරය)

### ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :

- සන්දේශ සංකල්පය වචනාර්ථ සහිතව පැහැදිලි කිරීම
- කෝට්ටේ සාහිත්‍ය අවධියේ සාහිත්‍ය පසුබිම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම
- සැළලිහිණි සන්දේශයේ පද්‍යවල අර්ථය නිවැරදි ව ප්‍රකාශ කිරීම
- විවිධ වර්ණනා ඇසුරෙන් සැළලිහිණි සන්දේශ කතුවරයාගේ ප්‍රතිභා පූර්ණ කවීත්වය අගය කිරීම
- සැළලිහිණි සන්දේශ කාව්‍යය රස විඳිමින් විචාරය කිරීම

# 12

# නූතන පද්‍ය සාහිත්‍ය ඉතිහාසය

**නිපුණතාව** : 7.0 රසඥතාව වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම** : 7.3 නූතන පද්‍ය සාහිත්‍යයේ අවධි හා නිර්මාණකරුවන් පිළිබඳ ගවේෂණයේ යෙදෙයි.

**කාලච්ඡේද ගණන** : 02යි.

**ඉගෙනුම් පල** :

- විරාම ලක්ෂණ නිවැරැදි හඳුනා ගෙන අර්ථවත්ව භාවිත කරයි.
- කවිය යනු කුමක් දැ යි නිර්වචනය කරයි.
- කවිය පිළිබඳව පෙරදිග හා අපරදිග කාව්‍ය විචාරකයන්ගේ අදහස් සංක්ෂිප්තව ඉදිරිපත් කරයි.
- කාව්‍ය විචාර මූලධර්ම හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- නූතන පද්‍ය සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

**පෙර සූදානම**

- කවිය පිළිබඳව පෙරදිග හා අපරදිග කාව්‍ය විචාරකයන්ගේ අදහස් පිළිබඳව තොරතුරු රැස් කර ගන්න.
- නූතන පද්‍ය සාහිත්‍ය අවධි පිළිබඳව සංක්ෂිප්ත සටහනක් දැක්වෙන පෝස්ටරයක් සූදානම් කර ගන්න.

**ප්‍රවේශය**

- "වාක්‍යං රසාත්මකං කාව්‍යම්" යන පෙරදිග විචාරක අදහස ඉදිරිපත් කරමින් කවිය යනු කුමක් දැ යි ශිෂ්‍යයන් සමග සාකච්ඡාවක යෙදෙමින් පාඩමට ප්‍රවේශ වන්න.

## පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස්

පියවර 1

- කවිය පිළිබඳව පෙරදිග හා අපරදිග කාව්‍ය විචාරකයන්ගේ අදහස් සංක්ෂිප්ත ව පැහැදිලි කරන්න.
- සිංහල කවියේ ආරම්භය ඉතා දිගු ඉතිහාසයකට හිමිකම් කියන ආකාරය ඓතිහාසික තොරතුරු ඔස්සේ ඉතා කෙටියෙන් පැහැදිලි කර ජන කවිය හා සන්දේශ කාව්‍ය නූතන සිංහල කාව්‍ය සඳහා බලපා ඇති ආකාරය සංක්ෂිප්තව පෙන්වා දෙන්න. 20වන සියවස් මුල් භාගයේ සිට කොළඹ කවිය ආරම්භ වී විකාසය වූ අයුරු පැහැදිලි කරන්න.

පියවර 2

- කොළඹ කවියේ මුල් අවධියේ කාව්‍ය නිර්මාණකරණයේ යෙදුණු කවීන් හඳුන්වා දෙමින් ඔවුන්ගේ කාව්‍ය නිර්මාණවල විශේෂත්වය පැහැදිලි කරන්න. ජාතික නිදහස උදෙසා කවින්ගෙන් සිදු වූ මෙහෙය, ළමා කාව්‍ය නිර්මාණයෙහි දක්නට ලැබෙන විශේෂ කුසලතා පිළිබඳවත් පැහැදිලි කරන්න.

පියවර 3

- කොළඹ යුගයේ දෙවන අවධියේ දී හෙළ හවුලේ කවීන් හා ඔවුන්ගේ කාව්‍ය නිර්මාණ පිළිබඳ හැඳින්වීමක් කරන්න.

පියවර 4

- කාර්මික විප්ලවයේ අනිටු ප්‍රතිවිපාක දැක ස්වභාව සෞන්දර්යය අගය කරමින් බටහිර කවීන් ලියන ලද කාව්‍ය රොමැන්ටික් කාව්‍ය නමින් ප්‍රචලිත විය. එම කාව්‍ය සම්ප්‍රදාය අනුගමනය කරමින් නිර්මාණකරණයේ යෙදුණු කොළඹ කවියේ දෙවන භාගයේ කවීන් හා ඔවුන්ගේ කාව්‍ය රචනා පිළිබඳ සාකච්ඡා කරන්න.
- සිංහල කවිය නව මගකට යොමු කරමින් නිසඳැස් කාව්‍ය සම්ප්‍රදාය ජී. බී. සේනානායක විසින් හඳුන්වා දීමත් එම කාව්‍ය සම්ප්‍රදාය වර්ධනය කිරීම සඳහා මහගම සේකර, සිරි ගුණසිංහ, විමල් දිසානායක, ගුණදාස අමරසේකර ආදි කවීන්ගේ මෙහෙවවර පෙන්වා දෙන්න.
- සඳැස් කාව්‍යයත් නිදහස් කාව්‍ය සම්ප්‍රදායත් තව දුරටත් වර්ධනය කරමින් කාව්‍ය නිර්මාණකරණයේ යෙදුණු පරාක්‍රම කොඩිතුවක්කු, සරත් අමුණුගම, එරික් ඉල්යප්ප ආරච්චි, ආරියවංශ රණවීර මෙන් ම නන්දන වීරසිංහ, ආචාර්ය රත්න ශ්‍රී විජේසිංහ ආදි කවීන්ගේ නිර්මාණ ද ඉවහල් වූ අයුරු පෙන්වා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

* නව කවි සරණිය - විමල් දිසානායක

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- කවිය යනු කුමක් දැ යි පැහැදිලි කිරීම
- කවිය පිළිබඳ පෙරදිග අපරදිග මත ඉදිරිපත් කිරීම
- කාව්‍ය විචාර මූලධර්ම හඳුනා ගැනීම
- නූතන කාව්‍ය සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කිරීම

# 13

# නූතන පද්‍ය රසාස්වාදය

**නිපුණතාව** : 7.0 රසඥතා වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම** : 7.4 සාහිත්‍ය විචාර මූලධර්ම ඇසුරෙන් නූතන පද්‍ය නිර්මාණ රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි.

**කාලච්ඡේද ගණන** : 08යි.

**ඉගෙනුම පල** :

- පද්‍ය පන්තිය සඳහා අභාසය ලද කාව්‍ය සම්ප්‍රදාය හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- පද්‍ය පන්තිය නිර්මාණය කිරීම සඳහා කවියාට පාදක වූ අත්දැකීම් හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- කාව්‍ය නිර්මාණය සඳහා යොදා ගත් කාව්‍ය උපක්‍රම පැහැදිලි කරයි.
- පද්‍ය පන්තිය රසාස්වාදය කරයි.

### පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස්

පෙර සූදානම

- පද්‍ය පන්තිය ඇතුළත් මුල් කාව්‍ය සංග්‍රහයෙහි පිටපතක් සොයා ගන්න.
- පද්‍ය පන්තිය රචනා කළ කවියාගේ පද්‍ය කෘති හා වෙනත් සාහිත්‍ය නිර්මාණ තිබේ නම් ඒවායින් කිහිපයක් සපයා ගන්න.

ප්‍රවේශය

- පද්‍ය පන්තිය සිවුපද පද්‍යයක් නම් පද්‍ය පන්තිය ගායනා කිරීමට යොමු කරමින් ප්‍රවේශයක් ලබා ගන්න.
- නිදහස් කාව්‍ය සම්ප්‍රදාය අනුව ලියවුණු කාව්‍ය නිර්මාණ සඳහා පාදක අත්දැකීම් පිළිබඳව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරමින් ප්‍රවේශයක් ලබා ගන්න.

### පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස්

පියවර 1

- පද්‍ය පන්තිය නිර්මාණය කිරීම සඳහා කවියා යොදා ගත් තේමාව පිළිබඳ ව ශිෂ්‍යයන්ගෙන් විමසන්න. අවශ්‍ය නම් තේමාව හඳුනා ගැනීමට උදවු කරන්න. කාව්‍ය නිර්මාණය සඳහා යොදා ගෙන ඇති කාව්‍ය සම්ප්‍රදාය කුමක් ද යන්න පැහැදිලි කරන්න.

පියවර 2

- කවියා පද්‍ය නිර්මාණය මගින් ධ්වනිත කරන අර්ථය මතු කර ගැනීමට ශිෂ්‍යයන්ට උදවු කරන්න. පද්‍ය නිර්මාණය මගින් ශිෂ්‍යයන්ට දැනෙන හැඟීම් ඔස්සේ තමන්ට දැනෙන අයුරින් රස වින්දනය ඉදිරිපත් කරන ලෙස ශිෂ්‍යයන්ට උපදෙස් දෙන්න.

- පද්‍ය පන්තිය රසාස්වාදය කිරීමේ දී ඊට උචිත පාරිභාෂික පද භාවිත කරන්න. එහි දී පහත සඳහන් පාරිභාෂික වචන මාලාව අර්ථවත්ව භාවිත කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

පියවර 3

- **කාව්‍යානුභූතිය** - කාව්‍ය අත්දැකීම්, **ඖචිත්‍යය** - උචිත බව **ධ්වනිතාර්ථ** - හැඟවෙන අර්ථය, **අනුප්‍රාසය** - සමාන ශබ්ද හෝ වචන එක ළඟ යෙදීමෙන් උපදින ශබ්ද රසය, **උත්ප්‍රාසය,** වචනයෙන් ප්‍රකාශ කරන අර්ථයට විරුද්ධ අර්ථයක් ප්‍රකාශ කිරීම, **උපමා රූපක, සංකල්ප රූප/චිත්ත රූප/වාග් චිත්‍ර** ආදි රසාස්වාදය කිරීම සඳහා උචිත වාක් කෝෂයක් යොදා ගත යුතු බව පැහැදිලි කරන්න.

පියවර 4

- පද්‍ය පන්තියක් රසාස්වාදයේ දී පද්‍ය පන්තිය තමාට දැනුණු ආකාරය පැවසීම රසාස්වාදය යන්න අවසාන වශයෙන් පෙන්වා දෙන්න.
- පද්‍ය පන්තිය රසාස්වදය කිරීමේ දී අදහස් ධ්වනිත කිරීමට යොදා ගත් කාව්‍යමය උපක්‍රම මොනවා ද යි පද්‍ය පන්තියෙන් උපුටා දැක්වීම අත්‍යවශ්‍ය බව පෙන්වා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

* නූතන පද්‍ය කාව්‍ය සංහිතා - අචාර්ය සුනිල් ආරියරත්න

* නව කවි සරණිය - විමල් දිසානායක

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- පද්‍ය පන්තිය නිර්මාණය සඳහා ඉවහල් කර ගත් කාව්‍ය සම්ප්‍රදාය හඳුනා ගැනීම
- කාව්‍යමය අත්දැකීම ප්‍රකාශ කිරීම
- කාව්‍ය උපක්‍රම හඳුනා ගැනීම
- පද්‍ය පන්තිය රසාස්වාදය කිරීම

# 14

# චිරන්තන ගද්‍ය සංග්‍රහ

## (කුණ්ඩලකේසීගේ වස්තුව හා නන්ද තෙරුන් වහන්සේගේ වස්තුව)

**නිපුණතාව** : 7.0 රසඥතා වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණය පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම්** : 7.1 සාහිත්‍ය විචාර මූලධර්ම ඇසුරෙන් පුරාතන ගද්‍ය නිර්මාණ රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 9යි.

**ඉගෙනුම් පල** :

- චිරන්තන ගද්‍ය සංග්‍රහයේ එන සද්ධර්මරත්නාවලියේ කථා ශ්‍රැතිගෝචර ශෛලියට අනුව කියවයි.
- නිර්දිෂ්ට කථා ලිඛිල් බසින් ඉදිරිපත් කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.
- නිර්දිෂ්ට කථාවල විශේෂ භාෂා ලක්ෂණ හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- නියමිත කථා වස්තු දෙකෙහි සාහිත්‍යමය අගය හඳුනා ගෙන රස විඳිමින් විචාරය කරයි.
- නියමිත කථා වස්තු දෙකට අදාළ ගැටපද විවරණයක් ලැයිස්තුවක් ලෙස සකස් කරයි.

### පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස්

**පෙර සූදානම**

- සද්ධර්මරත්නාවලි ග්‍රන්ථයේ ප්‍රශස්ත සංස්කරණයක් සපයා ගන්න.
- නිර්දිෂ්ට ග්‍රන්ථය පිළිබඳ හැඳින්වීමක් කිරීම සඳහා සූදානම් වන්න.
- නිර්දිෂ්ට කථා හොඳින් කියවා අවබෝධ කර ගන්න.
- දුරවබෝධ වචනවල අර්ථ පැහැදිලි කර ගන්න.

**ප්‍රවේශය**

- විවිධ සාහිත්‍ය අවධි අතර දඹදෙණිය සුවිශේෂ සාහිත්‍ය අවධියක් වන බවත් ඒ සඳහා දඹදෙණි යුගයේ රචිත සද්ධර්මරත්නාවලි ග්‍රන්ථය එක් සාධකයක් බවත් සද්ධර්මරත්නාවලි ග්‍රන්ථය ප්‍රදර්ශනය කරමින් පවසන්න.
- නිර්දිෂ්ට කථා කියවීමට සියලු ම ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- කථාවල එන දුරවබෝධ වචන පිළිබඳ සාකච්ඡා කරමින් ඒවා තේරුම් කර දෙන්න.

## පාඩම සංවර්ධනය

පියවර 1

- නන්ද තෙරුන්ගේ වස්තුවෙහි පහත සඳහන් කරුණු පිළිබඳ ශිෂ්‍ය අවධානය යොමු කරන්න.
  - නන්ද කුමරු මාලිගයේ සිට විහාරය වෙත කැඳවා ගෙන යෑම
  - නන්ද කුමරු පැවිදි කරවීම
  - රාහුල කුමරා පැවිදි කරවීම
  - නන්ද තෙරුන් පැවිදි බවෙහි උකටලි වීම
  - නන්ද තෙරුන් දෙව්ලොව කරා රැගෙන යාම
  - නැවත ශාසනයෙහි ඇලුම් ඇති වීම
  - නන්ද තෙරුන් රහත් වීම
  - අතීත කථාව දේශනා කිරීම
  - කප්පට වෙළෙන්දා සහ කොටළුවා හා සම්බන්ධ කථාව

පියවර 2

- කුණ්ඩලකේසීගේ වස්තුවෙහි පහත සඳහන් කරුණු පිළිබඳව ශිෂ්‍ය අවධානය යොමු කරන්න.
  - කුණ්ඩලකේසිය සත්මහල් පායේ සිර කර තැබීම
  - මරන්නට ගෙන යන සොරකු පිළිබඳ සිතින් ඒ සොරා නිදහස් කර ගැනීම
  - සොරා සමග විවාහ වීම
  - කුණ්ඩලකේසී මරණයට පත් කිරීමට සොරා යෙදූ උපාය
  - සොරුන් හෙළන ගල මුදුනේ සිදු වන ක්‍රියාදාමය
  - කුණ්ඩලකේසී ඥනාන්විත ව ක්‍රියා කිරීම
  - පරිබ්‍රාජිකාවක් බවට පත් වීම
  - සැරියුත් තෙරුන් හමු වීම, බුදු සසුනෙහි පැවිදි වීම හා රහත් වීම

පියවර 3

- සද්ධර්මරත්නාවලියේ සාහිත්‍යික අගය පිළිබඳව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- පහත සඳහන් භාෂා උපක්‍රම පිළිබඳව ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරන්න.
  - කුතුහලය දැනවෙන පරිදි කථාව ගොඩනගා ඇති ආකාරය
  - නාට්‍යමය ආකෘතිය සහ නාට්‍යෝචිත අවස්ථා භාවිත කර ඇති ආකාරය
  - උපමා, රූපක, ප්‍රස්තාව පිරුළු භාවිත කර ඇති ආකාරය
  - දෙබස් හා සංවාද යොදා ගනිමින් සජීවී බස් වහරක් භාවිත කර ඇති අයුරු
  - අවස්ථානුකූල හා චරිතානුකූල භාෂාවක් භාවිත කර ඇති අයුරු
  - සාර්ථක චරිත නිරූපණයක් සඳහා කතුවරයා දක්වා ඇති දක්ෂතාව
- දුරවබෝධ වචන ලැයිස්තුවක් සකස් කිරීමට ශිෂ්‍යයන්ට මග පෙන්වන්න.
- ඒවායේ සරලාර්ථ පැහැදිලි කර දෙන්න.

පියවර 4

- සද්ධර්මරත්නාවලි කතුවරයාගේ අවස්ථා නිරූපණ හැකියාව, භාෂා භාවිතයේ විශේෂ ලක්‍ෂණ හා ධර්ම ග්‍රන්ථයක් ලෙස ඇති වටිනාකම පැහැදිලි කරන්න.
- ඇමුණුම් 01හි ඇතුළත් උද්ධෘත වනපොත් කරවන්න.

පියවර 5

- කථා දෙකෙහි එන උපමා රූපක, ප්‍රස්තාව පිරුළු වෙන් කොට ලැයිස්තු ගත කිරීමට මග පෙන්වන්න. (ඇමුණුම 2)

**මූලික වදන්/සංකල්ප**

ශ්‍රැති ගෝචර ශෛලිය - අසා සිටීමට උචිත පරිදි සකස් වූ රචනා ශෛලිය/ධර්ම දේශනා රීතිය/බණ කථා රීතිය/ශ්‍රව්‍ය ගෝචර රටාව

**ගුණාත්මක යෙදවුම්**

* "චිරන්තන ගද්‍ය සංග්‍රහය" පොත
* ප්‍රශස්ත සංස්කරණයකින් යුතු සද්ධර්මරත්නාවලිය
* ප්‍රශස්ත සිංහල ශබ්දකෝෂයක්
* ශ්‍රැති ගෝචර ශෛලියෙන් කියවන ලද සද්ධර්මරත්නාවලියෙහි ඇතුළත් කථා වස්තුවක් කොටසක් ඇතුළත් හඬ පටයක් හා අවශ්‍ය තාක්‍ෂණික උපකරණ

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- ශ්‍රැතිගෝචර ශෛලියට අනුව කියවීම
- නිර්දිෂ්ට කථා ලිහිල් බසින් ඉදිරිපත් කිරීම
- නිර්දිෂ්ට කථාවල විශේෂ භාෂා ලක්‍ෂණ හඳුනා ගෙන ප්‍රකාශ කිරීම
- කථා වස්තුවල සාහිත්‍යික අගය හඳුනා ගෙන රස විඳිමින් විචාරය කිරීම
- දුරවබෝධ වචනවල අර්ථ ප්‍රකාශ කිරීම

**පරිශීලනීය ග්‍රන්ථ**


සද්ධර්මරත්නාවලිය -1999 - කිරිඇල්ලේ ඤාණවිමල හිමි (සංස්:)
සිංහල සාහිත්‍යයේ නැගීම - මාර්ටින් වික්‍රමසිංහ
සාහිත්‍ය විචාර ලිපි - 2013 - මාර්ටින් වික්‍රමසිංහ
සිංහල සාහිත්‍යය 2 - ආනන්ද කුලසූරිය
සිංහල සාහිත්‍යය - සී. ඊ. ගොඩකුඹුර

ඇමුණුම 01

සද්ධර්මරත්නාවලිය කතුවරයා -

සද්ධම්මට්ඨිතිමිච්ඡන්තෝ - ධම්මසේන යතිස්සරෝ

අකාසි පවරං ඒතං - සද්ධම්ම රතනාවලිං

පරමාර්ථය

එසේ හෙයින් යම් කෙනෙක් නුවණ මඳ වත් කුසලච්ඡන්දය ඇති ව ධර්මාභියෝගයට උපදෙස් ලදින් බණ දැන පින්කමැ හැසිර නිවන් සාධා ගනිත් නම් එසේ වූ සත්පුරුෂයන්ට වැඩ සඳහා සද්ධර්මරත්නාවලී නම් ප්‍රබන්ධයක් කරම්හ.

රචනා ක්‍රමය

"පාළි ක්‍රමය හැර අර්ථ පමණක් ගෙන අප කළා වූ ප්‍රබන්ධයෙහි"

ඇමුණුම 02

| උපමාව | උපමේය අවස්ථා |
|---|---|
| උදාහරණ :<br>පූ තන කිරෙහි කිරි මිල ගෙවන්නා සේ (නන්ද වස්තුව) | මහා ප්‍රජාපති ගෝතමිය සෝවාන් කරවීම |

# 15

# ප්‍රත්‍යයාර්ථ නාම

## (තද්ධිත)

| | | | |
|---|---|---|---|
| **නිපුණතාව** | : | 2.0 | ලේඛන කාර්යයන් කර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනියි. |
| **නිපුණතා මට්ටම** | : | 2.7 | ලේඛන කාර්යයේ දී තද්ධිත පද පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි. |
| **කාලච්ඡේද** | : | 2යි. | |

**ඉගෙනුම් පල** :

- ප්‍රත්‍යයාර්ථ නාම යනු කුමක් දැ යි පැහැදිලි කරයි.
- ප්‍රත්‍යයාර්ථ නාම, තද්ධිත හා කෘදන්ත වශයෙන් වර්ග වන බව ප්‍රකාශ කරයි.
- තද්ධිත පදවල මූලික අංග හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- විවිධාර්ථවත් තද්ධිත ප්‍රත්‍යයන් හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- තද්ධිත ප්‍රත්‍ය නිවැරදි ව හඳුනා ගෙන තද්ධිත නාම පද සකස් කරයි.
- ලේඛනයේ දී තද්ධිත පද නිවැරදි ව භාවිත කරයි.

### පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස්

**පෙර සූදානම**

- පෙළපොතේ ප්‍රත්‍යයාර්ථ නාම (6) පාඩම කෙරෙහි අවධානය යොමු කරමින් පාඩමෙන් අවධාරණය කළ යුතු කරුණු මොනවා දැ යි හඳුනා ගන්න.
- විෂය අන්තර්ගතයට අදාළව ඉදිරිපත් කර ඇති ඉගෙනුම් පල කෙරෙහි අවධානය යොමු කරන්න.
- සම්පූර්ණ පාඩමට නියමිත කාලච්ඡේද සංඛ්‍යාව කෙරෙහි අවධානය යොමු කරමින් එක් එක් කාලච්ඡේදය තුළ කළ යුතු කාර්යයන් පිළිබඳ දළ සැලැස්මක් සකස් කර ගන්න.
  - පළමුවන කාලච්ඡේදය ප්‍රවේශයට හා ප්‍රත්‍යයාර්ථ නාම හඳුන්වා දීමටත් ඒවායේ මූලික අංග හඳුන්වා දීමටත් පෙළපොතට අනුව අංක 1 සිට අංක 5 තෙක් තද්ධිත ප්‍රත්‍යයන් හඳුන්වා දීමටත් යොදා ගන්න.
  - දෙවන කාලච්ඡේදය අංක 6 සිට අංක 39 තෙක් තද්ධිත ප්‍රත්‍යයන් හඳුන්වා දීමට යොදා ගන්න.

ප්‍රවේශය

- ඇමුණුමෙහි සඳහන් ඡේදය සුදුසු ක්‍රමයක් භාවිත කර ප්‍රදර්ශනය කරන්න.
- එහි අංකිත පද කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරවන්න.
- නාම පදයකට වඩා තද්ධිත නාම පදයක විශේෂත්වයක් ඇති බවත් ශබ්ද ප්‍රකෘතියට පසුව තද්ධිත ප්‍රත්‍යයක් එකතු වීමෙන් තද්ධිත නාමයක් සෑදෙන ආකාරය පැහැදිලි කරන්න.
- තද්ධිත නාමයට පසුව විභක්ති ප්‍රත්‍ය එකතු වී ඇති ආකාරයත් සරල නිදසුන් කිහිපයක් ඇසුරෙන් පෙන්වා දෙන්න.

## පාඩම සැලසුම් සඳහා උපදෙස්

පියවර 1

- තද්ධිත නාම පද සාධනයේ දී නාම ප්‍රකෘතිය හෙවත් ශබ්ද ප්‍රකෘතිය මූලික වන බව පැහැදිලි කරන්න.
- තද්ධිත නාම පදයක් සකස් කර ගැනීම සඳහා නාම පදයක ප්‍රකෘතිය හඳුනා ගත යුතු බව පෙන්වා දෙන්න.
- නාම පදයේ ප්‍රකෘතියට පසුව තද්ධිත ප්‍රත්‍යය ද ඉන් අනතුරුව විභක්ති ප්‍රත්‍යය ද යෙදෙන ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.
- ශබ්ද ප්‍රකෘතියට එකතු වන සෑම තද්ධිත ප්‍රත්‍යයකට ම අර්ථයක් හෝ අර්ථ කිහිපයක් තිබිය හැකි බව පෙන්වා දෙන්න.
- අර්ථවත් ප්‍රත්‍ය එකතු වී සෑදෙන නාම විශේෂයක් හෙයින් මෙම නාම ප්‍රතයාර්ථ නාම වශයෙන් හඳුන්වන බව පෙන්වා දෙන්න.
- එදිනෙදා ව්‍යවහාරයේ සුලබව භාවිත වන තද්ධිත නාම පද කිහිපයක් ඇසුරෙන් තවදුරටත් පැහැදිලි කරන්න.

  උදා : දේශීය, කාරුණික, බුද්ධිමත්
- පෙළපොතෙහි අදාළ පාඩමේ විෂය අන්තර්ගතය ඇසුරු කර ගෙන තද්ධිත පිළිබඳ පූර්ණ අවබෝධයක් ශිෂ්‍යයාට ලබා ගැනීමට අවස්ථාව සලස්වන්න.

**ගුණාත්මක යෙදවුම්**

* බසක මහිම 5 පද සාධනය - ජේ. බී. දිසානායක

* සිංහල භාෂා ව්‍යාකරණය - ඩබ්ලිව්. එස්. කරුණාතිලක

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- ප්‍රත්‍යයාර්ථ නාම හඳුනා ගෙන ප්‍රකාශ කිරීම
- තද්ධිත පදවල මූලික අංග හඳුනා ගැනීම
- විවිධාර්ථවත් තද්ධිත ප්‍රත්‍ය හඳුනා ගෙන භාවිත කිරීම
- නිවැරදි ව තද්ධිත පද සෑදීම
- තද්ධිත පද නිවැරදි ව භාවිත කිරීම

ඇමුණුම 1

**ගෝලීය** දැනුම ආර්ථිකයේ ප්‍රතිලාභ අත්කර ගැනීම සඳහා ශ්‍රී ලංකාව අපේක්ෂා කරන පසුබිමක රටට අවශ්‍ය මානව ප්‍රාග් ධනය **ශක්තිමත්** කිරීමේ කාර්යයේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට ප්‍රධාන කාර්ය භාරයක් පැවරී ඇත. රාජ්‍ය විශ්වවිද්‍යාලවල ධාරිතා සීමාවන් සහ රජයේ සංරෝධක පැවතීම හේතුවෙන් රටේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට ක්‍රියාකාරී දායකත්වයක් සැපයීම සඳහා විදේශ විශ්වවිද්‍යාල සහ **වෘත්තීයමය** ආයතන ඇතුළු රාජ්‍ය නො වන උසස් අධ්‍යාපන ආයතනවලට පහසුකම් සලසා දීම සහ ඒවා **දිරිමත්** කිරීම ඉතා වැදගත් වේ.

# 16

# ප්‍රත්‍යයාර්ථ නාම

## (කෘදන්ත පද)

**නිපුණතාව** : 2.0 ලේඛන කාර්යයන් ඉටු කර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 2.8 කෘදන්ත නාම සකස් කර නිවැරදි ව භාවිත කරයි.

**කාලච්ඡේද** : 1යි.

**ඉගෙනුම් පල** :

- කෘදන්ත නාම හඳුනා ගෙන පැහැදිලි කරයි.
- කෘදන්ත පදයක් සෑදෙන අයුරු විස්තර කරයි.
- කෘදන්ත නාම පද වර්ග කර දක්වයි.
- විවිධ ප්‍රත්‍ය එකතු වී කෘදන්ත නාම සකස් වන ආකාරය පැහැදිලි කරයි.
- ලේඛනයේ දී කෘදන්ත නාම පද නිවැරදි ව භාවිත කරයි.

### පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස්

පෙර සූදානම

- විෂය අන්තර්ගතය කෙරෙහි අවධානය යොමු කර එක් කාලච්ඡේදයකින් පාඩම ආවරණය කර ගත හැකි පරිදි සැලසුම් කර ගන්න.
- අවශ්‍ය ඉගෙනුම් ආධාරක පැවරුම් ආදිය සූදානම් කර තබා ගන්න. වර්තමාන කාල කර්තෘ කාරක කෘදන්ත බහුලව යොදා ඇති ලේඛනයක් ක්‍රියාකාරකම් සඳහා යොදාගැනීමට නියමිත කාලච්ඡේද සඳහා වන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පහත දැක්වෙන ආකාරයට සැලසුම් කරගන්න.

ප්‍රවේශය

- ලියන කියන, දුවන පනින, කන බොන වැනි කෘදන්ත නාම සහිත යුගල පද කිහිපයක් ප්‍රදර්ශනය කරන්න. මෙම යුගල පද ඇසුරෙන් කෘදන්ත පද සකස් වී ඇති අයුරු පැහැදිලි කරන්න. එහි දී පහත සඳහන් කරුණු ද පාදක කර ගන්න.

- ක්‍රියා පදයක ධාතු ප්‍රකෘතිය කෘදන්ත නාම සඳහා මූලික වන බව පෙන්වා දෙන්න. ධාතු ප්‍රකෘතියට විවිධ ප්‍රත්‍ය එකතු වී කෘදන්ත නාම සකස් වන ආකාරය පෙන්වා දෙන්න.

### පාඩම සංවර්ධනය

පියවර 1

- ධාතු ප්‍රකෘතිවල දක්නට ලැබෙන ලක්ෂණ අනුව ධාතු ප්‍රකෘති වර්ගීකරණයට ලක් වන ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

පියවර 2

- ධාතු ප්‍රකෘතියට ප්‍රත්‍ය එකතු වීමෙන් කෘදන්ත නාම පදයක් බවට පත් වන ආකාරයත් එසේ සකස් වන කදන්ත නාම වර්ගීකරණයට ලක්වන අයුරුත් පෙන්වා දෙන්න. ඒ සඳහා ඇමුණුමෙහි ගැලීම් සටහන ද යොදා ගන්න. පෙළපොතේ අභ්‍යාසවල ශිෂ්‍යයන් නිරත කරවන්න.
- එක් එක් කෘදන්ත වර්ග උදාහරණ සහිතව පැහැදිලි කරන්න. ඒ සඳහා පෙළපොතේ හයවන පාඩමෙහි අන්තර්ගතයෙහි අදාළ කොටස ද යොදා ගන්න.

- සපයා ගත් ලේඛනය ඇසුරෙන් වර්තමාන කාල කර්තෘ කාරක කෘදන්ත ලැයිස්තුවක් සකස් කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න

**ගුණාත්මක යෙදවුම්**

ඇමුණුමෙහි සඳහන් ගැලීම් සටහන ඇතුළත් පෝස්ටරයක්

**පරිශීලනීය ග්‍රන්ථ**


සිංහල භාෂා ව්‍යාකරණය - ඩබ්ලිව්. එස්. කරුණාතිලක

බසක මහිම - ජේ.බී. දිසානායක

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- කෘදන්ත පද සැදෙන අයුරු පැහැදිලි කිරීම
- ධාතු ප්‍රකෘති වර්ග කිරීම
- කෘදන්ත නාම පද වර්ග කිරීම
- කෘදන්ත නාම පද වර්ග උදාහරණ සහිතව පැහැදිලි කිරීම
- ලේඛනයේ දී කෘදන්ත නාම පද නිවැරදි භාවිත කිරීම

<u>**කෘදන්ත වර්ගීකරණය**</u>



# 17

# නෛපාතික කෘදන්ත

**නිපුණතාව** : 2.0 ලේඛන කාර්යයන් කර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 2.9 වාක්‍ය නිර්මාණයේ දී නෛපාතික කෘදන්ත නිවැරදි ව භාවිත කරමින් වාක්‍ය නිර්මාණ කරයි.

**කාලච්ඡේද** : 3යි.

**ඉගෙනුම් පල** :

- නෛපාතික කෘදන්ත අනවසාන ක්‍රියා යනුවෙන් ද හඳුන්වන බව ප්‍රකාශ කරයි.
- නෛපාතික කෘදන්තවල ප්‍රභේද නම් කරයි.
- නෛපාතික කෘදන්ත උදාහරණ සහිතව පැහැදිලි කරයි.
- නෛපාතික කෘදන්ත පිළිබඳ නිවැරදි අවබෝධයෙන් යුතුව ලේඛනයේ යෙදෙයි.

### පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස්

**පෙර සූදානම**

- නෛපාතික කෘදන්ත හා එහි ප්‍රභේද පිළිබඳ දැනුම යාවත්කාලීන කර ගන්න.
- නෛපාතික කෘදන්ත හැඳින්වීම සඳහා සුදුසු ඉගෙනුම් ආධාරක පිළියෙල කර ගන්න. (නෛපාතික කෘදන්ත හැඳින්වීම දැක්වෙන පෝස්ටරයක් හා එහි වර්ගීකරණය සහිත පෝස්ටරයක්)
- නියමිත විෂය අන්තර්ගතය ඉගැන්වීම සඳහා එක් එක් කාලච්ඡේදය තුළ කළ යුතු කාර්යයන් පහත දැක්වෙන පරිදි සැලසුම් කර ගන්න.
    * පළමුවන හා දෙවන කාල පරිච්ඡේද නෛපාතික කෘදන්ත හැඳින්වීම, වර්ගීකරණය, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා හා ආවස්ථික ක්‍රියා උදාහරණ සහිතව පැහැදිලි කිරීම
    * තුන්වන කාලච්ඡේදය පූර්ව ක්‍රියා, අපර ක්‍රියා පැහැදිලි කිරීම හා අභ්‍යාසවල නිරත කරවීම

**ප්‍රවේශය**

- ඇමුණුම 1හි ඇතුළත් පද්‍ය දෙක සුදුසු ක්‍රමවේදයක් භාවිත කර හෝ ප්‍රදර්ශනය කරන්න. එම පද්‍යවල අංකිත පද කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරවන්න. එම අංකිත පදවල ක්‍රියා මූලයට ප්‍රත්‍ය එකතු වී සෑදී ඇති බැවින් කෘදන්ත ගණයට ඇතුළත් වන බව පෙන්වා දෙන්න. වාක්‍යයේ විවිධ ස්ථානවල යෙදෙන බැවින් නෛපාතික කෘදන්ත යනුවෙන් ද, අනවසාන ක්‍රියා හඳුන්වන බව පෙන්වා දෙන්න.

**පාඩම සංවර්ධනය**

පියවර 1

- අනවසාන ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, (ආවස්ථික ක්‍රියා) හා අපර ක්‍රියා යනුවෙන් ප්‍රභේද සතරකින් යුක්ත වන බව පැහැදිලි කරන්න.
- අනතුරුව පූර්ව ක්‍රියාව හඳුන්වා දී උදාහරණ සහිතව පැහැදිලි කරන්න. පූර්ව ක්‍රියා සකස් වන ආකාරය පෙළපොතේ නෛපාතික කෘදන්ත පාඩම ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

පියවර 2

- මිශ්‍ර ක්‍රියාව උදාහරණ සහිතව හඳුන්වා දෙන්න. මිශ්‍ර ක්‍රියා පද සෑදෙන අයුරු පැහැදිලි කරන්න. එම ක්‍රියා පද යොදා වාක්‍ය නිර්මාණය කරන අයුරු උදාහරණ සහිතව පැහැදිලි කරන්න.
- ක්‍රියා පදයක් ඇසුරෙන් මිශ්‍ර ක්‍රියා පද සකස් කර ගැනීමටත් එම ක්‍රියා යොදා වාක්‍ය නිර්මාණය කිරීමටත් ශිෂ්‍යයන් හුරු කරන්න.
- ඒ සඳහා නෛපාතික කෘදන්ත පාඩමේ අදාළ අභ්‍යාස යොදා ගන්න. ආවස්ථික ක්‍රියා (අසම්භාව්‍ය ක්‍රියා) යනු කුමක් දැයි හඳුන්වා දී එහි ප්‍රභේද පැහැදිලි කරන්න.

පියවර 3

- මෙතෙක් ඉගෙන ගත් අනවසාන ක්‍රියා පිළිබඳ දැනුම විමසා අපර ක්‍රියාව හඳුන්වා දෙන්න. පෙළපොතේ අපර ක්‍රියාවට අදාළ විෂය කරුණු ද උපයෝගි කර ගනිමින් අපර ක්‍රියාව ද හඳුන්වා දෙන්න. උදාහරණ ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න.
- ඒ සඳහා පෙළපොතෙහි තොරතුරු ද යොදා ගන්න.

**ගුණාත්මක යෙදවුම්**

* ඇමුණුමෙහි ඇතුළත් පද්‍ය සහිත පෝස්ටරය

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- නෛපාතික කෘදන්ත යනු මොනවා ද යන්න පැහැදිලි කිරීම
- නෛපාතික කෘදන්ත ප්‍රභේද නම් කිරීම
- නෛපාතික කෘදන්ත උදාහරණ සහිතව පැහැදිලි කිරීම
- නෛපාතික කෘදන්ත පිළිබඳ නිවැරදි අවබෝධයෙන් යුතුව ලේඛනයේ යෙදීම

**පරිශීලනීය ග්‍රන්ථ**

සිංහල භාෂා ව්‍යාකරණය - ඩබ්ලිව්. එස්. කරුණාතිලක

බසක මහිම - ජේ. බී. දිසානායක

ඇමුණුම

**සඳවා** සුදු වැලි		පිවිතුරු

**බඳවා** රන් දද		පියකරු

**සිටුවා** දොර දොර		රඹතුරු

**තබවා** පුන් කුඹු		විසිතුරු

**කියමින්** ගී රස		මියුරූ

**තබමින්** පද තල		අනුරූ

**බඳිමින්** දන මන		නුවරූ

**කෙළිමින්** යෙති බැඳ		බහුරූ

# 18

# කාරක

**නිපුණතාව** : 2.0 ලේඛන කාර්යයන් ඉටු කර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරැදි ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 2.10 කාරක පිළිබඳ අවබෝධයෙන් යුතුව වාක්‍ය නිර්මාණය කරයි.

**කාලච්ඡේද** : 2යි.

**ඉගෙනුම් පල** :

- ලේඛනයේ දී ක්‍රියා කාරක සම්බන්ධතාව පිළිබඳ දැනුම වැදගත් වන බව ප්‍රකාශ කරයි.
- කාරක සංකල්පය සිදත් සඟරාව ආශ්‍රයෙන් පැහැදිලි කරයි.
- ෂට් කාරකවල අර්ථ වෙන් වෙන් වශයෙන් නිදසුන් සහිතව පැහැදිලි කරයි.
- කාරක හා ක්‍රියාව අතර ගොඩනැගෙන සම්බන්ධතාව මත වාක්‍යයක අර්ථය පැහැදිලි වන බව පිළිගෙන ලේඛනයේ යෙදෙයි.

### පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස්

පෙර සූදානම

- පෙළපොතේ **කාරක** පාඩම කියවා හොඳින් වටහා ගන්න.
- සිදත් සඟරාවේ ඇතුළත් ක්‍රියාකාරක පද සම්බන්ධතාව (කිරිය කරු පද සබඳ) පිළිබඳ පරිච්ඡේදය අධ්‍යයනය කරන්න.
- ක්‍රියාවත් කාරකත් අතර ගැළපීම පෙන්වා දීම සඳහා යොදා ගත හැකි උදාහරණ ඇතුළත් ලේඛනයක් සකස් කරන්න.

ප්‍රවේශය

- ඇමුණුමෙහි ඇතුළත් සරල වාක්‍ය ඇසුරෙන් එම වාක්‍යවල උක්තය, කර්මය හා ආඛ්‍යාතය අතර පවතින සම්බන්ධතාව පැහැදිලි කරන්න.
- එම වාක්‍යවල අර්ථය මනාව පැහැදිලි වී ඇත්තේ ක්‍රියාවත් (ආඛ්‍යාතයත්) කාරකත් අතර ගැළපීම නිසා බව තහවුරු කරමින් පාඩමට ප්‍රවේශය ලබා ගන්න.

පාඩම සංවර්ධනය

පියවර 1

- සිදත් සඟරාව ඇසුරෙන් කාරක සංකල්පය පැහැදිලි කර දෙන්න.
- ක්‍රියා නිෂ්පාදනය සඳහා කාරක හේතු වන ආකාරය නිදසුන් ඇසුරෙන් පෙන්වා දෙන්න. පෙළපොතේ ෂට් කාරක සඳහා වූ නිදසුන් මේ සඳහා පාදක කර ගන්න.

- ෂට් කාරකවල අර්ථ වෙන් වෙන්ව පැහැදිලි කර දී වාක්‍යයක ක්‍රියාකාරක සම්බන්ධතාව ගොඩ නැගෙන ආකාරය උදාහරණ සපයමින් පැහැදිලි කරන්න.
- ක්‍රියාකාරක සම්බන්ධතාව මැනවින් ගැළපෙන විට වාක්‍යයේ අර්ථය වඩාත් පැහැදිලිව හා නිරවුල්ව ප්‍රකාශ කළ හැකි බව පෙන්වා දෙන්න.
- පෙළපොතේ ෂට් කාරක සඳහා වූ උදාහරණ ද මේ සඳහා පාදක කර ගන්න.

**ගුණාත්මක යෙදවුම්**

* සිදත් සඟරා විවරණය - කේ. ජයතිලක සංස්කරණය

* සිදත් සඟරා විමසුම - ඔක්කම්පිටියේ පඤ්ඤාසාර හිමි

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- ලේඛනයේ දී ක්‍රියා කාරක සම්බන්ධතාව පිළිබඳ දැනුම වැදගත් වන බව ප්‍රකාශ කිරීම
- කාරක සංකල්පය ව්‍යාකරණානුකූලව පැහැදිලි කිරීම
- ෂට් කාරකවල අර්ථ වෙන් වෙන් වශයෙන් නිදසුන් සහිතව පැහැදිලි කිරීම
- කාරක හා ක්‍රියාව අතර ගොඩනැගෙන සම්බන්ධතාව හඳුනා ගෙන ලේඛනයේ යෙදීම
- ක්‍රියාකාරක පද සම්බන්ධතාව ප්‍රකට වන සේ වාක්‍ය නිර්මාණය කිරීම

ඇමුණුම

* තෙරණුවෝ දන් වළඳති.

* උපාසිකාව මල් නෙළයි.

* ගායකයා ගීයක් ගායනා කළේ ය.

# 19

# වාක්‍ය නිර්මාණය

**නිපුණතාව** : 2.0 ලේඛන කාර්යයන් ඉටු කර ගැනීමේ දී ව්‍යාකරණ සංකල්ප නිවැරැදි ව යොදා ගනී.

**නිපුණතා මට්ටම** : 2.11 උක්ත ආඛ්‍යාත පද නිවැරදි ව ගළපමින් සරල වාක්‍ය නිර්මාණය කරයි.

**කාලච්ඡේද ගණන** : 01යි.

**ඉගෙනුම් පල** :

- "වාක්‍ය" යනු කුමක් දැ යි පැහැදිලි කරයි.
- වාක්‍යයක මූලිකාංග හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- වාක්‍යයක උක්තය හා ආඛ්‍යාතය අතර සම්බන්ධය පැහැදිලි කරයි.
- උක්ත - ආඛ්‍යාත සම්බන්ධය මනාව ගළපමින් සරල වාක්‍ය නිර්මාණය කරයි.
- පුරුෂ, වචන, කාල සහ ලිංග භේද කෙරෙහි අවධානය යොමු කරමින් වාක්‍ය නිර්මාණය කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

**පෙර සූදානම**

- වාක්‍ය යනු කුමක් දැ යි පැහැදිලි කෙරෙන පාඨයක් සහිත පෝස්ටරයක් සූදානම් කර ගන්න.
- පුරුෂත්‍රය නියෝජනය වන සර්ව නාම උක්තය ලෙස යෙදී ඇති අතීත සහ අනතීත කාල ක්‍රියා සහිත සරල වාක්‍ය කිහිපයක් සූදානම් කර ගන්න.

**ප්‍රවේශය**

- වාක්‍ය යනු කුමක් දැ යි පැහැදිලි කෙරෙන පෝස්ටරය පුවරුවක ප්‍රදර්ශනය කර ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- උක්ත පදයක් සහ ක්‍රියා පදයක් සහිත අර්ථවත් අවම ඒකකය වාක්‍යය වශයෙන් හඳුන්වා දෙන්න.
- කල් ඇතිව සකස් කර ගත්, සර්වනාම උක්තය ලෙස යෙදී ඇති වාක්‍ය ශිෂ්‍යයන්ට ප්‍රදර්ශනය කර වාක්‍යයක ප්‍රධාන ව්‍යාකරණ අංග පෙන්වා දෙන්න.
- ව්‍යාකරණයට අනුව මැනවින් ගැළපීම නිසා මෙම වාක්‍ය අර්ථවත් වාක්‍ය බවට පත් වී ඇති ආකාරය පැහැදිලි කරන්න.

**පාඩම සංවර්ධනය**

පියවර 1

- පෙළපොතේ වාක්‍ය නිර්මාණය පාඩම ඇසුරෙන් සර්ව නාම හඳුන්වන්න.
- සර්ව නාමවල පුරුෂ භේදය හා වචන භේදය අනුව ආඛ්‍යාතය වෙනස් වන ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න.
- ශිෂ්‍යයන්ගෙන් අහඹු ලෙස වාචිකව ප්‍රශ්න අසා පුරුෂත්‍රයට අනුව වාක්‍ය නිවැරදිව නිර්මාණය කිරීමට සමත් දැයි තහවුරු කර ගන්න.

පියවර 2

- පෙළපොතේ පාඩමට අදාළ අභ්‍යාසවල ශිෂ්‍යයන් නිරත කරවන්න.
- එම අභ්‍යාසවල යෙදීමෙන් ලද අත්දැකීම් පාදක කර ගෙන සර්ව නාම භාවිත කරමින් තවදුරටත් එවැනි වාක්‍ය නිර්මාණය හුරු කිරීම සඳහා සුදුසු පැවරුම් ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

* වාක්‍ය නිර්වචනය සහිත පෝස්ටරය

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- "වාක්‍ය" යනු කුමක් ද යි පැහැදිලි කිරීම
- වාක්‍යයක මූලිකාංග හඳුනා ගෙන ඉදිරිපත් කිරීම
- වාක්‍යයක උක්තය හා ආඛ්‍යාතය අතර සම්බන්ධය පිළිබඳ මනා අවබෝධයකින් යුතුව වාක්‍ය නිර්මාණය කිරීම
- පුරුෂ, වචන, කාල හා ලිංග භේදයන් කෙරෙහි අවධානය යොමු කරමින් වාක්‍ය නිර්මාණය කිරීම

**පරිශීලනීය ග්‍රන්ථ**

* සිංහල ලේඛන රීතිය - ජාතික අධ්‍යාපන ආයතනය

* සිංහල භාෂා ව්‍යාකරණය - ඩබ්ලිව්. එස්. කරුණාතිලක

* සිංහල ලේඛන ව්‍යවහාරය : උපදේශ සංග්‍රහය
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

# 20

# වාක්‍ය නිර්මාණය

## (විශේෂ වාක්‍ය රීති)

**නිපුණතාව** : 0.2 ලේඛන කාර්යයන් ඉටු කර ගැනීමේ දී ව්‍යාකරණ සංකල්ප නිවැරැදි ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 2.12 සාමාන්‍ය, විශේෂ හා සංකීර්ණ වාක්‍ය රීතිවලට අනුකූලව වාක්‍ය නිර්මාණය කරයි.

**කාලච්ඡේද ගණන** : 05යි.

**ඉගෙනුම් පල**

- විශේෂ වාක්‍ය රීති යන්න නිර්වචනය කරයි.
- එක් එක් වාක්‍ය රීති වෙන් වශයෙන් හඳුනා ගෙන පැහැදිලි කරයි.
- වාක්‍ය රීතිවලට අනුව විවිධ වාක්‍යවල උක්තය හා ආඛ්‍යාතය අතර පවතින ව්‍යාකරණමය සම්බන්ධතාව පැහැදිලි කරයි.
- වාක්‍ය රීති පිළිබඳ නිවැරදි අවබෝධයෙන් යුතුව වාක්‍ය නිර්මාණය කරයි.
- ලේඛනයේ දී විවිධ වාක්‍ය රීති භාවිත කරයි.

### පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස්

**පෙර සූදානම**

- නියමිත කාලච්ඡේද 5 තුළ ඉගැන්විය යුතු වාක්‍ය රීති කවරේ දැ යි තීරණය කර ගන්න.
- ඒ අනුව පෙළපොතේ දක්වා ඇති අංක 1 සිට 4 තෙක් වාක්‍ය රීති පළමුවැනි කාලච්ඡේදය තුළ ද අංක 5 සිට 8 තෙක් වන වාක්‍ය රීති දෙවැනි කාලච්ඡේදය තුළ ද 3 වැනි කාලච්ඡේදයේ දී 9 සිට 14 තෙක් වන වාක්‍ය රීති ද, හතරවැනි කාලච්ඡේදය තුළ 15 සිට 19 තෙක් වාක්‍ය රීති ද පස්වැනි කාලච්ඡේදය තුළ 20 සිට අංක 26 තෙක් වාක්‍ය රීති ඉගැන්වීමටත් යොදා ගන්න. පෙළපොත හා ව්‍යාකරණ පොත් පත් පරිශීලනය කරමින් වාක්‍ය රීති සම්බන්ධ දැනුම යාවත්කාලීන කර ගන්න.

**ප්‍රවේශය**

- වාක්‍යයක ආකෘතික ලක්ෂණ දක්වන්න.
- වාක්‍ය රීති යනු කුමක් දැයි පැහැදිලි කෙරෙන වගන්තියක් සහිත පෝස්ටරය ප්‍රදර්ශන පුවරුවේ රඳවා ඒ අනුව වාක්‍ය රීති යනු කුමක් දැයි හඳුන්වා දෙන්න.
- පොදු ව්‍යාකරණ රීතියට අනුව නො යෙදෙන වාක්‍ය රටා ගණනාවක් සිංහල භාෂාවෙහි යෙදෙන බව උදාහරණ සහිතව පෙන්වා දෙන්න.
- ඒ සඳහා ඇමුණුමෙහි ඇති වාක්‍ය යොදා ගන්න.
- එම වාක්‍ය හතර ම ව්‍යාකරණානුකූල බවත් එම වාක්‍ය අතරෙන් පළමු වන හා දෙවන වාක්‍යවලින් එක ම අදහස ප්‍රකාශ කෙරෙන බවත් පෙන්වා දෙන්න.
- තුන්වන හා හතරවන වාක්‍ය එක ම වාක්‍ය රටාවක් සේ හැඟෙන නමුත් ද වාක්‍ය රටාවෙහි වෙනසක් ඇති බව පෙන්වා දෙන්න.

## පාඩම සංවර්ධනය

පියවර 1

- සාමාන්‍ය වාක්‍ය රීතියෙන් බැහැර ව විශේෂ වාක්‍ය රීතිය ක්‍රියාත්මක වන බව පැහැදිලි කරන්න.
- සාමාන්‍ය වාක්‍ය රීතිය මෙන් ම විශේෂ වාක්‍ය රීති නිවැරදි ව හඳුනා ගත යුතු බව පෙන්වා දෙන්න.
- අංක 1 - 4 තෙක් විශේෂ වාක්‍ය රීති උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

පියවර 2

- පෙළපොතේ අංක 5 - 8 තෙක් විශේෂ වාක්‍ය රීති උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

පියවර 3

- පෙළපොතේ අංක 9 සිට අංක 14 තෙක් වන වාක්‍ය රීති උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

පියවර 4

- පෙළපොතේ අංක 15 -19 තෙක් වාක්‍ය රීති උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

පියවර 5

- පෙළපොතේ අංක 20 -26 තෙක් වන වාක්‍ය රීති උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

### ගුණාත්මක යෙදවුම්

| | | |
|---|---|---|
| සිංහල ලේඛන රීතිය | - | ජාතික අධ්‍යාපන ආයතනය |
| සිංහල භාෂා ව්‍යාකරණය | - | ඩබ්ලිව්. එස්. කරුණාතිලක |
| සිංහල රචනය හා රසාස්වාදය | - | පී. තේනබදු |

### ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :

- විශේෂ වාක්‍ය රීති යන්න නිර්වචනය කිරීම
- වාක්‍ය රීති වෙන් වෙන්ව හඳුනා ගෙන පැහැදිලි කිරීම
- වාක්‍යවල උක්තය හා ආඛ්‍යාත සම්බන්ධතාව පැහැදිලි කිරීම
- වාක්‍ය රීති පිළිබඳ නිවැරදි අවබෝධයෙන් යුතුව වාක්‍ය නිර්මාණය කිරීම
- ලේඛනයේ දී විවිධ වාක්‍ය රීති උචිත පරිදි භාවිත කිරීම

ඇමුණුම

1. කාර්යාලයේ ලිපිකරුවෝ සිටිති.
2. කාර්යාලයේ ලිපිකරුවෝ ඇත.
3. ළමයි පන්තියේ ඇත.
4. ළමයින් පන්තියට පැමිණ ඇත.

# 21

# වාක්‍ය නිර්මාණය

## (කර්මකාරක වාක්‍ය)

**නිපුණතාව** : 2.0 ලේඛන කාර්යයන් ඉටු කර ගැනීමේ දී ව්‍යාකරණ සංකල්ප නිවැරැදි ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 2.13 කර්මකාරක වාක්‍ය නිර්මාණය කරයි.

**කාලච්ඡේද ගණන** : 3යි.

**ඉගෙනුම් පල** :

- කර්තෘකාරක හා කර්මකාරක වාක්‍යයක මූලිකාංග ඉදිරිපත් කරයි.
- කර්තෘකාරක වාක්‍ය හා කර්මකාරක වාක්‍ය අතර වෙනස හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- කර්තෘකාරක වාක්‍යයක් කර්මකාරක වාක්‍යයක් බවට හරවයි.
- කර්මකාරක වාක්‍යයක් කර්තෘකාරක වාක්‍යයක් බවට හරවයි.
- අවස්ථෝචිතව කර්මකාරක වාක්‍ය භාවිත කරමින් ලේඛනයේ යෙදෙයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පෙර සූදානම

- කර්මකාරක වාක්‍ය රීතිය වඩාත් පැහැදිලි ව ප්‍රකට වන පුවත්පත් වාර්තා කිහිපයක් සොයා ගන්න.
- කර්මකාරක වාක්‍ය බවට හැරවීමට උචිත කර්තෘකාරක වාක්‍ය කිහිපයක් ලියා තබා ගන්න.
- කර්තෘකාරක වාක්‍යකර්මකාරක බවට හැරවීමට උචිත වාක්‍ය කිහිපයක් ලියා තබා ගන්න.

ප්‍රවේශය

- කර්තෘකාරක හා කර්මකාරක වාක්‍ය යනු කවරේ ද යි විමසමින් කර්මකාරක වාක්‍ය බහුලව භාවිත කරන අවස්ථා මොනවා ද යි ශිෂ්‍යයන්ගෙන් විමසන්න.
- ශිෂ්‍ය ප්‍රතිචාර ඇසුරෙන් ප්‍රවෘත්ති වාර්තාකරණයේ දී කර්මකාරක වාක්‍ය රටාව බහුල වශයෙන් යොදා ගන්නා ආකාරය පුවත්පත් වාර්තා ඇසුරෙන් පෙන්වා දෙන්න.

### පාඩම සංවර්ධනය

පියවර 1

- කර්මකාරක වාක්‍ය සම්බන්ධයෙන් වැදගත් වන කරුණු කෙරෙහි ද ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරන්න.
- ඒ සඳහා ඇමුණුම 1හි තොරතුරු යොදා ගන්න.

- කර්මකාරක වාක්‍යයක මූලික ලක්ෂණ පෙන්වා දෙන්න. කර්ම කාරක වාක්‍යයක කර්මය ප්‍රධාන වන බැවින් එම වාක්‍යයේ කර්මය ප්‍රමුඛ බවට පත් වන නිසා කර්මය උක්ත කර ප්‍රථමා විභක්තියෙන් තබන බවත් කර්තෘ අනුක්ත වන අයුරුත් උදාහරණ ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න.
- වාර්තාකරණයේ දී සිදුවීම් පදනම් කර ගෙන වාර්තා පිළියෙල කරන හෙයින් සිද්ධිය ප්‍රබල ලෙස ඉස්මතු කර දැක්වීම සඳහා කර්මකාරක වාක්‍ය යොදා ගන්නා බව පෙන්වා දෙන්න.

පියවර 2

- නාම පදයක උක්ත රූපයේ හා අනුක්ත රූපයේ ස්වභාවය පිළිබඳ ශිෂ්‍යයන්ගේ දැනුම පරීක්ෂා කරන්න.
- නාම පදයක උක්ත අනුක්ත රූප පිළිබඳ මතකය විමසා බලා මතකය අවදි කරන්න.
- පෙළපොත ද භාවිත කරමින් කර්මකාරක වාක්‍ය නිර්මාණය කිරීමට යොමු කරන්න.
- සරල කර්තෘකාරක වාක්‍ය කර්මකාරක වාක්‍ය බවට පරිවර්තනය කරන අයුරු පියවරෙන් පියවර පැහැදිලි කරන්න. මේ ආකාරයට ස්වාධීනව කර්මකාරක වාක්‍ය නිර්මාණය කිරීමට හැකි වන තෙක් සුදුසු අභ්‍යාසවල යොදවන්න.
- ඇමුණුම 2හි ඇතුළත් වාක්‍ය කර්මකාරක වාක්‍ය බවට හැරවීම සඳහාත් ඇමුණුම 3හි ඇතුළත් වාක්‍ය කර්තෘකාරකයට හැරවීම සඳහාත් ශිෂ්‍යයන් යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

සිංහල භාෂා ව්‍යාකරණය - ඩබ්ලිව්. එස්. කරුණාතිලක

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- කර්තෘකාරක හා කර්මකාරක වාක්‍යයක මූලිකාංග ඉදිරිපත් කිරීම
- කර්තෘකාරක වාක්‍යය හා කර්මකාරක වාක්‍ය අතර වෙනස හඳුනා ගැනීම
- කර්මකාරක වාක්‍යයේ කර්තෘ, කර්මය හා ක්‍රියා පදය අතර ඇති සම්බන්ධතාව ඉදිරිපත් කිරීම
- කර්මකාරක වාක්‍යයේ ක්‍රියා පදය, නිරුත්සාහක ක්‍රියා පදයක් ලෙස යෙදීමේ හැකියාව දැක්වීම
- කර්ම කාරක වාක්‍යයක කර්ම පදය හා ක්‍රියා පදය අතර පවතින සම්බන්ධයේ ස්වරූපය පිළිබඳ මනා අවබෝධයකින් යුතු ව වාක්‍ය ලිවීම
- අවස්ථෝචිතව කර්මකාරක වාක්‍ය භාවිත කරමින් ලේඛනයේ යෙදීම

ඇමුණුම 1

- කර්ම කාරකයට හැරවිය හැක්කේ කර්මයක් සහිත වාක්‍යයක් පමණි.
- සුළං හැමීම, මල් පිපීම, ඉර නැගීම වැනි ඉබේ සිදු වන ක්‍රියා සහිත වාක්‍ය කර්මකාරකයට හැරවිය නො හැකි ය.
- කර්මකාරක වාක්‍යයක ප්‍රධාන වන්නේ කර්මය යි.

- කර්මය ප්‍රථමා විභක්ති රූප ගනියි.
- ක්‍රියාව කරන්නා කර්තෘ විභක්තියෙන් සිටියි.
- ක්‍රියා පදය නිරුත්සාහක ක්‍රියාවක් ලෙස හෝ ලද, ලබ ධාතුවලින් සකසා ගත් ක්‍රියාවක් යෙදිය යුතු ය.

ඇමුණුම 2

1. ශිෂ්‍යයෝ පොත් කියවති.
2. ඔවුහු මා පිළිගත්හ.
3. විදුහල්පතිතුමා ශිෂ්‍ය නායිකාවක කාර්යාලයට කැඳවීය.
4. දෙමවුපියෝ දරුවන් යහමග යවති.
5. නුඹලා උත්සව ශාලාවට කැඳවා ගෙන ගියෙහු.

ඇමුණුම 3

1. ඔවුන් විසින් මම පිළිගැනුණෙමි.
2. සාමාජිකයන් විසින් සභාපති පත් කරන ලදි.
3. විදුහල්පතිනිය විසින් ශිෂ්‍යාවෝ අමතන ලද්දාහ.
4. ලේකම්තුමා විසින් අපි  කැඳවනු ලැබීමු.
5. කම්කරුවන් විසින් මාර්ගය පිළිසකර කෙරිණි.

# 22

# අර්ථාවබෝධය

**නිපුණතාව** : 06 ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 6.1 ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අර්ථය වටහා ගත් බව ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද ගණන** : 1යි.

**ඉගෙනුම් පල**

- ගද්‍ය-පද්‍ය පාඨ අවබෝධයෙන් යුතුව නිශ්ශබ්දව කියවයි.
- ගද්‍ය පාඨ හා පද්‍ය පාඨ අවබෝධයෙන් යුතුව ශබ්ද නගා කියවයි.
- අවබෝධයෙන් හා විචාරයෙන් යුතුව ගද්‍ය හා පද්‍ය පාඨ කියවා ඒවායෙහි වාච්‍යාර්ථය, ලක්ෂ්‍යාර්ථය, ව්‍යංග්‍යාර්ථය වටහා ගත හැකි බව ප්‍රකාශ කරයි.
- ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අවබෝධය ප්‍රකට වන පරිදි ප්‍රශ්නවලට නිවැරැදි ව පිළිතුරු සපයයි.
- කියවන ඕනෑ ම ගද්‍ය හා පද්‍ය පාඨයක අර්ථ නිවැරදි ව ප්‍රකාශ කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

**පෙර සූදානම**

- පෙළපොතේ ඇතුළත් අර්ථාවබෝධය පාඩම හොඳින් කියවා වටහා ගන්න.
- වාච්‍යාර්ථය, ලක්ෂ්‍යාර්ථය, ව්‍යංග්‍යාර්ථය වෙන් වෙන්ව මතු වන අවස්ථා ඇතුළත් නිදසුන් ගද්‍ය හා පද්‍ය (පුරාතන-නූතන) කොටස් එකතුවක් පිළියෙල කර ගන්න.
- පෙළපොතේ ඇතුළත් පද්‍යයට අමතරව දහම්ගැටමාලය කෘතියෙන් එවැනි තවත් අර්ථ සහිත නිදසුන් පද්‍ය 10ක ගොනුවක් සකසා ගන්න.
- ව්‍යංග්‍යාර්ථය ප්‍රකට කරන සාහිත්‍යික අගයකින් යුත් ගීත ඛණ්ඩ එකතුවක් සකසා ගන්න.

**ප්‍රවේශය**

- ඉස්සන් පිසාපි ය
  රා කළයක් ම බීපි ය
  මෝව මරවාපි ය
  මෙ තුන මරලා මාව කාපි ය
- අර්ථාවබෝධය පාඩමේ ඇතුළත් ඉහත පද්‍යය ශිෂ්‍යයන්ට ප්‍රදර්ශනය කරන්න.
- මෙම පද්‍යයෙහි වචනවල මතුපිටින් අර්ථවත් අදහසක් ප්‍රකට නො වන බවත් වචනාර්ථයට අනුව මෙම පද්‍යයෙහි වචනාර්ථය ඉක්මවා ගොස් ව්‍යංග්‍යයෙන් පැවසෙන අර්ථයක් ඇති බවත් එම ව්‍යංග්‍යාර්ථ ඇසුරෙන් පද්‍යයේ අර්ථය පැහැදිලි කර ගත යුතු බවත් පෙන්වා දෙමින් පාඩමට ප්‍රවේශ වන්න.

### පාඩම සංවර්ධනය

**පියවර 1**

- අර්ථාවබෝධය සඳහා පෙළපොතේ ඇති පාඩමේ මුල් කතා කොටස කියවමින් ශිෂ්‍යයන් සමග රස විඳින්න.
- රචකයා සිය ලේඛනයෙන් අපේක්ෂා කරන අදහස් ඉස්මතු වන්නට නම් පාඨකයා එය මනාව වටහා ගත යුතු බව පැහැදිලි කර දෙන්න.
- ඒ සඳහා පාඨයක වාච්‍යාර්ථය පමණක් නොව ලක්ෂ්‍යාර්ථය හා ව්‍යංග්‍යාර්ථය වටහා ගැනීමෙන් සමස්ත අර්ථාවබෝධයක් ලැබිය හැකි බව නිදසුන් ඇසුරෙන් තහවුරු කර දෙන්න.

**පියවර 2**

- දහම්ගැටමාලය වැනි ගැඹුරු දහම් කරුණු ඇතුළත් නිර්මාණ පරිශීලනය කිරීමේ දී ද එම සැඟවුණු අරුත් සොයා යා මට පුරුදු විය යුතු බව වටහා දෙන්න.
- අර්ථාවබෝධයේ දී විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම මෙන් ම පුළුල් වාක්කෝෂයකින් යුක්ත වීම ද ප්‍රදේශීය භාෂා පිළිබඳ අවබෝධය ද වැදගත් විය හැකි බව පෙන්වා දෙන්න.

### මූලික වදන්/සංකල්ප

වාච්‍යාර්ථය - යම් ගද්‍ය පද්‍ය පාඨයක මතුපිටින් ගෙන දෙන අර්ථය

ලක්ෂ්‍යාර්ථය - වාච්‍යාර්ථයෙන් මතු නො වන, තර්කානුකූලව සිතා වටහා ගත යුතු අර්ථය

ව්‍යංග්‍යාර්ථය - වාච්‍යාර්ථයෙන් කිසිසේත් ම මතු නොවන සමස්ත ප්‍රකාශනය මත වක්‍රාකාරව ඉස්මතු කර ගන්නා අර්ථය

### ගුණාත්මක යෙදවුම්

- පුරාතන හා නූතන ගද්‍ය-පද්‍ය පාඨ එකතුව
- සාහිත්‍යාත්මක ගීත ඛණ්ඩ එකතුව
- දහම්ගැටමාලය

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- ගද්‍ය-පද්‍ය පාඨ අවබෝධයෙන් යුතු ව නිශ්ශබ්දව කියවීම
- ගද්‍ය-පද්‍ය පාඨ අවබෝධයෙන් යුතු ව ශබ්ද නගා කියවීම
- ගද්‍ය හා පද්‍ය පාඨ කියවා ඒවායෙහි වාච්‍යාර්ථය, ලක්ෂ්‍යාර්ථය, ව්‍යංග්‍යාර්ථය ප්‍රකාශ කිරීම
- අර්ථාවබෝධය ප්‍රකට වන පරිදි ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම
- ගද්‍ය හෝ පද්‍ය පාඨයක අර්ථ නිවැරදි ව ප්‍රකාශ කිරීම

# 23

# විරාම ලක්ෂණ

**නිපුණතාව** : 04 අදහස් නිරවුල්ව හා නිවැරැදි ව ඉදිරිපත් කරමින් ලේඛන කාර්යයෙහි යෙදේ.

**නිපුණතා මට්ටම** : 04.2 ශිල්පීය දක්ෂතා අනුගමනය කරමින් ලියයි.

**කාලච්ඡේද ගණන** : 01යි.

**ඉගෙනුම පල** :

- විරාම ලකුණු යනු මොනවා ද යි පැහැදිලි කරයි.
- නිරවුල්ව, විධිමත්ව හා නිර්මාණාත්මකව අදහස් ඉදිරිපත් කිරීම සඳහා විරාම ලක්ෂණ අත්‍යවශ්‍ය සාධකයක් බව ප්‍රකාශ කරයි.
- විරාම ලක්ෂණ නිවැරැදි ව හඳුනා ගෙන අර්ථවත්ව භාවිත කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

**පෙර සූදානම**

- පෙළපොතේ "විරාම ලක්ෂණ" පාඩම අධ්‍යයනය කරන්න.

**ප්‍රවේශය**

- විරාම ලක්ෂණ වැරදි ලෙස භාවිත කිරීම නිසා සමාජයේ ඇති වූ ගැටලුකාරී අවස්ථාවක් ඉදිරිපත් කරමින් හෝ වෙනත් සුදුසු ක්‍රමයක් භාවිත කරමින් පාඩම සඳහා ප්‍රවේශය ලබා ගන්න.

**පෙර සූදානම**

- කථනයේ දී විරාමය යොදා ගන්නා ආකාරය අවබෝධ කර ගැනීම සඳහා පෙළපොතේ 11 පාඩම (විරාම ලක්ෂණ) හොඳින් කියවා අවබෝධ කර ගන්න.
- ලේඛනයේ දී විරාම ලක්ෂණ අවබෝධයකින් තොරව භාවිත කිරීමෙන් අදහස් හා තොරතුරු වැරදි ලෙස සන්නිවේදනය විය හැකි ආකාරය දැක්වීම සඳහා සුදුසු නිදසුන් වැකි කිහිපයක් සපයා ගන්න.

## පාඩම සංවර්ධනය

පියවර 1

- කථන ව්‍යවහාරයේ දී විරාමය, හඬ පාලනය කිරීමෙන් සිදු වන බවත් ලේඛනයේ දී ඒ සඳහා විරාම ලක්ෂණ භාවිත කරන බවත් පෙන්වා දෙන්න.
- පෙළපොතේ විරාම ලක්ෂණ පාඩම කෙරෙහි අවධානය යොමු කරමින් ලේඛනයේ දී භාවිත කරන විරාම ලක්ෂණ උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

- විරාම ලක්ෂණ නිවැරැදිව භාවිත කිරීමෙන් ලේඛනයෙහි නිරවද්‍යතාව ආරක්ෂා වන අතර පාඨකයාට අර්ථය නිවැරදිව වටහා ගැනීමට පහසු වන බව පෙන්වා දෙන්න.

**පියවර 2**

- පෙළපොතේ විරාම ලක්ෂණ පාඩමෙහි කරුණු ඇසුරු කර ගනිමින් භාවිත වන විරාම ලක්ෂණ හා ඒවා ලේඛනයේ දී භාවිත වන ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න.
- උගත් විරාම ලක්ෂණ නිවැරදිව භාවිතයට යොමු කිරීම සඳහා සුදුසු අභ්‍යාසවල යොදවන්න.
- විරාම ලක්ෂණ නැවත නැවත භාවිතයට යොමු කිරීමෙන් ශිෂ්‍යයන්ට ඒ පිළිබඳ පරිචයක් ඇති කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

* විරාම ලක්ෂණ නොයෙදූ වාක්‍ය ඇතුළත් පත්‍රිකා කිහිපයක්

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- ලේඛන ව්‍යවහාරයේ දී විශ්‍රාමය දැක්වීම සඳහා විරාම ලකුණු භාවිත කරන බව ප්‍රකාශ කිරීම
- විරාම ලක්ෂණ භාවිත කරමින් අදහස් නිරවුල්ව හා නිවැරදිව ඉදිරිපත් කිරීම
- විරාම ලක්ෂණ නිවැරැදිව හඳුනා ගෙන අර්ථවත්ව භාවිත කිරීම

**පරිශීලනීය ග්‍රන්ථ**

සිංහල ලේඛන රීතිය - ජාතික අධ්‍යාපන ආයතන

සිංහල ලේඛන ව්‍යවහාරය :

උපදේශ සංග්‍රහය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

# 24

# ප්‍රායෝගික ලේඛනය

**නිපුණතාව** : 5.0 ජීවන අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 5.1 නිවැරදිව හා නිර්මාණාත්මකව ලේඛන සකස් කරයි.

**කාලච්ඡේද** : 4යි.

**ඉගෙනුම් පල** :

- ප්‍රායෝගික ලේඛන වර්ග හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- ප්‍රායෝගික ලේඛනයේ දී සුදුසු ආකෘති භාවිත කරයි.
- ලේඛනයේ ස්වරූපය අනුව භාෂාව නිර්මාණාත්මකව භාවිත කරයි.
- අවශ්‍යතා අනුව ප්‍රායෝගික ලේඛන සකස් කරයි.
- භාෂාව නිවැරැදිව භාවිත කරමින් ප්‍රායෝගික ලේඛන කාර්යයේ යෙදෙයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පෙර සූදානම

- මෙම පාඩම, නියමිත කාලච්ඡේද 4 තුළ දී සිදු කිරීම සඳහා සැලසුමක් සකස් කර ගන්න.
- ඒ අනුව වාර්තා, තීරු ලිපි, හා කතුවැකි සඳහා කාලච්ඡේද 1ක් වෙන් කර ගන්න.
  - මෙමෝ පත සකස් කිරීම සඳහා එක් කාලච්ඡේදයක් යොදා ගන්න.
  - පෝස්ටර් හා දැන්වීම් සඳහා කාලච්ඡේද 1ක් ද වෙළෙඳ දැන්වීම් හා අත්පත්‍රිකා සඳහා කාලච්ඡේද 1ක් ද යොදා ගන්න.
- පුවත් පත් ආශ්‍රයෙන් වාර්තා, තීරු ලිපි, කතු වැකි, වෙළෙඳ දැන්වීම් එකතු කර ගන්න.
- කාර්යාලවල භාවිත කෙරෙන මෙමෝ පත් කිහිපයක් හෝ ආදර්ශ මෙමෝ පතක් හෝ සූදානම් කර ගන්න.

ප්‍රවේශය

- රැස් කර ගත් විවිධ ලේඛන වර්ග සුදුසු පරිදි ප්‍රදර්ශනය කරන්න.
- එම ලේඛන පාදක කර ගෙන ශිෂ්‍යයන් සමග සාකච්ඡාවක් කරන්න.
- පුවත්පත්වල හා ඉන් බාහිර ව ද නිරන්තරයෙන් අපට හමු වන හා කියවීමට ලැබෙන ප්‍රායෝගික ලේඛන වර්ග හඳුන්වා දෙන්න.
- එහි දී පුවත්පත් වාර්තා, කතුවැකි, තීරුලිපි, මෙමෝපත්, දැන්වීම්, අත්පත්‍රිකා, පෝස්ටර් කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරන්න.
- ඉරිදා පුවත් පත් කිහිපයක් ශිෂ්‍යයන්ට ලබා දී එහි දක්නට ලැබෙන විවිධ ලේඛන වර්ග හඳුනා ගැනීමට යොමු කරන්න. ඒවායේ අරමුණු, භාෂාව, නිර්මාණාත්මක ලක්ෂණ පිළිබඳව සාකච්ඡා කරන්න.

**පාඩම සංවර්ධනය**

පියවර 1

- ප්‍රායෝගික ලේඛන කෙරෙහි ශිෂ්‍යයන්ගේ විශේෂ අවධානය යොමු කරමින් පෙළපොතේ තොරතුරු ඇසුරෙන් පුවත්පත් වාර්තාකරණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු පැහැදිලි කරන්න. පෙළපොතේ ප්‍රායෝගික ලේඛන පාඩම ඇසුරෙන් පුවත්පත් වාර්තාකරණය හා එහි මූල ධර්ම කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරවන්න. ඒ අනුව පුවත්පත් වාර්තා සම්පාදනය කිරීමට ශිෂ්‍යයන්ට උපදෙස් දෙන්න.

පියවර 2

- සන්නිවේදන ක්‍රියාවලියේ දී ජනප්‍රිය මාධ්‍ය දෙකක් වශයෙන් දැන්වීම් හා අත්පත්‍රිකාවලින් ඉටු වන මෙහෙවර ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- දැන්වීම් හා අත්පත්‍රිකා කිහිපයක් ශිෂ්‍යයන්ට ලබා දී ඒවායේ මූලික ලක්ෂණ හඳුනා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- පෙළපොතේ අන්තර්ගත තොරතුරු ද සහාය කර ගැනීමට යොමු කරවන්න.
- විවිධ තේමා පාදක කර ගෙන අත්පත්‍රිකා හා දැන්වීම් නිර්මාණය කිරීමට ශිෂ්‍යයන්ට පැවරුම් ලබා දෙන්න.

පියවර 3

- කතුවැකි හා තීරු ලිපි පිළිබඳව  සාකච්ඡා කරන්න. පෙළපොත ඇසුරෙන් කතුවැකියේ හා තීරු ලිපියේ ලක්ෂණ හඳුනා ගැනීමට සලස්වන්න.
- කිසියම් ප්‍රස්තුතයක් පිළිබඳ ලේඛකයාගේ මතය, තීරු ලිපියකින් ඉදිරිපත් කරන බවත් නිර්මාණාත්මකව භාෂාව හැසිරවීමේ නිදහස තීරු ලිපි රචකයාට හිමි බවත් පෙන්වා දෙන්න.
- තීරු ලිපි ලිවීමේ විවිධ ලේඛන ශෛලි භාවිත කරමින් ලියා ඇති ආකාරය පුවත් පත් ආශ්‍රයෙන් පෙන්වා දෙන්න.  පුවත්පත්වල පළවන විවිධ තීරු ලිපි පරිශීලනය කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- පාඨක අවධානය යොදා ගත හැකි තේමාවක් යොදා ගෙන පාඨක ආකර්ෂණය යොමු වන පරිදි තීරු ලිපි ලිවීමට යොමු කරන්න.

පියවර 4

- ආයතනයක්, සංවිධානයක් හෝ කාර්යාලයක්  තුළ හෝ සන්නිවේදන කාර්යයන් ඉටු කර ගැනීම සඳහා මෙමෝ පතක් යොදා ගත හැකි බව පෙන්වා දෙන්න.
- යම් පණිවිඩයක් ලේඛනයක් මගින් ක්‍රමානුකූලව ඉදිරිපත් කිරීම සඳහා මෙමෝ පත යොදා ගන්නා බව පෙන්වා දෙන්න.
- පෙළපොත ආශ්‍රයෙන් මෙමෝ පතක ආකෘති පැහැදිලි කරන්න. විවිධ තේමා පාදක කර ගනිමින් මෙමෝ පත් සැකසීමට ශිෂ්‍යයන් යොමු  කරන්න. පහත සඳහන් අවස්ථා  ඒ සඳහා යොදා ගන්න.
  - පිරිවෙනේ වාර්ෂික අධ්‍යාපන චාරිකාව සංවිධානය කිරීම සඳහා  (නියෝජ්‍ය පරිවේණාධිපති සිට පන්ති භාර ගුරු භවතා තෙක්)
  - පිරිවෙනේ සිංහල භාෂා දිනය පැවැත්වීම (නියෝජ්‍ය පරිවේණාධිපති, සහකාර පරිවේණාධිපති, අංශ භාර ගුරු භවතුන්, සිංහල විෂය ප්‍රධාන, සිංහල විෂය භාර ගුරු භවතුන්)

**ගුණාත්මක යෙදවුම්**

- සති අන්ත සිංහල පුවත් පත්, විවිධ වාර සඟරා, අත්පත්‍රිකා, දැන්වීම්, තීරු ලිපි, මෙමෝ පත්

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- ප්‍රායෝගික ලේඛන වර්ග හඳුනා ගෙන ඉදිරිපත් කිරීම
- සුදුසු ආකෘති භාවිත කරමින් ප්‍රායෝගික ලේඛනයේ යෙදීම
- භාෂාව නිර්මාණාත්මක ව භාවිත කිරීම
- අවශ්‍යතා අනුව ලේඛන සකස් කිරීම
- ප්‍රායෝගික ලේඛනයේ දී භාෂාව නිවැරැදි ව යෙදීම

# 25

# චිරන්තන ගද්‍ය සංග්‍රහය

## (චුල්ල සෙට්ඨී ජාතකය හා චුල්ල හංස ජාතකය)

**නිපුණතාව** : 7.0 රසඥතා වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම්** : 7.1 සාහිත්‍ය විචාර මූලධර්ම ඇසුරෙන් පුරාතන ගද්‍ය නිර්මාණ රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 11යි.

**ඉගෙනුම් පල** :

- චිරන්තන ගද්‍ය සංග්‍රහයේ එන ජාතක කථා ඊට ආවේණික ශෛලියට අනුව කියවයි.
- නිර්දිෂ්ට ජාතක කථා අර්ථාවබෝධයෙන් කියවයි.
- ජාතක කථාවල තේමාව හා අන්තර්ගතය විස්තර කරයි.
- ජාතක කථාවල සුවිශේෂතා හඳුනා ගෙන විස්තර කරයි.
- ජාතක කථාවල ආකෘතිය, භාෂා ලක්ෂණ හා රචනා රීතිය හඳුනා ගෙන පැහැදිලි කරයි.
- නිර්දිෂ්ට ගද්‍ය පාඨ ලිහිල් බසින් ලියයි.
- නිර්දිෂ්ට ජාතක කථා රස විඳිමින් විචාරය කරයි.
- කථා වස්තුවට අදාළ අවස්ථා හා සිද්ධීන් පිළිබඳ අවබෝධයෙන් යුතු ව කියවයි.
- ජාතක කථාවල එන උසස් පුරුෂාර්ථ චරිතායනය කර ගනියි.

### පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස්

**පෙර සූදානම**

- පන්සිය පනස් ජාතක පොත පිළිබඳ තොරතුරු රැස් කර ගන්න.
- නිර්දිෂ්ට ජාතක කථා කියවා අවබෝධ කර ගන්න.
- නිර්දිෂ්ට කථාවල ඇති විශේෂ භාෂා ප්‍රයෝග අධ්‍යයනය කරන්න. (උපමා, රූපක, අනුප්‍රාසාත්මක යෙදුම් ආදිය)
- ඉගැන්වීම සඳහා අවශ්‍ය ක්‍රියාකාරකම් සහ ගුණාත්මක යෙදවුම් සූදානම් කර ගන්න.

**ප්‍රවේශය**

- පහත සඳහන් ප්‍රවේශ අතරින් සුදුසු ක්‍රමයක් යොදා ගන්න.
  - ශ්‍රැති ගෝචර රටාවට ජාතක කථා කොටසක් කියවීම
  - ජාතක කථා පිළිබඳ ප්‍රශස්ත මත කීපයක් ඉදිරිපත් කිරීම

- ජාතක කථා පොතේ පසුබිම පැහැදිලි කිරීම
- ජාතක කථා තේමා කර ගත් ගීත/නාට්‍ය/චිත්‍රපට පිළිබඳ සාකච්ඡා කිරීම
- නිර්දිෂ්ට ජාතක කථාවක සාරාංශය ඉදිරිපත් කිරීම

## පාඩම සංවර්ධනය

**පියවර 1**

- ජාතක පොතට අදාළව පහත සඳහන් අංශ ඔස්සේ තොරතුරු රැස් කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
  - කර්තෘත්වය පිළිබඳ
  - සංගෘහිත කාලය පිළිබඳ
  - මූලාශ්‍රය වූ කෘති
  - පරමාර්ථය
  - අන්තර්ගතය
  - ආකෘතිය
  - භාෂා ලක්ෂණ
  - රචනා ශෛලිය

**පියවර 2**

- ඉහත සඳහන් කරුණු පිළිබඳ සාකච්ඡාවක් මෙහෙය වන්න. මෙහි දී ශිෂ්‍ය සහභාගිත්වය ලබා ගන්න.

**පියවර 3**

- නිර්දිෂ්ට ජාතක කථා පිළිබඳ කෙටි හැඳින්වීමක් සිදු කරන්න.

**පියවර 4**

- නිර්දිෂ්ට කථා කියවීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 5**

- දුරවබෝධ වචනවල අර්ථය පැහැදිලි කර ගැනීමට මග පෙන්වන්න.

**පියවර 6**

- අවස්ථා නිරූපණය, චරිත නිරූපණය, භාෂාවේ විශේෂ ලක්ෂණ, රචනා ශෛලිය හා තේමාවේ ඇති සර්ව කාලීන අගය පැහැදිලි කරමින් රසාස්වාදය හා විචාරය සිදු කිරීමට ශිෂ්‍යයන්ට මග පෙන්වන්න.

## මූලික වදන්/සංකල්ප

ජාතක කථා - බෝසත් සිරිත් ඇතුළත් කථා - ගුණසේන මහා සිංහල ශබ්දකෝෂය

**ගුණාත්මක යෙදවුම්**

* චිරන්තන ගද්‍ය සංග්‍රහය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
* පන්සිය පනස් ජාතක පොත - ඩබ්ලිව්. එස්. කරුණාතිලක (සංස්.)
* ශ්‍රැති ගෝචර ශෛලියෙන් කියවන ලද ජාතක කථාවක කොටසක් ඇතුළත් හඬ පටයක් හා අවශ්‍ය තාක්ෂණික උපකරණ

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- ජාතක පොත පිළිබඳ තොරතුරු රැස් කිරීම
- පැරණි කතා කලාවේ ලක්ෂණ නිර්දිෂ්ට කථා ඇසුරින් විස්තර කිරීම
- නිර්දිෂ්ට ජාතක කථාවල දුරවබෝධ වචන පැහැදිලි කරමින් අර්ථය ලිහිල් බසින් ලිවීම
- නිර්දිෂ්ට ජාතක කථාවල සාහිත්‍යික අගය පිළිබඳ විමසමින් ශාස්ත්‍රීය ලිපියක් සකස් කිරීම
- නිර්දිෂ්ට ජාතක කථාවල අවස්ථා නිරූපණය/චරිත නිරූපණය සහ වර්ණනා චාතුර්යය ප්‍රකට වන ආකාරය පැහැදිලි කිරීම

**පරිශීලනීය ග්‍රන්ථ**

| | |
|---|---|
| සිංහල සාහිත්‍යය 4 | - ආනන්ද කුලසූරිය |
| සිංහල සාහිත්‍යයේ නැඟීම | - මාර්ටින් වික්‍රමසිංහ |
| ජාතක කථා විමසුම | - මාර්ටින් වික්‍රමසිංහ |
| බණ කථා සාහිත්‍යය | - මාර්ටින් වික්‍රමසිංහ |

# 26

# වාක්‍ය රචනය

**නිපුණතාව** : 4.0 අදහස් නිරවුල්ව හා නිවැරැදි ව ඉදිරිපත් කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 4.1 උචිත පරිදි කරුණු සංවිධානය කර ගනිමින් මාතෘකාවකට අනුකූලව රචනා ලියයි.

**කාලච්ඡේද** : 02යි.

**ඉගෙනුම් පල** :

- වාක්‍ය රචනා යනු කුමක් ද යි විස්තර කරයි.
- වාක්‍ය රචනා ලිවීම සඳහා සාරවත් කරුණු ගොනු කරයි.
- වාක්‍ය රචනා සඳහා සැකිලි සකස් කරයි.
- වාක්‍ය රචනා සඳහා ගොනු කළ කරුණු තර්කානුකූලව හා නිර්මාණාත්මකව ඉදිරිපත් කරයි.
- ශිල්පීය ප්‍රයෝග අනුගමනය කරමින් රචනාකරණයේ නියැළෙයි.
- ලේඛනයේ දී භාෂාව නිර්මාණාත්මක ලෙස භාවිත කරයි.
- සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියා ප්‍රදර්ශනය කරමින් රචනා ලියයි.

## පාඩම සැලසුම් සඳහා උපදෙස් ඃ

**පෙර සූදානම**

- ප්‍රවීණයන් විසින් ලියන ලද රචනා කිහිපයක් එකතු කර ගන්න.

**ප්‍රවේශය**

- යම් මාතෘකාවකට අදාළ ව කරුණු ක්‍රමවත් ව සංවිධානාත්මකව හා නිර්මාණාත්මකව ලේඛනය මගින් ඉදිරිපත් කිරීම රචනය යි.
- පෙළපොතේ නිර්වචනය ද යොදා ගනිමින් රචනාව යනු කුමක් දැයි හඳුනා ගැනීමට අවස්ථාව සලස්වන්න.
- ඇමුණුමෙහි ඇති උද්ධෘතය උචිත ක්‍රමයක් මගින් ශිෂ්‍යයන්ට ප්‍රදර්ශනය කරන්න.
- එහි අන්තර්ගතය, භාෂාත්මක යෙදුම්, ප්‍රස්තුතයට උචිත භාෂාව යොදා ගෙන ඇති ආකාරය, කෙටි වාක්‍ය ඇතුළු නිර්මාණාත්මක ලක්ෂණ පෙන්වා දෙමින් එහි ස්වරූපය හඳුනා ගැනීමට සලස්වන්න.

**පාඩම සංවර්ධනය**

පියවර 1

- මාර්ගෝපදේශිත රචනා පිළිබඳව විශේෂයෙන් හඳුන්වන්න. (ලබා දී ඇති මගපෙන්වීමක් ඇසුරෙන් ලිවිය යුතු රචනා මාර්ගෝපදේශිත රචනා නමින් හඳුන්වන බව පෙන්වා දෙන්න.)
- රචනාවක් ලිවීමේ දී ශිෂ්‍යයා අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙළ පැහැදිලි කරන්න.
- රචනයක් ලිවීම සඳහා ලැබී ඇති මාතෘකාව සඳහා තමා සතුව ප්‍රමාණවත් කරුණු තිබේ දැයි විමසිලිමත් විය යුතු බව පවසන්න.

පියවර 2

- රචනය ලිවීමට පෙර රචනය සඳහා සැකිල්ලක් සකස් කර ගත යුතු බව පෙන්වා දෙන්න.
- රචනාවක් ලිවීම සඳහා පෙළපොතේ දී ඇති ආකෘතිය වෙත ශිෂ්‍ය අවධානය යොමු කරවන්න.

පියවර 3

- රචනයක් ලිවීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු පිළිබඳව පෙළපොතේ සඳහන් තොරතුරුවලට අමතරව පහත සඳහන් කරුණු වෙත ද ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරවන්න.
  - රචනය සඳහා ලේඛන ව්‍යවහාරය භාවිත කිරීම
  - නිරවුල් ව හා පැහැදිලි ව අදහස් ප්‍රකාශ කිරීම සඳහා වඩා දිගු නො වූ වාක්‍ය ලිවීමට හුරු වීම
  - උචිත වාක්කෝෂයක් භාවිත කිරීම
  - නිවැරදි ව්‍යාකරණය හා නිවැරදි අක්ෂර වින්‍යාසය යොදා ගැනීම
  - උපමා, රූපක, ආප්තෝපදේශ, යුගල පද ආදි භාෂාත්මක යෙදුම් උචිත පරිදි යෙදීම

**මූලික වදන්/සංකල්ප**

විශ්ලේෂණය - යමක් විස්තර කර දැක්වීම

සංශ්ලේෂණය - යමක් සංක්ෂිප්ත කර දැක්වීම/හකුළුවා ලීම

**ගුණාත්මක යෙදවුම්**

* ආදර්ශ රචනා කීපයක්

* සකසන ලද මාර්ගෝපදේශ කීපයක් (මාතෘකා සැකසීම සඳහා)

* පුවත්පත්, ශාස්ත්‍රීය සඟරා

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- වාක්‍ය රචනා යනු කුමක් දැ යි විස්තර කිරීම
- වාක්‍ය රචනා ලිවීම සඳහා සාරවත් කරුණු ගොනු කිරීම
- වාක්‍ය රචනා සඳහා සැකිලි සකස් කිරීම
- වාක්‍ය රචනා සඳහා ගොනු කළ කරුණු තර්කානුකූලව හා නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීම

- ශිල්පීය ප්‍රයෝග අනුගමනය කිරීම
- ලේඛනයේ දී භාෂාව නිර්මාණාත්මක ලෙස භාවිත කිරීම
- සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියා ප්‍රදර්ශනය කරමින් රචනා ලිවීම

ඇමුණුම

වියළි කලාපයේ වනාන්තරයක් වූ මේ පෙදෙසට වැස්ස ලැබුණේ ඊසාන මෝසමේ දී පමණෙකි. ඔක්තෝබරයේ දී කළු කරමින් සිට නොවැම්බර, දෙසැම්බර, ජනවාරි කාලයේ දී වසින්නට ගත් කල රැ දාවල් දෙකේ ඉස්පාසුවක් නැතිව, දවස් තුනේ හතරේ බැඳ-ගෙන වසිනු පෙනෙයි. එකල කඳුකරයේ මෙන් ම අවට පිහිටි හෙල් මුදුන, සිහින් වළා රොදින් වැසී යෙයි. වාතස්කන්ධය දැඩි- බර ගුණයෙකින් යුක්ත වෙයි. පොළොව ද පෙඟුණු පාන් ගෙඩියක් මෙන් මොළොක්ව එරෙන්නට වෙයි. නිරන්තර වර්ෂාවෙන් ගල් ඔයත්, එහි ශාඛා වූ පල්ලම් ඔය සහ එක්ගල් ආරුත් පිරී ඉතිරී යෙයි. අපමණ වන සත්තු, වතුරේ ගොස් නැසෙති. ගොවිතැන් පාළු වී යයි. ගොයම් හැර අන් කිසිම වර්ගයෙක කුඩා පැළ මේ වැස්සට ඔරොත්තු නොදෙන හෙයින් හේන් ගොවිතැනට අපල වන්නේ ය. රෝද පාරවල ඇගිලි හැරී, රෝට්ටුවේ බෝක්කු පාලම් කැඩී බිඳී යන්නේ ය.

මායා රන්ජන් - දිගාමඩුල්ලේ ආශ්චර්ය

# 27

# සාරාංශකරණය

**නිපුණතාව** : 4.0 අදහස් නිරවුල් ව හා නිවැරදි ව ඉදිරිපත් කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 4.3 ලේඛන කාර්යයේ දී සංශ්ලේෂණ හැකියා ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද** : 2යි.

**ඉගෙනුම් පල** :

- සාරාංශකරණය යනු කුමක් දැ යි පැහැදිලි කරයි.
- සාරාංශකරණයේ දී අවධානය යොමු කළ යුතු කරුණු ඉදිරිපත් කරයි.
- සාරාංශකරණය සඳහා දී ඇති උපදෙස් පිළිපැදිය යුතු බව පවසයි.
- ගද්‍ය පාඨ කියවා අදහස ග්‍රහණය කර ගෙන සාරාංශ කරයි.

## පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස්

**පෙර සූදානම**

- සාරාංශකරණයේ දී අවධානය යොමු කළ යුතු කරුණු ප්‍රදර්ශනය කිරීම සඳහා පිටු පෙරළනයක් හෝ ප්‍රදර්ශන පුවරුවක් හෝ සකස් කර ගන්න. සාරාංශකරණය සඳහා උචිත ගද්‍ය පාඨ කිහිපයක් තෝරා ගන්න.

**ප්‍රවේශය**

- ශිෂ්‍යයන්ට ගුවන්විදුලි ප්‍රවෘත්ති නිවේදනයකට සවන් දීමට සලස්වන්න.
- ප්‍රවෘත්ති ප්‍රකාශනයට මෙන් ම ප්‍රවෘත්ති සිරස්තලවලට හා ප්‍රවෘත්ති සාරාංශයට ද ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරවන්න.
- ප්‍රවෘත්ති සිරස්තලවලින් හා ප්‍රවෘත්ති සාරාංශයෙන් ඇති ප්‍රයෝජන ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- ප්‍රවෘත්ති ප්‍රකාශනයේ ඉතා වැදගත් ප්‍රවෘත්ති, සිරස්තල මගින් සංක්ෂිප්තව ඉදිරිපත් කරන බවත් එය සාරාංශකරණය ප්‍රායෝගිකව භාවිත කරන එක් අවස්ථාවක් බවත් පෙන්වා දෙන්න.
- සාරාංශ කිරීමේ හැකියාව භාෂා කුසලතාවෙහි ඉහළ හැකියාවක් බව පෙන්වා දෙන්න.

## පාඩම සංවර්ධනය

**පියවර 1**

- පෙළපොතෙහි ඇතුළත් කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් සාරාංශකරණයෙහි වැදගත්කම ශිෂ්‍යයන්ට අවධාරණය කරන්න.

- සාරාංශකරණය සඳහා ඡේද තෝරා ගැනීමේ දී ශිෂ්‍යයන්ට පහසුවෙන් වටහා ගත හැකි කුඩා ඡේද ලබා දෙන්න. පළමුව තනි ඡේදත් පසුව ඡේද කිහිපයකින් යුතු පාඨත් සාරාංශකරණය සඳහා ඉදිරිපත් කරන්න.

- සාරාංශකරණය පිළිබඳ මනා පරිචයක් ශිෂ්‍යයන්ට ලබා ගැනීම සඳහා සතතාභ්‍යාසයෙහි යොදවන්න. සුදුසු ක්‍රමවේදයක් භාවිත කරමින් තක්සේරුකරණයේ යෙදෙන්න. අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- සාරාංශකරණය යන්න නිවැරදි ව හඳුනා ගැනීම
- සාරාංශකරණයේ දී අවධානය යොමු කළ යුතු කරුණු අවබෝධ කර ගැනීම
- සාරාංශකරණය සඳහා වන උපදෙස් පිළිපැදීම
- ගද්‍ය පාඨ කියවා අදහස හොඳින් ග්‍රහණය කර ගැනීම
- ගද්‍ය පාඨ සාරාංශ කිරීම

**පරිශීලනීය ග්‍රන්ථ**

සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය - පී. තේනබදු

# 28

# සාම්ප්‍රදායික යෙදුම්

**නිපුණතාව** : 3.0 භාෂා ක්‍රියාකාරකම් මගින් වාග්මාලාව පෝෂණය කර ගෙන භාෂා කාර්යන්හි දී උචිත පරිදි භාවිතයට ගනියි.

**නිපුණතා මට්ටම** : 3.1 ලේඛනයේ දී නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු ව සාම්ප්‍රදායික යෙදුම් භාෂා කාර්ය සඳහා යොදා ගනියි.

**කාලච්ජේද** : 4යි.

**ඉගෙනුම් පල** :

- සාම්ප්‍රදායික යෙදුම් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- යුගල පද සෑදෙන රටා හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- සාම්ප්‍රදායික යෙදුම් භාවිතයෙන් බස රසවත් ව ඉදිරිපත් කළ හැකි අයුරු විස්තර කරයි.
- ඉඟිවැකි, ප්‍රස්තාව පිරුළු, ආප්තෝපදේශවල වෙනස හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- භාෂා භාවිතයේ දී යුගල පද අර්ථවත්ව යොදා ගනියි.
- සාම්ප්‍රදායික යෙදුම් අර්ථාන්විත ව භාෂා කාර්යයේ දී යොදා ගනියි.

## පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස්

පෙර සූදානම

- ඉඟිවැකි, ප්‍රස්තාව පිරුළු හා ආප්තෝපදේශවල වෙනස හඳුනා ගන්න.
- යුගල පද පිළිබඳව සහ යුගල පද සෑදෙන රටා පිළිබඳ අධ්‍යයනය කරන්න.
- ප්‍රස්තාව පිරුළු ආශ්‍රිත ජන කතා කීපයක් සොයා ගන්න.
- ආප්තෝපදේශ යෙදී ඇති ජන කවි හා ජන කතා සොයා ගෙන ඒ පිළිබඳව කියවා දැනුවත් වන්න.

ප්‍රවේශය

- පහත සඳහන් ක්‍රම අතරින් එකක් හෝ වෙනත් සුදුසු ක්‍රමයක් භාවිතයෙන් පාඩම සඳහා ප්‍රවේශ වන්න.
  - සාම්ප්‍රදායික යෙදුම් ඇතුළත් සංවාදයක් ශ්‍රවණය කිරීමට සැලැස්වීම
  - සාම්ප්‍රදායික යෙදුම් හා සම්බන්ධ ජන කතාවක් හෝ ජන කවියක් ඉදිරිපත් කිරීම
  - සාම්ප්‍රදායික යෙදුම් පිළිබඳ ශිෂ්‍යයන්ගේ පෙර දැනුම අවදි කරවීම
  - සාම්ප්‍රදායික යෙදුම් හා සබැඳි නාට්‍ය කොටසක් නැරඹීමට සැලැස්වීම (පරාස්ස, නරි බෑනා ආදි)

## පාඩම් සැලසුම

**පියවර 1**

- පහත දැක්වෙන සාම්ප්‍රදායික යෙදුම් ඇසුරෙන් පැහැදිලි කරන්න.
  - ඉඟිවැකි (රූඪී පද)
  - ප්‍රස්තාව පිරුළු
  - ආප්තෝපදේශ
  - යුගල පද

**පියවර 2**

- සාම්ප්‍රදායික යෙදුම් නිසා භාෂාවට ඇති වන මෙහෙය පිළිබඳ සාකච්ඡා කරන්න.
  - අදහසක් ඉතා රසවත්ව ඉදිරිපත් කළ හැකි වීම
  - අදහස වඩාත් උද්දීපනය කිරීම
  - ව්‍යවහාරයේ දී මෙන් ම නිර්මාණකරණයේ දී ද යොදා ගැනීමට හැකි වීම
  - අදහසක් සරලව අවබෝධ කර ගැනීමට පහසු වීම
- පෙළපොතෙහි 15 පාඩමෙහි (සාම්ප්‍රදායික යෙදුම්) උදාහරණ ඉදිරිපත් කරමින් සාම්ප්‍රදායික යෙදුම් හඳුනා ගැනීමට අවස්ථාව ලබා දෙන්න

**පියවර 3**

- ප්‍රස්තාව පිරුළුවල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ අනුව ඒවා වර්ග කර දක්වන්න.

  උදා : - ජන කතා ආශ්‍රිත ප්‍රස්තාව පිරුළු
  - ලෝක ධර්මතා පදනම් කර ගත් පිරුළු
  - උපමා අර්ථයේ පිරුළු
  - ශ්‍රැති සූචනාර්ථයේ ලු නිපාතයෙන් අවසන් වන ප්‍රස්තාව පිරුළු
- ආප්තෝපදේශවලින් යම් ඍජු අදහසක් ප්‍රකාශ වන අයුරු පෙන්වා දෙන්න.
- එහි උපදේශාර්ථයක් ගැබ් වී ඇති අයුරු සාකච්ඡා කරන්න.
- උපදේශාත්මක ජන කවි මේ සඳහා භාවිත කරමින් එහි එන ආප්තෝපදේශ පිළිබඳ සාකච්ඡා කරන්න.

**පියවර 4**

- යුගල පද එකතුවක් සකස් කිරීමට ශිෂ්‍යයන්ට මඟ පෙන්වන්න.
- යුගල පද සැදෙන රටා පිළිබඳව සාකච්ඡා කරන්න.
- යුගල පද භාෂාවේ යෙදෙන ආකාරය පහදා දෙන්න.

**පියවර 5**

- එක් එක් ශිෂ්‍යයා ඒකරාශි කර ගත් සාම්ප්‍රදායික යෙදුම් සියලු දෙනා අතර හුවමාරු කර ගැනීමට මඟ පෙන්වන්න.

**මූලික වදන්**

ඉඟි වැකි (රූඪි)

- මතුපිටින් පෙනෙන වාච්‍යාර්ථයට වඩා වෙනස් අර්ථයක් ලබා දෙන යෙදුම්
- දීර්ඝ ව කිව යුතු අදහසක් සංක්ෂිප්තව හා ප්‍රබල ව ප්‍රකාශ කිරීමට භාවිත කරන යෙදුම්

ප්‍රස්තාව පිරුළු

- යම් අවස්ථාවකට ගැළපෙන පරිදි ඒ හා සමාන අවස්ථාවකින්, සිද්ධියකින්, චරිතයකින් ලබා ගත් අදහසක් ප්‍රකාශ කරන යෙදුම්
- මේවා නිර්මාණය වීමට බොහෝ විට ජනප්‍රවාදයක්, ජනකතාවක් හෝ සිද්ධියක් හෝ මූලික වී ඇත.
- යම් අදහසක් ව්‍යක්ත ලෙස ඉදිරිපත් කිරීම සඳහා යොදා ගත හැකි ය.

ආප්තෝපදේශ

- ආප්තයන් හෙවත් වැඩිහිටියන්/අද්දැකීම් බහුල අය ලබා දෙන උපදේශ ආප්තෝපදේශ නම් වේ.
- ජන කවි, ජන කතාවල ද ආප්තෝපදේශ ඇතුළත් වී ඇත.

යුගල පද

- යුක්තාර්ථවත් පද දෙකක් එකට යෙදී අදහස වඩාත් තීව්‍රව ඉදිරිපත් කිරීමට යොදා ගන්නා භාෂා ප්‍රයෝගයකි.

**ගුණාත්මක යෙදවුම්**

* ප්‍රස්තාව පිරුළු ආශ්‍රිත ජන කතාවක් පටිගත කළ සංයුක්ත තැටියක්
* ප්‍රස්තාව පිරුළු වර්ග කරන ලද පුවරුවක්
* යුගල පද වර්ග කරන ලද පුවරුවක්
* ආප්තෝපදේශ ඇතුළත් ජන කවි කීපයක්
* ඉඟි වැකි ඇතුළත් පුවරුවක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- සාම්ප්‍රදායික යෙදුම් හඳුනා ගෙන ඉදිරිපත් කිරීම
- යුගල පද සෑදෙන ක්‍රම හඳුනා ගැනීම
- අදහස් රසවත්ව ඉදිරිපත් කිරීම සඳහා සාම්ප්‍රදායික යෙදුම් භාවිත කිරීම
- ඉඟි වැකි, ප්‍රස්තාව පිරුළු හා ආප්තෝපදේශවල වෙනස හඳුනා ගැනීම
- සාම්ප්‍රදායික යෙදුම් අර්ථවත්ව භාෂා කාර්ය සඳහා යොදා ගැනීම

**පරිශීලනීය ග්‍රන්ථ**


- සිංහල ප්‍රස්තාව පිරුළු සහිත්‍යය - ප්‍රේමදාස ශ්‍රී අලවත්තගේ
- සිංහල රචනය සහ රසාස්වාදය - පී. තේනබදු
- පිරුළු මිණි - ටී. එස්. ධර්මබන්දු

# 29

# සාහිත්‍ය රසාස්වාදය හා විචාරය

**නිපුණතාව** : 11.0 සාහිත්‍ය පරිශීලනයට අදාළ ක්‍රමවේද ගවේෂණය කරයි.

**නිපුණතා මට්ටම** : 11.1 මූලධර්ම පරිශීලනය කරමින් ගද්‍ය පද්‍ය කොටස් විචාරයට ලක් කරයි.

**කාලච්ඡේද** : 4යි.

**ඉගෙනුම් පල** :

- කාව්‍ය විචාර මූලධර්ම භාවිත කර ගනිමින් සාහිත්‍ය කෘති රස විඳියි.
- සාහිත්‍ය විචාරයේ දී හා රසාස්වාදයේ දී මූලධර්ම සිද්ධාන්ත යොදා ගනියි.
- කාව්‍ය විචාරය පිළිබඳ කියවා ලබා ගත් දැනුම ප්‍රදර්ශනය කරයි.
- සාහිත්‍ය නිර්මාණ පිළිබඳ තම අදහස් ඉදිරිපත් කරයි.
- නිර්මාණවලින් ප්‍රකට වන සාහිත්යික ලක්ෂණ අගය කරයි.
- විවිධ සාහිත්‍ය නිර්මාණ රසාස්වාදයේ යෙදෙයි.

## පාඩම් සැලසුම සඳහා උපදෙස්

**පෙර සූදානම**

- සාහිත්‍ය විචාරය හා සම්බන්ධ නිර්වචන එක් රැස් කර ගන්න.
- එම නිර්වචනවල අර්ථය වටහා ගන්න.
- පෙරදිග සාහිත්‍ය විචාරවාද පිළිබඳ කරුණු සොයා ගන්න.
- රස හා අලංකාර පිළිබඳව අවබෝධයක් ලබා ගන්න.
- ඒ ඒ විචාර සංකල්ප හා මූලධර්ම පැහැදිලි කිරීමට නිදසුන් සපයා ගන්න.

## පාඩම සංවර්ධනය

**ප්‍රවේශය**

- පහත සඳහන් ක්‍රම අතරින් එකක් හෝ වෙනත් සුදුසු ක්‍රමයක් භාවිතයෙන් පාඩමට පිවිසෙන්න.
  - රසාස්වාදය හා විචාරය පිළිබඳ ශිෂ්‍යයන්ගේ අදහස් මතු කර ගැනීම සඳහා සාකච්ඡාවක නිරත වීම
  - "කාව්‍ය" යන්නට ඇති නිර්වචන කීපයක් සාකච්ඡා කිරීම (ඇමුණුම 01)
  - වාර්තාවක සහ සාහිත්‍ය නිර්මාණයක වෙනස වටහා දීම
  - පද්‍යයක් හෝ ගීතයක් ගායනා කිරීම

## පාඩම සංවර්ධනය

**පියවර 1**

- පහත සඳහන් සංකල්ප පිළිබඳ පාඩම ආශ්‍රයෙන් පැහැදිලි කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
  - අර්ථ රසය
  - ශබ්ද රසය
  - ප්‍රතිභාව
- භාෂාව භාවිතයේ දී සාහිත්‍ය නිර්මාණකරුවා රස ජනනය කර ගැනීමට සමත් වන ආකාරය පෙන්වා දෙන්න.

**පියවර 2**

- රස සංකල්පය පැහැදිලි කරමින් සාකච්ඡාවක නිරත වන්න.
- රස සහ භාවයන් පිළිබඳ අවබෝධය ලබා දෙන්න. (ඇමුණුම 02)

**පියවර 3**

- පෙළපොත ආශ්‍රයෙන් පහත සඳහන් විචාරවාද පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් කරන්න.
  - අලංකාරවාදය
  - ධ්වනිවාදය
  - වක්‍රෝක්තිවාදය
  - ඖචිත්‍යවාදය
  - රීතිවාදය

**පියවර 4**

- පෙළපොතෙහි නියමිත පාඩමෙහි ඇතුළත් නිදසුන් ආශ්‍රය කර ගනිමින් විචාර හා රසාස්වාද මූලධර්මවලට අනුව ඒවා රස විඳීමට ශිෂ්‍යයන්ට මග පෙන්වන්න.

### මූලිකවදන්/සංකල්ප

- "ප්‍රතිභා, අපූර්ව වස්තු නිර්මාණක්ෂමා ප්‍රඥා" යම් වස්තුවක් අපූර්ව ආකාරයෙන් නිර්මාණය කිරීමට ඇති හැකියාව ප්‍රතිභාව යි.
  - වාච්‍යාර්ථය - වචනයෙන් ප්‍රකාශිත මතුපිට අර්ථය
  - ව්‍යංග්‍යාර්ථය - වාච්‍යාර්ථය ඉක්මවා අඟවා ගත හැකි පැතිරුණු අර්ථය (අර්ථධ්වනිය, ධ්වනිතාර්ථය)

### ගුණාත්මක යෙදවුම්

* ඇමුණුම් 01, 02
* සාහිත්‍ය විද්‍යාව - එදිරවීර සරච්චන්ද්‍ර
* නව කව්සරණිය (ප්‍රස්තාවනාව) - විමල් දිසානායක
* සිංහල කාව්‍ය සංග්‍රහය - ආරිය රාජකරුණා
* සාහිත්‍ය විචාර ලිපි - ඒ. වී. සුරවීර

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- කාව්‍ය විචාර මූලධර්ම භාවිත කරමින් සාහිත්‍ය කෘති රස විඳීම
- සාහිත්‍ය විචාරයේ දී හා රසාස්වාදයේ දී මූලධර්ම සිද්ධාන්ත යොදා ගැනීම
- විචාරය පිළිබඳ කියවා ලබා ගත් දැනුම ප්‍රදර්ශනය කිරීම
- සාහිත්‍ය නිර්මාණ පිළිබඳ තම අදහස් ඉදිරිපත් කිරීම
- නිර්මාණවලින් ප්‍රකට වන සාහිත්‍යමය ලක්ෂණ අගය කිරීම
- විවිධ සාහිත්‍ය නිර්මාණ රසාස්වාදයේ යෙදීම

**ඇමුණුම් 01**

- ශබ්දාර්ථෞ සහිතෞ කාව්‍යම් - රුද්‍රට
- ශබ්දාර්ථෞ නිර්දෝෂ සගුණෞ ප්‍රායඃ සාලංකාර කාව්‍යම් - වාග්භට
- තද්දෝෂෞ ශබ්දාර්ථෞසගුණාවනලංකෘතිඃ පුනඃ ක්වාපි - මම්මට
- අදෝෂෞ සගුණෞ සාලංකාරෞචශබ්දාර්ථෞ කාව්‍යම් - හේමචන්ද්‍ර
- කාව්‍යාති ඉති කවිඃ තස්‍ය කර්ම කාව්‍යම් - විද්‍යාධර
- කාව්‍යසාත්මාධ්වනිඃ - ආනන්ද වර්ධන
- රමණියාර්ථ ප්‍රතිපාදකඃ ශබ්දඃ කාව්‍යම් - ජගන්නාථ
- කාව්‍යශබ්දෝයං ගුණාලංකාරසංස්කෘතයෝඃ ශබ්දාර්ථයෝඃ වර්තතේ - වාමන
- කෞති ශබ්දායනේවිමෘෂතිරසභාවන් - විශ්වනාථ
- කවිඃ කස්‍ය කර්ම කාව්‍යම් - භට්ටගෝපාල

**ඇමුණුම් 02**

| භාව | රස |
|---|---|
| රති | ශෘංගාර |
| හාස | හාස්‍ය |
| ශෝක/අනුකම්පා | කරුණ |
| ක්‍රෝධ | රෞද්‍ර |
| උත්සාහ | වීර |
| භය | භයානක |
| ජුගුප්සා | බීභත්ස |
| විස්ම | අද්භුත |
| ශම | ශාන්ත |

ශෘංගාර හාස්‍ය කරුණ
රෞද්‍ර වීර භායානකඃ
බීභත්සාද්භුත ඉත්‍යෂෞ
රසාඃ ශාන්තස් තථා මතඃ

# 30

# වාක්කෝෂය පෝෂණය

**නිපුණතාව** : 3.0 භාෂා ක්‍රියාකාරකම් මගින් වාංමාලාව පෝෂණය කර ගෙන භාෂා කාර්යයන්හි දී උචිත පරිදි භාවිතයට ගනියි.

**නිපුණතා මට්ටම** : 3.1 විවිධ භාෂාවලින් සිංහල වාක්කෝෂය පෝෂණය වී ඇති බව හඳුනා ගෙන භාවිත කරයි.

**කාලච්ඡේද ගණන** : 03යි.

**ඉගෙනුම් පල** :

- සිංහල භාෂාව නිෂ්පන්න, තද්භව හා තත්සම පදවලින් පෝෂණය වී ඇති බව පැහැදිලි කරයි.
- සිංහල භාෂාව පෝෂණය සඳහා පාලි, සංස්කෘත, ද්‍රවිඩ ආදි පෙරදිග භාෂා මෙන් ම ඉංග්‍රීසි, පෘතුගීසි, ලන්දේසි ආදි අපරදිග භාෂා ද බලපා ඇති බව පිළිගෙන ප්‍රකාශ කරයි.
- නිෂ්පන්න, තත්සම හා තද්භව වචන නිවැරදි ව හඳුනා ගෙන වගු ගත කරයි.
- අනුරූප වචන සංයෝගය පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛනයේ යෙදෙයි.
- වර්තමාන සිංහල භාෂාවේ ව්‍යවහාර වන නිෂ්පන්න, තද්භව, තත්සම වචන නිවැරදි ව හඳුනා ගෙන ලේඛනයේ යෙදෙයි.

## පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස්

**පෙර සූදානම**

- නිෂ්පන්න, තත්සම, තද්භව වචන පිළිබඳ අවබෝධයක් පෙළපොතේ පාඩම ඇසුරෙන් ලබා ගන්න.
- නිෂ්පන්න, තත්සම, තද්භව යන වචනවල අර්ථ වෙන් වෙන්ව දැක්වෙන පෝස්ටරයක් සකස් කර ගන්න.
- පුවත්පත්, ලිපිලේඛන ආදියෙන් සොයා ගත් තද්භව, තත්සම, නිෂ්පන්න වාංමාලා ඇතුළත් වගුවක් පිළියෙල කරන්න.
- අනුරූප වචන සංයෝගය පිළිබඳ හුරුව ලබා ගැනීමට සුදුසු ක්‍රියාකාරකමක් සකස් කර ගන්න.

**ප්‍රවේශය**

- සිංහල භාෂාව, පාලි හා සංස්කෘත යන භාෂා පදනම් කර ගෙන නිර්මාණය වී ඇති බවත් පසු කාලීන ව ද්‍රවිඩ, පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි යන භාෂාවලින් ද පෝෂණය වී ඇති ආකාරය පෙන්වා දෙමින් පාඩමට ප්‍රවේශ වන්න.

## පාඩම සංවර්ධනය

පියවර 1

- නිෂ්පන්න, තත්සම, තද්භව යන වචනවල අර්ථ දැක්වෙන පෝස්ටරය ප්‍රදර්ශනය කරමින් සිංහල භාෂාව පෝෂණය වී ඇති ආකාරය පැහැදිලි කරන්න.
- මේ සඳහා පෙළපොතේ වාක්කෝෂය පෝෂණය (17 පාඩම) පාඩමෙහි අදාළ කරුණු යොදා ගන්න.
- සජීවී භාෂාවක් විවිධ භාෂා සමග සංස්පර්ශයෙන් වාක්කෝෂය පෝෂණය වන බව පෙන්වා දෙන්න.
- ඒ අනුව සිංහල වාංමාලාවේ පෝෂණයට පාලි, සංස්කෘත, ද්‍රවිඩ යන පෙරදිග භාෂා මෙන් ම පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි ආදි අපරදිග භාෂා ද බලපා ඇති බව පැහැදිලි කරන්න.

පියවර 2

- පාලි, සංස්කෘත ආදි වෙනත් භාෂාවලට කිසිදු සම්බන්ධතාවක් දැක්වීමට නො හැකි සිංහල භාෂාවට ම ආවේණික වූ වචන නිෂ්පන්න වචන වශයෙන් හැඳින්වෙන බව පෙන්වා දෙන්න.
- පෙළපොතේ වාක්කෝෂය පෝෂණය පාඩම ද ආශ්‍රය කර ගනිමින් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

පියවර 3

- වෙනත් භාෂාවල වචන කිසිදු වෙනසකට  ලක් නො වී ඒ ආකාරයෙන් ම සිංහලයේ භාවිත වන වචන තත්සම වචන බව පෙළපොතේ ඇතුළත් කරුණු ද ඇසුරු කර ගෙන පැහැදිලි කරන්න.

පියවර 4

- වෙනත් භාෂාවලින් ව්‍යවහාරයට පැමිණි වචන සිංහල භාෂාවේ ස්වරූපයට අනුව සකස් කර ගත් විට එම වචන  තද්භව වචන බව පැහැදිලි කරන්න.
- ඒ සඳහා පෙළපොතේ ඇතුළත් තොරතුරු ද යොදා ගන්න.
- තද්භව වචනවල ස්වරූපය පැහැදිලි කරන්න.

පියවර 5

- පැවරුමෙහි (ඇමුණුම 1) ඇති ක්‍රියාකාරකමෙහි ශිෂ්‍යයන් යොදවා නිෂ්පන්න, තත්සම හා  තත්භව වචන පිළිබඳ දැනුම පරීක්ෂා කරන්න. අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.

පියවර 6

- භාෂාව භාවිත කිරීමේ දී තත්සම, තද්භව වචන යෙදීම සම්බන්ධව ශිෂ්‍යයන් සමග සාකච්ඡාවක යෙදෙන්න.
- භාෂාව භාවිතයේ දී අනුරූප වචන එකට සංයෝග කළ යුතු බව පෙන්වා දෙන්න.
- වචන දෙකක් එකට යෙදෙන විට අනුරූප වචන සංයෝග වන පරිදි එම වචන දෙක ම එක ම ස්වරූපයෙන් තැබිය යුතු ආකාරය ඇමුණු 2හි ඇති වගුව ඇසුරෙන්  පැහැදිලි කරන්න.

**මූලික වදන්/සංකල්ප**

| | |
|---|---|
| වාක්කෝෂය | - වචන මාලාව |
| නිෂ්පන්න වාංමාලාව | - හට ගත්, උපන් යනු අර්ථ යි. නිෂ්පන්න වාංමාලාව යනු යම් දේශයක ආදියේ පටන් පැවත එන ජන කොටස භාවිත කළ වචන සමූහය යි. මෙය දේශජ වාග්මාලාව ලෙස ද හැඳින්වේ. |
| තද්භව වාංමාලාව | - වෙනත් භාෂාවලින් උකහා ගෙන දේශීය භාෂා අනන්‍යතාවට උචිත ලෙස සකස් කර ගෙන භාවිත කරන වචන යි. |
| තත්සම වාංමාලාව | - වෙනත් භාෂාවල භාවිත වන වචන වෙනසකට භාජනය කිරීමෙන් තොරව ඒ ආකාරයට භාවිතයට ගැනෙන වචන යි. |
| ආර්ය භාෂා | - ඉන්දියාව ජනාවාස වූයේ සාංක්‍රමණික ජන කොටසකිනි. එම ජන කොටස ආර්යයන් ලෙස හැඳින්වේ. ඔවුන්ගෙන් සම්භවය වූ භාෂා ආර්ය භාෂා වේ. පාලි, සංස්කෘත, සිංහල මේ ගණයට අයත් ය. |
| අනාර්ය භාෂා | - ආර්යයන් ඉන්දියාවට පැමිණෙන විට එහි ජීවත්ව සිටි පිරිස අනාර්යයන් ලෙස හැඳින්වේ. ඔවුන්ගෙන් සම්භවය වූ භාෂා අනාර්ය වේ. ද්‍රවිඩ භාෂාව, එම භාෂා ගණයට ඇතුළත් ය. |
| සංස්පර්ශය (භාෂා) | - එක ම ප්‍රදේශයක භාෂා දෙකක් හෝ ඊට වැඩි ගණනක් භාවිත කරන ජාතීන් සිටින විට එක් භාෂාවකට අනෙක් භාෂාවෙන් ඇති වන බලපෑම |

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- සිංහල භාෂාව නිෂ්පන්න, තද්භව හා තත්සම පදවලින් පෝෂණය වී ඇති බව පැහැදිලි කිරීම
- සිංහල භාෂාව පෝෂණය සඳහා පෙරදිග භාෂා හා අපරදිග භාෂා ද බලපා ඇති අයුරු විස්තර කිරීම
- නිෂ්පන්න, තත්සම හා තද්භව වචන නිවැරදි ව හඳුනා ගැනීම
- අනුරූප වචන සංයෝගය පිළිබඳ අවබෝධයෙන් යුතුව ලේඛනයේ යෙදීම
- වර්තමාන සිංහල භාෂාවේ ව්‍යවහාර වන නිෂ්පන්න, තත්සම, තද්භව වචන අර්ථවත් ව භාවිත කිරීම

ඇමුණුම 1

### පැවරුම

- පහත සඳහන් වචන නිෂ්පන්න, තත්සම සහ තද්භව වචන අනුව වගුගත කර දක්වන්න.

  දහම්, ප්‍රබල, ධෛර්ය, බඩ, නිපැයුම්, බඩවැටිය, කන්ද, සිරුර, කාර්යක්ෂම, ලන්ද, ඔළුව, අනුරපුර, විශේෂ, වියත්, කොළඹ, අඳුර, ඖෂධ, පුණ්‍ය, පියා, කකුල, දළ, සයුර, මාර්ග, පුස්තකය

ඇමුණුම 2

| අනුරූප නොවන යෙදුම් | අනුරූප යෙදුම් | |
|---|---|---|
| දහම් දේශනාව | දහම් දෙසුම | ධර්ම දේශනාව |
| පෙර විභත | පෙර විබත් | ප්‍රථමා විභක්තිය |
| සංස්කෘත බස | සකු බස | සංස්කෘත භාෂාව |
| වියරණ විධි | වියරණ විදි | ව්‍යාකරණ විධි |
| බුදු චීවර | බුදු සිවුර | බුද්ධ චීවර |

# 31

# සිංහල සාහිත්‍ය ඉතිහාසය

**නිපුණතාව** : 11.0 සාහිත්‍ය පරිශීලනයට අදාළ ක්‍රමවේද ගවේෂණය කරයි.

**නිපුණතා මට්ටම** : 11.2 සිංහල සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ දැනුම පුළුල් කර ගනිමින් සාහිත්‍ය රස වින්දනයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 2යි.

**ඉගෙනුම් පල** :

- සිංහල සාහිත්‍ය අවධි පිළිවෙළින් නම් කරයි.
- පැරණි සාහිත්‍ය අවධිවල නිර්මාණකරණයේ යෙදුණු සාහිත්‍යකරුවන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- එම සාහිත්‍ය අවධිවල රචිත සාහිත්‍ය නිර්මාණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- එම අවධිවල ග්‍රන්ථකරණයේ නියැළුණු ග්‍රන්ථ කර්තෘවරුන් නම් කරයි.
- එක් එක් සාහිත්‍ය අවධිවල සුවිශේෂ ලක්ෂණ පැහැදිලි කරයි.

### පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස්

පෙර සූදානම

- අනුරාධපුර අවධියේ සිට මහනුවර අවධිය තෙක් පැවති රාජධානි හා එම රාජධානි පැවති කාල සීමා දැක්වෙන පෝස්ටරයක් ප්‍රදර්ශනය කිරීම සඳහා සූදානම් කර ගන්න.
- සාහිත්‍ය අවධි කීපයකට අයත් සාහිත්‍ය ග්‍රන්ථ කිහිපයක් රැස් කර ගන්න. (අමාවතුර, බුත්සරණ, පූජාවලිය, සද්ධර්මරත්නාවලිය, පන්සිය පනස් ජාතක පොත)

ප්‍රවේශය

- සාහිත්‍ය අවධි දැක්වෙන පෝස්ටරය පන්තියේ ප්‍රදර්ශනය කරන්න. එම පෝස්ටරයෙහි අන්තර්ගත තොරතුරු කෙරෙහි අවධානය යොමු කරමින් ඒ පිළිබඳව සාකච්ඡාවක් කරන්න. එහි දී පහත සඳහන් කරුණුවලට ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරවන්න.
  * පෝස්ටරයෙහි දක්වා ඇති කාලවකවානුවලින් ලංකාවේ පැවති රාජධානි යුග හා සාහිත්‍ය අවධි පිළිබඳ කරුණු ඉදිරිපත් වන බව පෙන්වා දෙන්න

**පාඩම සංවර්ධනය**

පියවර 1

- මහින්දාගමනයත් සමග ලක්දිවෙහි ඇති වූ, ආගමික, සංස්කෘතික, සාමාජික හා ආධ්‍යාපනික ප්‍රබෝධයත් සමග අක්ෂර කලාව සංවර්ධනය වීම නිසා ලේඛන කලාව වර්ධනය වීමේ ප්‍රතිඵලයක් ලෙස ධර්ම ග්‍රන්ථ සම්පාදනයට ප්‍රවේශ වූ ආකාරය ඉතා සංක්ෂිප්තව පැහැදිලි කරන්න.
- අනුරාධපුර අවධියේ පැවතියේ යැ යි සැලකෙන පොත්පත් නාමිකව සඳහන් කරන්න.
- අනුරාධපුර අවධියේ රචිත දැනට විද්‍යමාන ග්‍රන්ථ ද නාමිකව හඳුන්වා දෙන්න. (සියබස්ලකර, ධම්පියා අටුවා ගැටපදය, සිඛවළඳ හා සිඛවළඳ විනිස)
- ඔබ විසින් සපයා ගනු ලැබූ පොත්පත් ප්‍රදර්ශනය කරමින් විවිධ සාහිත්‍ය අවධිවල විවිධ ක්ෂේත්‍ර යටතේ ග්‍රන්ථ සම්පාදනය වී ඇති බව පැහැදිලි කරන්න.
- පොළොන්නරු අවධියේ සිට මහනුවර අවධිය තෙක් සාහිත්‍ය අවධිවල රචිත සාහිත්‍ය නිර්මාණ හඳුන්වා දෙන්න.

පියවර 2

- ඒ ඒ සාහිත්‍ය අවධි පිළිබඳව තොරතුරු ගවේෂණයට ශිෂ්‍යයන් යොමු කරන්න.
- ඒ සඳහා පොත්පත්, සඟරා විවිධ ලිපි ලේඛන හා අන්තර්ජාලය ඇසුරු කර ගැනීමට උපදෙස් දෙන්න.
- ශිෂ්‍යයන් ගොනු කර ගත් තොරතුරු පාදක කර ගෙන පොත් පිංචක් සකස් කිරීමට යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම් ඃ**

* ප්‍රදර්ශන පුවරුව සඳහා සකස් කර ගත් පෝස්ටරය

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායක ඃ**

- සිංහල සාහිත්‍ය අවධි පිළිවෙළින් නම් කිරීම
- පැරණි සාහිත්‍ය අවධිවල නිර්මාණකරණයේ යෙදුණු සාහිත්‍යකරුවන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම
- එම සාහිත්‍ය අවධිවල රචිත සාහිත්‍ය නිර්මාණ හඳුනා ගෙන ඉදිරිපත් කිරීම
- එම අවධිවල සාහිත්‍ය නිර්මාණයේ යෙදුණු සාහිත්‍යකරුවන් හඳුනා ගෙන නම් කිරීම
- එක් එක් සාහිත්‍ය අවධිවල සුවිශේෂ ලක්ෂණ පැහැදිලි කිරීම

# 32

# චිරන්තන ගද්‍ය සංග්‍රහය

## (කුඩ්ඩරජ්ජ වස්තුව හා ධම්මසවණෝපාසිකා වස්තුව)

**නිපුණතාව** : 7.0 රසඥතා වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම්** : 7.1 සාහිත්‍ය විචාර මූලධර්ම ඇසුරෙන් පුරාතන ගද්‍ය නිර්මාණ රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 8යි.

**ඉගෙනුම් පල** :

- සද්ධර්මාලංකාරය හා කතුරවරයා පිළිබඳ තොරතුරු ප්‍රකාශ කරයි.
- සද්ධර්මාලංකාරය වැදගත් මූලාශ්‍ර ග්‍රන්ථයක් ලෙස හඳුන්වයි.
- නිර්දිෂ්ට කථා අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.
- නිර්දිෂ්ට කථාවල විශේෂ භාෂා ලක්ෂණ හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- නිර්දිෂ්ට කථා වස්තු දෙකෙහි සාහිත්‍යික අගය වටහා ගෙන රස විඳිමින් විචාරය කරයි.
- නියමිත කථා වස්තු දෙකට අදාළ දුරවබෝධ වචන ලිහිල් බසින් ලියයි.
- සද්ධර්මාලංකාරය ධර්ම ග්‍රන්ථයක්, රසවත් සාහිත්‍ය කෘතියක්, මූලාශ්‍ර ග්‍රන්ථයක් වශයෙන් අගය කරයි.
- දැහැමි දිවි පෙවෙතක් සඳහා එයින් ලැබෙන සදුපදේශ ප්‍රකාශ කරයි.

### පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස්

**පෙර සූදානම**

- නිර්දිෂ්ට කථා දෙක කියවා අවබෝධ කර ගන්න.
- දුරවබෝධ වචනවල අර්ථ පැහැදිලි කර ගන්න.
- සද්ධර්මාලංකාරය සහ ඒ සඳහා රචනා වී ඇති විචාර ග්‍රන්ථ කියවා දැනුවත් වන්න.
- ඉගෙනුම් ආධාරක සහ පැවරුම් සූදානම් කර ගන්න.

**ප්‍රවේශය**

- පහත සඳහන් ක්‍රම අතුරින් එකක් හෝ වෙනත් සුදුසු ක්‍රමයක් භාවිතයෙන් පාඩමට පිවිසෙන්න
  - සද්ධර්මාලංකාරය පිළිබඳ විචාරක අදහස් කීපයක් ඉදිරිපත් කිරීම
  - සද්ධර්මාලංකාරයෙහි කොටසක් ශ්‍රැති ගෝචර ශෛලියෙන් කියවීම
  - සද්ධර්මාලංකාරය පිළිබඳ පසුබිම විස්තර කිරීම
  - කාලීන ආර්ථික හා සමාජ පසුබිම විමසීම

## පාඩම සංවර්ධනය

**පියවර 1**

- සද්ධර්මාලංකාරය පිළිබඳ පහත සඳහන් කරුණු ඔස්සේ තොරතුරු රැස් කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
  - කතුවරයා
  - සද්ධර්මාලංකාරය රචනය සඳහා ආරාධනා කිරීම
  - රචනා වූ යුගය හා යුගයේ සාහිත්‍ය ප්‍රවණතා
  - සද්ධර්මාලංකාරයට මූලාශ්‍රය වූ කෘතිය
  - සද්ධර්මාලංකාරයේ පරමාර්ථය හා අන්තර්ගතය
  - සද්ධර්මාලංකාරයේ රචනා ශෛලිය
  - උපයුක්ත භාෂා ලක්ෂණ

**පියවර 2**

- නිර්දිෂ්ට කථා දෙක පිළිබඳ කෙටි හැඳින්වීමක් සිදු කරන්න.
- නිර්දිෂ්ට කථා කියවීමට සියලු ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- කථාවල අන්තර්ගත දුරවබෝධ වචන පිළිබඳ සාකච්ඡා කරන්න.
- කථා දෙකෙහි විශේෂ භාෂා ලක්ෂණ පිළිබඳ පැහැදිලි කරන්න.

**පියවර 3**

- නිර්දිෂ්ට කථා දෙකෙහි ප්‍රධාන අවස්ථා හා සිද්ධි පාදක කර ගනිමින් කථා සාරාංශය ගොඩ නගන්න.

**පියවර 4**

- නිර්දිෂ්ට කථා වස්තුවල
  - සර්ව කාලීන අගය
  - උපයුක්ත භාෂා ශෛලිය
  - අවස්ථා හා චරිත නිරූපණය
  - ජීවන දර්ශනය
- නිර්දිෂ්ට කථා දෙකෙහි ඓතිහාසික වැදගත්කම සාහිත්‍යික අගය පිළිබඳ අවධානය යොමු කරමින් සහ ඒ ගැන අවධාරණය කරමින් රස වින්දනයට හා විචාරයට මග පෙන්වන්න.

**පියවර 5**

- කතා දෙකට අදාළ දුරවබෝධ වචන සරලාර්ථ සහිතව ලැයිස්තු ගත කිරීමට මග පෙන්වන්න.

**පියවර 6**

- අවස්ථා සම්බන්ධය හා ඓතිහාසික තොරතුරු පිළිබඳ ප්‍රශ්න කරමින් සාකච්ඡා කරන්න.

**මූලික වදන්/සංකල්ප**

සාහිත්‍යික මූලාශ්‍රය - ඉතිහාසය හැදෑරීමේ දී තොරතුරු ලබා ගත හැකි සාහිත්‍ය කෘති

**ගුණාත්මක යෙදවුම්**

* චිරන්තන ගද්‍ය සංග්‍රහය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
* සද්ධර්මාලංකාරය - ප්‍රාචීන භාෂෝපකාර සමාගම
* ප්‍රශස්ත සිංහල ශබ්ද කෝෂයක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- සද්ධර්මාලංකාරය කෘතිය හා කතුවරයා පිළිබඳ තොරතුරු ප්‍රකාශ කිරීම
- නිර්දිෂ්ට කථාවල තේමාව සහ කථා සාරය ඉදිරිපත් කිරීම
- දුරවබෝධ වචනවල අරුත් පැහැදිලි කරමින් නිර්දිෂ්ට කථාවල කොටස් ලිහිල් බසින් ලිවීමට පැවරුම් ලබා දීම
- නිර්දිෂ්ට කථාවල සාහිත්‍යමය අගය විමසීම
- නිර්දිෂ්ට කථාවල ඓතිහාසික තොරතුරු අන්තර්ගත වී ඇති ආකාරය පැහැදිලි කිරීම
- නිර්දිෂ්ට කථා රසවිඳිමින් විචාරය කිරීම
- ධාර්මික ජීවිතයට එම කථා මගින් සැපයෙන පිටුබලය පිළිබඳ අදහස් දැක්වීම

**පරිශීලනීය ග්‍රන්ථ**

සිංහල කථා කලාවේ විකාසනය - කේ. ජයතිලක

සිංහල සාහිත්‍යයේ නැඟීම - මාර්ටින් වික්‍රමසිංහ

බණ කථා සාහිත්‍යය - මාර්ටින් වික්‍රමසිංහ

# 33

# විෂය සමගාමී ක්‍රියාකාරකම්

## (පද්‍ය නිර්මාණය)

**නිපුණතාව** : 8.0 අද්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණකරණයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම්** : 8.1 පද්‍ය රචනා නිර්මාණය කරයි.

**කාලච්ඡේද** : 1යි.

**ඉගෙනුම් පල** :

- පද්‍ය නිර්මාණ සඳහා සරල අද්දැකීම් පාදක කර ගත හැකි ආකාරය පැහැදිලි කරයි.
- අද්දැකීම් පාදක කර ගෙන රසවත් පද්‍ය නිර්මාණය කළ හැකි බව ප්‍රකාශ කරයි.
- කාව්‍ය නිර්මාණයේ දී භාෂාව නිර්මාණාත්මකව භාවිත කරයි.
- විවිධ මාතෘකා ඔස්සේ පද්‍ය නිර්මාණය කරයි.

### පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස්

පෙර සූදානම

- විවිධ අද්දැකීම් පාදක කර ගෙන රචිත පද්‍ය නිර්මාණ කීපයක් සපයා ගන්න.
- එම නිර්මාණවල භාෂා ශෛලිය, ආකෘතිය, රචනා උපක්‍රම, අලංකාර ක්‍රම ආදිය පිළිබඳ අවබෝධයක් ලබා ගන්න.
- පද්‍ය රචනය සඳහා යොදා ගත හැකි සරල මාතෘකා කීපයක් සකසා ගන්න.

ප්‍රවේශය

- සරල කවියක් ගායනා කරන්න. (ඇමුණුම 01හි ඇතුළත්).
- ඒ සඳහා යොදා ගත් තේමාව පිළිබඳ සාකච්ඡා කරන්න

### පාඩම සංවර්ධනය

පියවර 1

- හිරු, සඳු, තාරකා, ගංගා, දිය ඇලි, වන අසිරිය වැනි පාරිසරික වස්තු සරල පද්‍ය නිර්මාණ සඳහා වස්තු විෂය කර ගත හැකි බව වටහා දෙන්න.

පියවර 2

- සරල කවි පෙළක් සුදුසු ආකාරයට පන්තියේ ප්‍රදර්ශනය කරන්න
- ඒ සඳහා යොදා ගෙන ඇති.
  - කාව්‍ය ආකෘතිය
  - උපයුක්ත භාෂාව
  - අර්ථ, ශබ්ද, අලංකාර ක්‍රම සාකච්ඡා කරන්න.

පියවර 3

- ශිෂ්‍යයන් ලියූ කවි ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී ප්‍රතිපෝෂණය කර සමාලෝචනයක යෙදෙන්න.

**මූලික වදන්/සංකල්ප**

ප්‍රතිභාව - යම් වස්තුවක් අපූර්ව ආකාරයෙන් නිර්මාණය කිරීමට ඇති හැකියාව

**ගුණාත්මක යෙදවුම්**

* කවි ශික්ෂාව - කුමාරතුංග මුනිදාස

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- පද්‍ය නිර්මාණය සඳහා උචිත අද්දැකීම් ඉදිරිපත් කිරීම
- සුදුසු ආකෘති හඳුනා ගැනීමේ දක්ෂතාව ප්‍රදර්ශනය කිරීම
- පද්‍ය රචනයේ දී නිර්මාණාත්මකව භාෂාව භාවිත කිරීම
- විවිධ අද්දැකීම් ආශ්‍රයෙන් කවි නිර්මාණය කිරීම

ඇමුණුම 01

සමන් පිච්ච මල් ඉහිරුණු
නිල් තණකොළ පිට්ටනියක්
වගෙයි අහස අන්න බලනු
කොච්චර ලස්සන ද රෑට

බකමූණෝ පියාඹති
අනෙක් කුරුල්ලෝ නිදති
බෝ අතුවල එල්ලීගෙන
මාවවුලෝ කෑ ගසති

මගෙ සුරතල් අක්කාගේ
මාලේ මුතු ඇට වාගේ
මේ වැටෙන්නෙ පිණි බිංදුත්
හදමු එකක් ඒ වාගේ

**එස්. මහින්ද හිමි**

# 34

# විෂය සමගාමී ක්‍රියාකාරකම්

## (ස්වනිර්මාණ සංග්‍රහය)

**නිපුණතාව** : 8.0 අද්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණකරණයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම්** : 8.2 ස්වනිර්මාණ ආශ්‍රයෙන් නිර්මාණ සංග්‍රහයක් සකස් කරයි.

**කාලච්ඡේද** : 2යි.

**ඉගෙනුම් පල** :

- නිර්මාණාත්මක ලිපියක ලක්ෂණ ඉදිරිපත් කරයි.
- ස්වාධීන පද්‍ය නිර්මාණයක ලක්ෂණ නම් කරයි.
- පාඨක ආකර්ෂණය ඇති වන පරිදි ගද්‍ය, පද්‍ය නිර්මාණයේ යෙදෙන ආකාරය විස්තර කරයි.
- භාෂාව නිවැරදිව භාවිත කරමින් ලියයි.
- බිත්ති පුවත්පත් සහ සඟරා සඳහා කළ නිර්මාණ ස්වනිර්මාණ සංග්‍රහයක් වශයෙන් එළි දක්වයි.

### පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස්

**පෙර සූදානම**

- වාර සඟරා, විශේෂාංග ලිපි, පද්‍ය නිර්මාණ ආදි ප්‍රශස්ත සරල නිර්මාණ කීපයක් සපයා ගන්න.
- නිර්මාණ සංග්‍රහයක අවශ්‍යතාව හා වැදගත්කම පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ප්‍රවේශය**

- ස්වනිර්මාණ ඇතුළත් නිර්මාණ සංග්‍රහයක් පරිශීලනය කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දී ඒ පිළිබඳ ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.

### පාඩම සංවර්ධනය

**පියවර 1**

- තෝරා ගත් නිර්මාණ කීපයක් කියවීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 2**

- එම නිර්මාණවල තේමාව, භාෂා ශෛලිය, ආකෘතිය, ප්‍රමාණාත්මක බව පිළිබඳ ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.

පියවර 3

- ප්‍රශස්ත නිර්මාණ පරිශීලනය කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.

පියවර 4

- ඒ ඒ ශිෂ්‍යයන්ට ස්වනිර්මාණ සඳහා සුදුසු මාතෘකා ලබා දී නිර්මාණ බාර ගන්නා අවසන් දිනයක් දන්වන්න.

පියවර 5

- ශිෂ්‍යයන්ගෙන් සංස්කාරක මණ්ඩලයක් පත් කොට සුදුසු නිර්මාණ තෝරා නිර්මාණ සංග්‍රහයක් එළිදක්වන්න

**මූලික වදන්/සංකල්ප**

ස්වනිර්මාණ - තමා විසින් කරන ලද ස්වාධීන නිර්මාණ

**ගුණාත්මක යෙදවුම්**

* නුවණ සඟරාව - අධ්‍යාපන අමාත්‍යාංශය
* සම්භාෂා සඟරාව - අධ්‍යාපන අමාත්‍යාංශය
* ප්‍රබන්ධෝපදේශය - කුමාරතුංග මුනිදාස
* කවි ශික්‍ෂාව - කුමාරතුංග මුනිදාස

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- ස්වාධීන ගද්‍ය/ පද්‍ය නිර්මාණයක ලක්‍ෂණ පැහැදිලි කිරීම
- පාඨක ආකර්ෂණය දිනා ගන්නා ලෙස නිර්මාණකරණයේ යෙදිය යුතු බව ප්‍රකාශ කිරීම
- නිර්මාණකරණයේ දී භාෂාව නිවැරදි ව භාවිත කිරීම
- ස්වනිර්මාණ සංග්‍රහයක් එළිදැක්වීම

# 35

# විෂය සමගාමී ක්‍රියාකාරකම්

## (විද්‍යුත් මාධ්‍යයට සවන් දීම)

**නිපුණතාව** : 9.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ කුසලතා ඵලදායි ලෙස යොදා ගනියි.

**නිපුණතා මට්ටම්** : 9.1 විද්‍යුත් මාධ්‍යවල විකාශනය වන සාහිත්‍ය වැඩසටහන්වලට සවන් දීමේ පුරුදු භාෂා කාර්යයන් සඳහා යොදා ගනියි.

**කාලච්ඡේද** : 2යි.

**ඉගෙනුම් පල** :

- භාෂා කුසලතා වර්ධනය කර ගැනීම සඳහා උචිත වැඩසටහන් නම් කරයි.
- විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සවන් දී අදහස් ප්‍රකාශ කරයි.
- භාෂාව නිවැරදි ව භාවිත කිරීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.
- භාෂා ව්‍යවහාරයේ දී භාෂාත්මක යෙදුම් නිර්මාණශීලී ව භාවිත කරයි.

### පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස්

පෙර සූදානම

- විද්‍යුත් මාධ්‍ය මගින් විකාශය කෙරෙන ප්‍රවෘත්ති හා ශාස්ත්‍රීය වැඩසටහන් විකාශය කෙරෙන වේලාවන් පිළිබඳව අවධානය යොමු කර සතියක් තුළ එම වැඩසටහන් විකාශය වන ආකාරය අනුව කාල සටහනක් පිළියෙල කර ගන්න.
- එවැනි වැඩසටහන් කිහිපයක් පටිගත කර ගන්න.
- විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සවන් දීම සඳහා සුදුසු ස්ථානයක් පිළියෙල කර ගන්න.

### පාඩම සංවර්ධනය

පියවර 1

- විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සවන් දීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරවන්න.
- විද්‍යුත් මාධ්‍යයෙන් විකාශය වන වැඩසටහන්වලට එක් වරක් පමණක් සවන් දීමට ලැබෙන බැවින් අවධානයෙන් සවන් දීම ඉතා වැදගත් වන බව පෙන්වා දෙන්න.
- සවන් දෙන වැඩසටහන්වල වැදගත් කරුණු සටහන් කර ගැනීමට හෝ හොඳින් මතකයේ රඳවා ගැනීමත් අවශ්‍ය බව පවසන්න.
- භාෂාව ප්‍රායෝගික ලෙස භාවිත කරන විද්‍යුත් මාධ්‍ය වැඩසටහන් හඳුනා ගෙන සවන් දීමට ශිෂ්‍යයන් හුරු විය යුතු බව පෙන්වා දෙන්න.

පියවර 2

- විද්‍යුත් මාධ්‍ය වැඩසටහනකට සවන් දීමට සලස්වන්න.
- එම වැඩසටහන සඳහා යොදා ගත් භාෂාව පිළිබඳව ශිෂ්‍යයන් සමඟ සාකච්ඡා කරන්න.
- එම වැඩසටහනේ දී උපයෝගි කර ගත් භාෂාත්මක යෙදුම් හඳුනා ගෙන ඒවා භාෂාත්මක කාර්යයේ දී උචිත පරිදි යොදා ගැනීමට හුරු කරවන්න.
- ඇමුණුමෙහි ඇති ක්‍රියාකාරකමෙහි ශිෂ්‍යයන් යොදවන්න.

**ගුණාත්මක යෙදවුම්**

* ගුවන් විදුලි/ රූපවාහිනි යන්ත්‍රයක්
* සතියක් තුළ විකාශය වන විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්
* සතියක් තුළ විකාශය වන විද්‍යුත් මාධ්‍ය වැඩසටහන් ඇතුළත් කාල සටහනක්

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- භාෂා කුසලතා වර්ධනය කර ගැනීම සඳහා උචිත වැඩසටහන් නම් කිරීම
- විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සවන් දී අදහස් ප්‍රකාශ කිරීම
- භාෂාව නිවැරදි ව භාවිත කිරීමේ කුසලතාව ප්‍රදර්ශනය කිරීම
- ව්‍යවහාරයේ දී භාෂා යෙදුම් නිර්මාණාත්මකව භාවිත කිරීම

# 36

# විෂය සමගාමී ක්‍රියාකාරකම්

## (දේශනවලට සවන් දීම)

**නිපුණතාව** : 9.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ කුසලතා ඵලදායි ලෙස යොදා ගනියි.

**නිපුණතා මට්ටම්** : 9.2 දේශන හා සාකච්ඡාවලට සවන් දීමේ පුරුද්ද මගින් විචාරශීලී ව භාෂාව හැසිරවීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද** : 2යි.

**ඉගෙනුම් පල** :

- දේශන හා සාකච්ඡාවලට සවන් දීමේ වැදගත්කම ප්‍රකාශ කරයි.
- දේශන හා සාකච්ඡාවලට සක්‍රිය ව දායකත්වය දැක්වීමේ හැකියාව අගය කරයි.
- දේශන හා සාකච්ඡාවල දී විචාරශීලී ව අදහස් පළ කිරීමට හැකියාව ප්‍රදර්ශනය කරයි.
- භාෂාව නිවැරදි ව හා නිර්මාණාත්මක ව භාවිත කරයි.

### පාඩම සැලසුම් සඳහා උපදෙස්

**ප්‍රවේශය**

- දේශන හා සාකච්ඡාවලට සවන් දීමේ අවශ්‍යතාව ශිෂ්‍යයන්ට පැහැදිලි කරන්න.
- දේශන හා සාකච්ඡාවලට සහභාගි වීමෙන් තර්කානුකූල ව විචාරශීලිව අදහස් හුවමාරු කරන්න.
- සුවිශේෂ දේශකයකු මගින් පරිසර සංරක්ෂණය, රුක් රෝපණය, මත්ද්‍රව්‍ය නිවාරණය ආදි තේමාවක් යටතේ විනාඩි 20ක දේශනයක් පැවැත්වීමට සැලසුම් කරන්න.

### පාඩම සංවර්ධනය

**පියවර 1**

- දේශනයකට සවන් දිය යුතු ආකාරය ශිෂ්‍යයන්ට පැහැදිලි කරන්න. පහත සඳහන් කරුණු ඒ සඳහා යොදා ගන්න.
  - අවධානය අඛණ්ඩව පවත්වා ගැනීම
  - දේශනයට හා අසල සිටින අයට බාධා වන අයුරින් කතා බස් කිරීමෙන් වැළකී සිටීම
  - දේශනයේ අන්තර්ගත කරුණු ග්‍රහණය කර ගැනීම
  - නියමිත කාලය තුළ දේශනයට සවන් දීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
  - දේශනය අවසානයේ දී ඊට අදාළව තම ගැටලු හා අදහස් ප්‍රකාශ කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.

පියවර 2

- දේශන පිළිබඳව ශිෂ්‍යයන් සමග විවෘත සාකච්ඡාවක යෙදෙන්න.
- දේශකයා විසින් පවත්වනු ලැබූ දේශනය පිළිබඳව ශිෂ්‍යයන්ගේ අදහස් ලබා ගන්න.
- දේශකයා භාෂාව හැසිරවූ ආකාරය ශිෂ්‍යයන්ගෙන් විමසන්න.
- එම තොරතුරු ඇසුරු කර ගෙන දේශනයක දී භාෂාව විචාරශීලී ව හැසිරවිය යුතු ආකාරය පෙන්වා දෙන්න.
- එහි දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.
  - දේශනයේ තේමාව හෝ මාතෘකාව ඉදිරිපත් කිරීම
  - තේමාව/මාතෘකාව හඳුන්වා දීම
  - ආකර්ෂණීය ලෙස භාෂාව හැසිරවීම
  - ඒ සඳහා දේශකයා යොදා ගනු ලැබූ භාෂා උපක්‍රම
  - උචිත වාක්කෝෂයක් යොදා ගැනීම,නිවැරදි උච්චාරණය හා හඬ පාලනය යොදා ගැනීම
  - දේශන හා සාකච්ඡාවල දී විචාරශීලිව අදහස් ප්‍රකාශ කිරීමට හුරු විය යුතු බව පෙන්වා දීම

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- දේශන හා සාකච්ඡාවලට සවන් දීමේ වැදගත්කම ප්‍රකාශ කිරීම
- දේශන හා සාකච්ඡාවලට සක්‍රිය දායකත්වය දැක්වීමේ හැකියාව අගය කිරීම
- ආචාරශීලී ව අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව ප්‍රදර්ශනය ප්‍රකාශ කිරීම
- භාෂාව නිවැරදි ව හා නිර්මාණාත්මක ව භාවිත කිරීම

# 37

# විෂය සමගාමී ක්‍රියාකාරකම්

**(මාතෘකානුකූල කථනය)**

**නිපුණතාව** : 10.0 තම අදහස් අර්ථවත් ව හා තර්කානුකූල ව ඉදිරිපත් කිරීමට අවශ්‍ය ශක්‍යතාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම්** : 10.1 තර්කානුකූල ව හා විචාරශීලී ව කථනයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 2යි.

**ඉගෙනුම් පල** :

- පොතපත කියවා විවාදයක් සඳහා අවශ්‍ය කරුණු රැස් කරයි.
- මාතෘකානුකූල ව කථනයේ යෙදෙයි.
- විවාදයේ දී තර්කානුකූල ව කරුණු ඉදිරිපත් කරයි.
- ඉදිරිපත් කරන ලද කරුණුවලට ප්‍රතිතර්ක ඉදිරිපත් කරයි.
- සාමූහික හැඟීමෙන් යුතුව ක්‍රියාකාරකමෙහි නිරත වෙයි.
- ජය පරාජය සම සමව විඳ දරා ගත යුතු බව ප්‍රකාශ කරයි.
- ඕනෑ ම අවස්ථාවක දී තර්කානුකූල ව විචාරශීලී ව කරුණු ඉදිරිපත් කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

## පාඩම සැලසුම් සඳහා උපදෙස්

පෙර සූදානම

- මෙය විෂය සමගාමී ක්‍රියාකාරකම් යටතේ ක්‍රියාත්මක වන ක්‍රියාකාරකමකි. එම නිසා ඒ සඳහා සුදුසු වේලාවක් වෙන් කර ගන්න. විවාදයක් පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සලසා ගන්න. පහත සඳහන් මාතෘකාව වැනි මාතෘකාවක් සූදානම් කර ගන්න.

  උදා : සාමාන්‍ය ජනතාව සාහිත්‍ය රසවින්දනයට යොමු කළ හැක්කේ ජන සාහිත්‍යය මගිනි.

ප්‍රවේශය

- විවාදයක ස්වරූපය පිළිබඳව ශිෂ්‍යයන් දැනුවත් කරන්න. හැකි නම් පටිගත කරන ලද විවාදයකට සවන් දීමට/නැරඹීමට අවස්ථාව සලසන්න.

**පාඩම සංවර්ධනය**

පියවර 1

- ශිෂ්‍යයන් කණ්ඩායම් දෙකකට වෙන් කරන්න. (යෝජක පිල හා ප්‍රතියෝජක පිල වශයෙන් එක් කණ්ඩායමකට 4ක් හෝ 5ක් බැගින්)
- විවාදයේ මාතෘකාව පිළිබඳ ශිෂ්‍යයන් දැනුවත් කරන්න.
- විවාදයට අවශ්‍ය කරුණු සොයා ගැනීමට මග පෙන්වන්න.
- විවාදයක දී සලකා බැලෙන කරුණු පිළිබඳ ශිෂ්‍යයන් දැනුවත් කරන්න.
- තර්ක ඉදිරිපත් කිරීම, තර්ක බිඳ හෙළීම හා ප්‍රතිතර්ක ඉදිරිපත් කිරීම පිළිබඳ ශිෂ්‍යයන් සමග සාකච්ඡාවක නිරත වන්න.
- කරුණු සොයා ගැනීම සඳහා අවශ්‍ය කාලය ලබා දෙන්න.

පියවර 2

- කණ්ඩායම් දෙක සූදානම් වූ පසුව විවාදය පවත්වන්න.
- විවාදය පැවැත් වූ ආකාරය පිළිබඳ සමාලෝචනයක් නිරත වන්න.
- අපේක්ෂිත ප්‍රාප්ති මට්ටම් කරා ළඟා නො වූ ශිෂ්‍යයෝ සිටිත් නම් අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- පොතපත කියවා විවාදයක් සඳහා අවශ්‍ය කරුණු රැස් කිරීම
- මාතෘකානුකූල ව කථනයේ යෙදීම
- විවාදයේ දී තර්කානුකූල ව කරුණු ඉදිරිපත් කිරීම
- ඉදිරිපත් කරන ලද කරුණුවලට ප්‍රතිතර්ක ඉදිරිපත් කිරීම
- සාමූහික හැඟීමෙන් යුතුව ක්‍රියාකාරකමෙහි නිරත වීම
- ජය පරාජය සම සමව විඳ දරා ගැනීම
- ඕනෑ ම අවස්ථාවක දී තර්කානුකූල ව විචාරශීලී ව කරුණු ඉදිරිපත් කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කිරීම

# 38

# විෂය සමගාමී ක්‍රියාකාරකම්

## (විස්තර ප්‍රචාරය)

**නිපුණතාව** : 11.0 තම අදහස් අර්ථවත්ව හා තර්කානුකූලව ඉදිරිපත් කිරීමට අවශ්‍ය ශක්‍යතාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම්** : 11.2 නිවැරදි ව බස හසුරුවමින් ආකර්ෂණීය ලෙස නිවේදනයේ හා විස්තර ප්‍රචාරයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 2යි.

**ඉගෙනුම් පල** :

- නිවේදන හා විස්තර ප්‍රචාර සිදු කරන අවස්ථා විස්තර කරයි.
- නිවේදන ඉදිරිපත් කිරීමේ දී භාෂාව හසුරුවන ආකාරය විස්තර කරයි.
- විස්තර ප්‍රචාරවල දී අනුගමනය කළ යුතු භාෂා ශෛලිය ප්‍රකාශ කරයි.
- දෙනු ලබන අවස්ථා නිවේදන ලෙස ඉදිරිපත් කරයි.
- දෙන ලද අවස්ථාවට ගැළපෙන පරිදි විස්තර ප්‍රචාරයක් ඉදිරිපත් කරයි.

### පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස්

**පෙර සූදානම**

- මෙය නිවේදන හා විස්තර ප්‍රචාර ඉදිරිපත් කිරීමේ විෂය සමගාමී ක්‍රියාකාරකමකි. එබැවින් ප්‍රවීණ විස්තර ප්‍රචාරකයන්ගේ පටිගත කරන ලද විස්තර ප්‍රචාර කිහිපයක් සපයා ගත හැකි නම් වඩාත් සුදුසු ය.

**ප්‍රවේශය**

- දුම්රිය ස්ථානයක නිවේදනයක් ඉදිරිපත් කරන්න.

  උදා: තුන්වන වේදිකාවට පැමිණෙන ශීඝ්‍රගාමී දුම්රිය රාත්‍රී 10.23ට පොල්ගහවෙල බලා පිටත් වේ. එම දුම්රිය නවත්වන්නේ මරදාන, දෙමටගොඩ, ගම්පහ. ගම්පහ සිට පොල්ගහවෙල දක්වා සෑම දුම්රිය ස්ථානයක ම නවත්වනවා ඇත.

### පාඩම සංවර්ධනය

**පියවර 1**

- ඉහත නිවේදනය ආශයෙන් නිවේදනයක ස්වභාවය හා ලක්ෂණ පිළිබඳ සාකච්ඡාවක නිරත වන්න.
  - කෙටි බව
  - නිවැරදි ව භාෂාව භාවිත කළ යුතු බව
  - විරාම සහිතව ඉදිරිපත් කළ යුතු බව
  - සාවධාන ව සවන් දිය යුතු බව ආදි කරුණු

- එදිනෙදා භාවිත වන නිවේදන අවස්ථා කිහිපයක් ශිෂ්‍යයන්ට ලබා දෙන්න.
  - පිරිවෙණෙහි සාහිත්‍ය සමිතිය පැවැත්වෙන බවට කරන නිවේදනයක්
  - නාය යෑම් අනතුරු පිළිබඳව ප්‍රදේශීය ලේකම් කාර්යාලය මගින් කරනු ලබන නිවේදනයක්
  - ඩෙංගු මදුරුවන් බෝ වන ස්ථාන පිරිසිදු කරන ලෙස ප්‍රජා සෞඛ්‍ය සේවය මගින් කරනු ලබන නිවේදනයක් ආදි
- එම නිවේදන අවස්ථා ශිෂ්‍යයන්ට තෝරා ගැනීමට අවස්ථාව දෙන්න.
- තෝරා ගත් නිවේදන අවස්ථා පන්තිය ඉදිරියේ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

පියවර 2

- ප්‍රවීණයෙකුගේ විස්තර ප්‍රචාරයකට සවන් දීමට අවස්ථාව සලසන්න.
- එම විස්තර ප්‍රචාරය ආශ්‍රයෙන් විස්තර ප්‍රචාරයක ස්වභාවය ශිෂ්‍යයන්ට පැහැදිලි කරන්න.
  - භාවිත කරන භාෂා ශෛලිය
  - අදාළ තැන්වල විරාම සහිත ව ඉදිරිපත් කිරීම
  - අවස්ථානුකූල ව යෝග්‍ය වචන භාවිතය
  - වචන නිවැරදි ව උච්චාරණය කිරීම
- විස්තර ප්‍රචාර අවස්ථා කිහිපයක් ශිෂ්‍යයන් වෙත ලබා දෙන්න.

  උදා: - ක්‍රීඩා උත්සවයක්
  - අලුත් අවුරුදු උත්සවයක්
  - පන්සලේ පැවැත්වෙන උත්සව අවස්ථාවක් ආදි
- එම අවස්ථාවලින් එක් අවස්ථාවක් තෝරා ගෙන විස්තර ප්‍රචාර ඉදිරිපත් කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- නිවේදන හා විස්තර ප්‍රචාර සිදු කරන අවස්ථා විස්තර කිරීම
- නිවේදන ඉදිරිපත් කිරීමේ දී භාෂාව හසුරුවන ආකාරය විස්තර කිරීම
- විස්තර ප්‍රචාරවල දී අනුගමනය කළ යුතු භාෂා ශෛලිය ඉදිරිපත් කිරීම
- දෙනු ලබන අවස්ථාවක නිවේදනයක් ඉදිරිපත් කිරීම
- දෙන ලද අවස්ථාවට ගැළපෙන පරිදි විස්තර ප්‍රචාරයක් ඉදිරිපත් කිරීම